# සංවර්ධනය උදෙසා බල ගැන්වීම

වාර්ෂික වාර්තාව 2018

**ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව**



# සංවර්ධනය උදෙසා බල ගැන්වීම

ගෙවී යන වසරක් පාසා ජාතික බලශක්ති අවශ්‍යතාවන් නිරන්තරයෙන් ඉහළ යාම ඉතා පැහැදිලි තත්ත්වයකි. සංවර්ධන ක්‍රියාවලිය සඳහාත් රට තුළ තත්ත්වයෙන් ඉහළ ජීවන රටාවක් ඇති කිරීම සඳහාත් බලශක්තිය විවිධ අත්‍යවශ්‍ය ක්‍රියාදාමයන් රැසක නියැලී සිටී. පුනර්ජනනීය බලශක්තීන් කෙරේ ලෝක අවධානය වර්ධනය වන තත්ත්වයකදී ඛණිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන රටේ බලශක්ති න්‍යායන් තුළ විශාල කාර්ය භාරයක් ඉටු කරනු ලබයි. බලශක්ති ක්ෂේත්‍රයේ ප්‍රධාන වශයෙන් ප්‍රවාහන සහ විදුලි බල ක්ෂේත්‍රයන් සඳහාත් ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව බලශක්ති අවශ්‍යතා වලින් වැඩි ප්‍රමාණයක සේවා ලබාදීම තුළින් වෙළඳපල තුළ ප්‍රමුඛයා වන කාරණය සනාථ වේ.

පසුගිය වසරට සාපේක්ෂව තෙල් සහ ගෑස් කර්මාන්තයන් වෙත ලෝකයේ නන් දෙසින් සුභවාදී ප්‍රතිචාරයන් ලැබේ. සමස්තයක් ලෙස ඉන්ධන මිල ස්ථාවරත්වයක් ලබා ඇති අතර බලශක්ති ක්ෂේත්‍රය වසර ගණනාවක් තුළ සිරවී සිටි අඩු මිල ගණන්, මූල්‍ය විනය පවත්වා ගැනීම, තනතුරු පිළිබඳ ගැටළු මෙන්ම නිෂ්පාදන කාර්යශූරත්වය පිළිබඳ ගැටළු ද විසඳා ගනිමින් සිටී. මේ සියල්ලටම වඩා ඉදිරි වසර කීපයේදී වේගයෙන් වර්ධනය වන ඉල්ලුම සහ ක්ෂේත්‍රය පටුවීම යන කරුණු මත පදනම්ව සැපයීම අඩුවිය හැකි බවටද විවිධ මත ප්‍රකාශයට පත්ව ඇත.

ශ්‍රී ලංකාව තුළ 2018 වසරේ අවසානයේ දේශපාලනික වශයෙන් පැවති සැකමුසු භාවය නිසා ආර්ථිකමය විචල්‍ය තත්ත්වයකට පත් වූ අතර සාධනීය ලෙස භාවිත කළ හැකි ස්වභාවික ඛණිජ තෙල් සම්පත් හිඟකමද ඊට හේතු විය. ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව ආර්ථිකමය වශයෙන් දරුණු පීඩනයකට ලක්ව සිටියද ජනතාව වෙත ඛනිජ තෙල් සැපයීමේ අභියෝගය බාරගෙන තිබුණි. සුළු මිල වැඩිවීමකදී වුවත් සාමාන්‍ය ජන ජීවිතයට සහ ජීවන ක්‍රමයන්ට එමගින් ඇති වන බලපෑම විවිධාකාර සහ සෘණාත්මක වුව ද එවැනි ඕනෑම තත්ත්වයකදී ඉන්ධන සැපයීම නොපිරිහෙලා ඉටුකිරීමේ වගකීම දරන්නට සිදු විය.

ඉතාම ආකර්ෂණීය සිතුවමක් ලෙස සංස්ථාවේ ක්‍රියාකාරීත්වය දක්වනු ලැබීමට ඇති හැකියාව ඉහත කරුණු මගින් නිරන්තරයෙන් වළක්වාලයි. කෙසේ වෙතත් සංස්ථාවේ දැක්ම, මෙහෙවර හා ප්‍රකාශිත අරමුණු වල පිහිටමින් ජාතික අවශ්‍යතාවන් සපුරා ගැනීම වෙනුවෙන් මෙහිදී කටයුතු කර ඇති අතර සංස්ථාවේ ලාභාංශ අවම වීම වළක්වාලීම සඳහා නිසි කාර්යක්ෂමතාව පවත්වා ගනිමින් සහ අත්‍යවශ්‍ය ක්‍රියා මාර්ග ගනිමින් කටයුතු කර ඇත.

තත්ත්වය එසේ වුවද සංස්ථාව රටේ සමස්ත ජනතාවගේ යහපත් ජීවන රටාවක් උදෙසාත් සංවර්ධනයේ සහ තිරසාරභාවයේ අරමුණු ඉටු කර ගැනීම සඳහාත් නිරන්තර දායකත්වයක් ලබාදෙයි.

# අන්තර්ගතය


| | |
|---|---|
| දැක්ම, මෙහෙවර, අරමුණ | 5 |
| ගමන් මග | 6 |
| අපගේ ප්‍රවේශය | 8 |
| ආයතනික තොරතුරු | 11 |
| මූල්‍ය සුවිශේෂතා | 12 |
| මෙහෙයුම් සුවිශේෂතා | 14 |
| සභාපතිතුමාගේ පණිවුඩය | 18 |
| කළමණාකාර අධ්‍යක්ෂතුමාගේ සමාලෝචනය | 22 |
| අපගේ නායකත්වය | 26 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 28 |
| ආයතනික කළමනාකරණ කණ්ඩායම | 31 |
| ඉහළ කළමනාකරණ කණ්ඩායම | 34 |
| ආයතනික ව්‍යුහය | 36 |
| අපගේ ව්‍යාපාරය | 38 |
| කළමණාකරණ විමසුම | 42 |
| අප අගය එකතු කරන්නේ කෙසේද | 54 |
| අවදානම් කළමනාකරණ වාර්තාව | 72 |
| සංස්ථාපිත පරිපාලනය | 78 |
| විගණන කමිටු වාර්තාව | 84 |
| අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව | 88 |
| මූල්‍ය ප්‍රකාශන | 93 |
| අපගේ ස්ථාන | 150 |
| දස වසරක් සැකෙවින් | 152 |

# දැක්ම

ඛණිජ තෙල් ක්ෂේත්‍රය හා අදාළ කර්මාන්ත සඳහා තිරසාර භාවයක් ලබාදීම මෙන්ම නව අවස්ථාවන් මගින් සේවාදායකයින්ට නිරන්තර වටිනාකම් සැපයීම.

# මෙහෙවර

තරගකාරීත්වය  - ඛණිජ තෙල් සහ ඒ හා බැඳුණු නිෂ්පාදන තරඟකාරී මිල ගණන් යටතේ ලබාදෙමින් වෙළඳපොළ ප්‍රමුඛයා ලෙස කටුයතු කිරීමට ප්‍රයත්න දැරීම.

තිරසාරබව - ආර්ථිකමය සමාජමය සහ පාරිසරික වශයෙන් තිරසාර ව්‍යාපාරයක් ලෙස දීර්ඝකාලීන අනාගත ප්‍රතිලාභ උදා කරදීම .

නිරන්තර වර්ධනය - මානව සම්පත සහ ක්‍රියාදාමයන්හි සංවර්ධනය මත සංස්ථාවේ වර්ධනය තහවුරු කිරීම මෙන්ම අදාළ සියලු අංශයන්හි වර්ධනයන් ගැන සුපරික්ෂාකාරී වීම.

අවංක බව - සංස්ථාවේ යහපත සහතික කරනු සඳහා සියලු අවස්ථාවන්හිදී විශ්වාසදායී ලෙස කටයුතු කිරීම.

පොදු යහපත - රටේ සංවර්ධනය වෙනුවෙන් සහයෝගය ලබාදීමේ ඉලක්ක සපුරා ගැනීම.

# ඉලක්ක

- වෙළඳපොළ කොටස ඉහළ නංවනු සඳහා ඉතා ඉහළ මෙහෙයුම් කාර්යක්‍ෂමතාවක් ලබාදීම.
- යටිතල සංවර්ධනයන් හා නිරතුරුවම නව තාක්ෂණික ක්‍රියාවලීන් භාවිතයට ගැනීම.
- ක්‍රියාවලීන්හි ආරක්ෂාව ස්ථිර කිරීම මෙන්ම පුද්ගලික ආරක්ෂාව හා පාරිසරික වගකීම් කෙරෙහි සැළකිලිමත්භාවය.
- පර්යේෂණ හා නවෝත්පාදන මගින් නිෂ්පාදන විශිෂ්ටත්වය.
- දිගුකාලීන වශයෙන් ආර්ථික ස්ථාවරභාවය තහවුරු කිරීම.
- ආයතන පරිශ්‍රය තුළ සුබවාදී පරිසරයක් නිරන්තරයෙන් පවත්වා ගැනීම
- මහජන කැමැත්ත ඉටු කිරීමට බැඳී සිටින සමාජයක් ඇති කිරීම.

# අපගේ ගමන්මග

**1961**
වසරේදී රජයට අයත් ආයතනයක් ලෙස 1961 අංක 28 දරණ පනත යටතේ සංස්ථාව පිහිටුවන ලදි.

**1964**
වනවිට සංස්ථාව ලංකාව තුළ ක්‍රියාකාරී ව ඛණිජ තෙල් ආනයනය කිරීම, බෙදාහැරීම, විකිණීම සිදුකරන එකම ආයතනය බවට පත් විය.

**1969**
වසරේදී සංස්ථාව පිරිපහදු කටයුතු ආරම්භ කරන අතර කොළොන්නාවේ ලිහිසි තෙල් කර්මාන්ත ශාලාවක් ද අරඹයි, එසේම කෘෂි රසායන ද්‍රව්‍ය ක්ෂේත්‍රයටද ව්‍යාපාර පුළුල් කරයි.

**1978**
වසරේදී සංස්ථාව ඇඳුම්, ටයර් හා වෙනත් අවශ්‍යතාවන් සඳහා නයිලෝන් නිෂ්පාදනය ආරම්භ කරන ලදි.

**1987**
වසරේදී SPBM මධ්‍යස්ථානය කොළඹ වරායේ සිට කිලෝ මීටර් 9.2ක් දුරින් පිහිටවනු ලැබූ අතර ඔරුගොඩවත්තේ බොර තෙල් ගබඩා ටැංකි පද්ධතිය ආරම්භ කරන ලදි.

**1994**
වසරේදී ලිහිසි තෙල් හා සොල්වන්ට්ස් ආනයනය ලිහිල් කිරීම.




**1962**
වසරේදී සංස්ථාව එවකට ලංකාව තුළ ක්‍රියාත්මක සමාගම් සමග තරගයට පිවිසෙමින් තම ව්‍යාපාර කටයුතු අරඹයි.

**1968**
වසරේදී සංස්ථාව දිනකට බැරල් 38,000 ක් පිරිපහදු කළ හැකි කර්මාන්ත ශාලාවක් සාදා නිමකරයි.

**1971**
වසරේදී සංස්ථා පනතට සංශෝධන ගෙන එමින් නැව් හා ගුවන් යානා සඳහා ඉන්ධන ලබාදෙයි.

**1979**
වසරේදී දිනකට 38,000 ක් වූ පිරිපහදු බැරල් ප්‍රමාණය 50,000ක් දක්වා වැඩි කෙරිණි.

**1992**
වසරේදී සංස්ථාව තෙල් පිරිපහදු ක්‍රියාවලිය පහසු හා කර්යක්ෂම කරමින් බොරතෙල් ගබඩා ස්ථානය ප්‍රතිසංවිධානය කරන ලදි.

**1995**
වසරේදී ත්‍රස්තවාදී ප්‍රහාරයන්ට ලක් වූ කොළොන්නාව සහ ඔරුගොඩවත්ත තෙල් ගබඩා පරිශ්‍රය ප්‍රතිසංස්කරණය කරන ලදි.

**1999**
වසරේදී ගින්නට හසුවීමෙන් විනාශයට ලක් වූ තෙල් ගබඩාව ප්‍රතිසංස්කරණයට ලක් කරන ලද අතර සපුගස්කන්දේ අළුතින් තෙල් සැපයීමේ අංගනයක් ද ඉදිකරන ලදි. එසේම ඊයම් රහිත පෙට්‍රල් නිෂ්පාදනය සඳහා වන ධාරිතාව ඉහළ දමයි.

**2003**
වසරේදී සංස්ථාවේ ගබඩා හා බෙදාහැරීම කටයුතු අලුතින් පිහිටවනු ලැබූ CPSTL ආයතනය වෙත බාර කරන ලදි. එය සංස්ථාව, ශ්‍රී ලංකා ආණ්ඩුව සහ ලංකා ඉන්දියානු තෙල් සමාගමෙහි සමාන අයිතීන් මත පිහිටුවා ගන්නා ලද්දකි. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව නවීනතම තාක්ෂණය මුසු කරමින් ගුවන් යානා වලට තෙල් සැපයීමේ පහසුකම් සපයන්නකු ලෙස අන්තර්ජාතික ගුවන් තොටුපොලේ ක්‍රියාකිරීම ආරම්භ කරයි.

**2011**
වසරේදී සංස්ථාව කොළඹ 09 නව ප්‍රධාන මූලස්ථානයක් ආරම්භ කරන අතර හම්බන්තොට මත්තල අන්තර්ජාතික ගුවන් තොටුපළ පරිශ්‍රයේ ගුවන් යානා සඳහා ඉන්ධන සැපයීමේ පළමු අදියර ආරම්භ කරයි.

**2013**
වසරේ දී ඔක්ටේන් 90 පෙට්‍රල් ඔක්ටේන් 92 දක්වා වැඩිදියුණු කර තිබේ.

**2016**
වසරේදී ලිහිසි තෙල් නිශ්පාදන ආයතනයක් වන හයිරැක්ස් ආයතනය සමග ගිවිසුකමට එළැඹිනි. වර්ශයක් සඳහා වන වැඩිම ලාභය වාර්ථා කිරීම




**2002**
වසරේදී ඔටෝ ඩීසල්හි අඩංගු වන සල්ෆර් ප්‍රමාණය අවමකිරීම සඳහා පහසුකම් කඩිනම් කරන ලදි.

**2010**
වසරේදී කැබිනට් තීන්දුවක් මත ලංකාව පුරා ඇති පිරවුම් හල් වලින් 107ක් සහ CPSTL ආයතනයේ කොටස් වලින් තුනෙන් එකක් සංස්ථාව වෙත පවරා දෙන ලදි. මේ වකවානුව තුළම සංස්ථාව සුපර් ඩීසල් අලෙවිය ආරම්භ කළේය.

**2012**
වසරේදී කොළඹ වරායේ සබ්මැරීන බොරතෙල් නලය නැවත සවිකරන ලද අතර එය කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය යටතේ සිදු කරන ලදි. එමෙන්ම එම වසරේදීම හම්බන්තොට ගුවන් තොටුපළ මගින් ගුවන් යානා වලට ඉන්ධන සැපයීම් ව්‍යාපෘතියේ දෙවන අදියර අරඹන ලදි.

**2014**
වසරේදී ගුවන්යානා සඳහා තෙල් සැපයීමේ අංගනය හම්බන්තොට මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපොළේදී ආරම්භ කරන ලදී. ගුවන්තෙල් සැපයීම සඳහා වන තත්ව සහතිකය ලබාගැනීම.

**2018**
වසරේදී ගුවන් යානා සඳහා ඉන්ධන සැපයීමේ අංගනය පහසුකම් නවීකරණ කටයුතු බන්ඩාරණායක ගුවන්තොටුපළේ ආරම්භ කිරීම. සංස්ථාව ලංකා සුපර් ඩීසල් යූරෝ 4 පෙට්‍රල් යූරෝ 4 වර්ගවල ඉන්ධන අලෙවිය ආරම්භ කිරීම. ඉහළම ආදායම ලද වර්ශය ලෙස වාර්ථා වීම.

# අපගේ ප්‍රවේශය

## සංවර්ධන ක්‍රියාවලියට දිරිදීම

මෙය අපගේ තෙවන ඒකාබද්ධ වාර්ෂික වාර්තාවයි. අප මෙහිදී උපාය මාර්ග, ලගාකරගැනීම්, පරිපාලනය, අවදානම් හා අගය වැඩි කිරීම් කෙරෙහි උපරිම අවධානය යොමු කරමින් විනිවිදභාවයෙන් යුත් අපගේ ක්‍රියාවලීන් වාර්තා කරමින් සාමූහික ප්‍රගතියක් කරා ගමන් කරමින් සිටින්නෙමු.

## වාර්තා කිරීමේ ක්‍රමවේදය සහ සීමාවන්

මෙම වාර්ථාව මගින් ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ 2018 වසරේ ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා කාලයේ ව්‍යාපාර ආකෘති මෙහෙයුම් ක්‍රියාවලිය ප්‍රමානාත්මක වශයෙන් අවදානම් මෙන්ම පරිපාලනය සහ පාලන ක්‍රියාවලිය තුළ පිහිටා තොරතුරු ඉදිරිපත් කෙරේ. මෙම වාර්තාවෙන් මූලිකවම අපගේ උපායමාර්ගික ව්‍යාපාර ක්‍රියාදාමයේ ජයග්‍රහණයන් ඉදිරිපත් කිරීම අදහස් කෙරේ. ඊට අමතරව අප විසින් විගණන වාර්තාව සමග වාර්ෂික මූල්‍ය ප්‍රකාශනයක් ද ප්‍රකාශයට පත් කර තිබේ. අපගේ එම වාර්තාවෙන් ප්‍රකාශයට සම්පූර්ණයෙන්ම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS/LKAS) සහ ප්‍රතිපත්ති මත පිහිටමින් එමෙන්ම යහපාලනය සඳහා වන රාජ්‍ය ආයතන උපදේශන මාලාව 1971 අංක 28 දරණ මූල්‍ය පනත, අන්තර්ජාතික ඒකාබද්ධ වාර්තා සැපයීමේ සංගමය විසින් ප්‍රකාශිත ඒකාබද්ධ වාර්තා සැපයීමේ ක්‍රමවේදය, තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) සහ ශ්‍රී ලංකාවේ වරළත් ගණකාධිකාරීන්ගේ සංගමය විසින් ප්‍රකාශිත ව්‍යාපාර සඳහා වන යහ පැවතුම් සංකල්ප ද අනුගමනය කරමින් අපගේ වාර්තාව සකසා ඇත.

## ප්‍රමානාත්මකභාවය පිළිබඳ අපගේ ප්‍රවේශය

කෙටි, මධ්‍යම හා දිගු කාලීන අගයන් නිමවීම සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතු හැකියාව සංස්ථාව සමග දැනට කටයුතු කරන පාර්ශවයන් මෙන්ම  අනාගත පාර්ශවයන්ද අත්‍යවශ්‍ය හා වැදගත් තොරතුරු මෙම වාර්තාවේ අන්තර්ගත කර තිබේ. මෙහි ඇති සියලු තොරතුරු සංස්ථාවේ අගයන් වර්ධනය කිරීම වෙනුවෙන්ම ඉදිරිපත් කර ඇති බවට අපි සහතික වන්නෙමු.

එසේම සංස්ථාව විසින් වටිනාකම් නිර්මාණය කරන අයුරු මෙන්ම ඒවා හඳුනාගන්නා ආකාරයත් අපගේ වාර්තාවේ ඇති  අපගේ ව්‍යාපාරයේ හඳුනාගැනීම (පිටු 38-39 ) මූලය හා මෙහෙයුම් සුවිශේෂතා (පිටු12-15 ) වටිනාකම් නිමවනු වස් අපගේ ක්‍රියාකාරකම් (පිටු 52-69 ) යනාදී වාර්ථා එය මනාව ඔප්පු කරයි.

වටිනාකම් නිමවීම සඳහා අප සතු හැකියාව අපගේ මෙහෙයුම් සන්දර්භය (පිටු 42-46 ) උද්ගත අවදානම් සහ අනගි අවස්ථාවන්ට අපගේ ප්‍රතිචාරයන් (පිටු 70-75) අපගේ නායකත්ව කණ්ඩායම (පිටු 24-35) පරිපාලන ව්‍යුහය (පිටු 76-81) යන ඉදිරිපත් කිරීම් වලින් පෙන්වා දී ඇත.

බාහිර පාර්ශවයන්ට වැදගත් ලෙස සැලකෙන වෙනත් තොරතුරු මූල්‍ය ප්‍රකාශනයට අමතරව පිටු අංක 148 සිට 153 දක්වා ඇතුළත් කර ඇත. එසේම අපගේ විගණන කමිටුව ඒකාබද්ධ සංරක්ෂණ සැලැස්මක් ක්‍රියාත්මක කිරීම පිළිබඳවද දැනුවත් කර ඇත. විගණන වාර්තාව මෙහි පිටු අංක 94 සිට 111 දක්වා ඉදිරිපත් කෙරේ.

2018 වර්ෂය සඳහා අපගේ ඒකාබද්ධ වාර්ෂික වාර්තාව මූල්‍යමය සහ මූල්‍යමය නොවන වැදගත් තොරතුරු වලින් සමන්විත බව මේ තොරතුරු මගින් සනාථ කෙරේ.

2018 අපගේ වාර්ෂික වාර්තාව පහත දක්වා ඇති අයුරින් නිමවා තිබේ.


පාර්ශවකරුවන්ගේ සම්බන්ධතාවය
සම්බන්ධතාවය
සංක්ෂිප්තතාවය
උපායමාර්ගික අවධානය සහ අනාගත දිශානතිය
ප්‍රමාණාත්මකතාවය
විශ්වාසනීයත්වය සහ සම්පූර්ණත්වය
අවදානම් සහ අවස්ථා
ව්‍යාපාර ආකෘතිය
පාලනය
මෙහෙයුමේ සහ ඉදිරිපත් කිරීමේ පදනම
බනිජ තෙල් නීතිගත සංස්ථාව වාර්ෂික වාර්තාව 2018
ආයතනික විශ්ලේෂණය සහ බාහිර පරිසරය
උපාය මාර්ග හා සම්පත් වෙන් කිරීම
කාර්ය සාධනය
ඉදිරි දැක්ම


Ceylon Petroleum Corporation
Aviation Function
Mattala
21
18

# ආයතනික තොරතුරු

| | |
|---|---|
| ආයතනයේ නම | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව |
| නීතිමය ස්වරූපය | 1961 වසරේ අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත යටතේ පිහිටුවන ලද පොදු සංස්ථාවකි |
| ලියාපදිංචි කාර්යාලය | 609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09. |
| දුරකථන | +94 11 5455455 |
| විදුලිපණිවුඩ | "LANKA OIL" |
| කේබල් | CEYPETCO |
| ටෙලෙක්ස් | 21235 CEYPETCO CE |
| ෆැක්ස් | +94 11 5455400 |
| ඊමේල් | cpcsec@ceypetco.gov.lk |
| වෙබ්අඩවිය | www.ceypetco.gov.lk |
| බදු ගෙවීම් අංකය | 409000053 |
| වැට් බදු ලියාපදිංචි අංකය | 409000053 - 7000 |
| මූල්‍ය වර්ෂය | ජනවාරි 01 සිට දෙසැම්බර් 31 |
| සභාපති | ජී. එස්. විතානගේ මහතා |
| කළමනාකාර අධ්‍යක්ෂ | එන්. ආර්. ආර්. ජයසේකර මහතා |
| අධ්‍යක්ෂවරු | කේ. ඒ. විමලේන්තිරරාජා මහතා<br>ආර්. එම්. විජේසිංහ මහතා<br>එම්. වයි. හුසේන් මහතා<br>ඩබ්ලිව්. ආර්. පෙරේරා මහතා<br>පී. පී. සමන් රෝහිත මහතා |
| අනුබද්ධ සමාගම | සීමාසහිත ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම, නිමාව, කොලොන්නාව |
| විගණකවරු | විගණකාධිපති |
| බැංකුකරුවන් | මහජන බැංකුව, කොමර්ෂල් බැංකුව, ලංකා බැංකුව, හැටන් නැෂනල් බැංකුව, නේෂන්ස් ට්‍රස්ට් බැංකුව |

# මූල්‍ය සුවිශේෂතා

## මූල්‍ය කාර්ය සාධනය සහ තත්වය

| | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | **2018** | 2017 යළි ප්‍රකාශිත | **2018** | 2017 යළි ප්‍රකාශිත |
| | **රු. මි** | රු. මි | **රු. මි** | රු. මි |
| ආදායම - (දළ) | **592,252.880** | 516,771.164 | **593,524.040** | 517,445.791 |
| දල ලාභය/(අලාභය) | **(3,014.887)** | 26,988.549 | **(9,086.446)** | 20,745.196 |
| මෙහෙයුම් (අලාභ) / ලාභය | **(23,135.452)** | 7,200.962 | **(22,164.516)** | 10,166.249 |
| වර්ෂය සඳහා ලාභය /(අලාභය) | **(105,050.635)** | 1,055.634 | **(105,286.734)** | 3,585.552 |
| සම්පූර්ණ විස්තීර්ණ ආදායම | **(104,769.598)** | 10,378.529 | **(104,948.951)** | 12,826.261 |
| මුළු වත්කම් | **329,271.250** | 218,701.185 | **350,884.456** | 236,380.025 |
| ශුද්ධ වත්කම් | **(281,761.489)** | (176,991.892) | **(261,996.010)** | (156,830.059) |
| ණය සහ ණය ගැනීම් | **296,240.036** | 179,907.331 | **296,240.036** | 179,907.331 |

## අනුපාත

| | **2018** | 2017 | 2016 |
|---|---|---|---|
| දළ ලාභ අනුපාතය | **-0.58%** | 6.05% | 22.84% |
| මෙහෙයුම් ලාභ අනුපාතය | **-4.44%** | 1.61% | 19.24% |
| ශුද්ධ ලාභ අනුපාතය | **-20.16%** | 0.24% | 12.53% |
| මුළු වත්කම් මත ප්‍රතිලාභ (ROTA) | **-7.03%** | 3.29% | 42.63% |
| තොග පිරිවැටුම් අනුපාතය | **9.20** | 9.49 | 9.20 |
| වත්කම් පිරිවැටුම් අනුපාතය | **1.58** | 2.04 | 2.22 |
| ජංගම අනුපාතය | **0.43** | 0.38 | 0.34 |
| ද්‍රවශීලතා අනුපාතය | **0.34** | 0.27 | 0.24 |
| පොලී ආවරණ අනුපාතය | **(1.92)** | 0.68 | 7.14 |

## ආංශික ලාභය /(අලාභය) (රු.මි)

| ප්‍රවාහනය | බලශක්ති උත්පාදනය | ගුවන් අංශය | කර්මාන්ත |
| --- | --- | --- | --- |
| (96,042) | (10,669) | 3,841 | (74) |

| ගෘහස්ථ | කෘෂි රසායන | ලිහිසි තෙල් | අපනයන |
| --- | --- | --- | --- |
| (14,619) | (19) | (68) | (1,064) |

## වෙනත් (රු.මි)

| ස්ථාවර වත්කම් සඳහා ආයෝජන | රජයට දායකත්වය | වෙනත් ආදායම් | මුදල් ආදායම් |
| --- | --- | --- | --- |
| 595 | 124,805 | 813 | 12,889 |

# මෙහෙයුම් සුවිශේෂතා

## විකුණුම් - ස්වයංක්‍රීය ඉන්ධන සහ භූමිතෙල් (ලී.මි)

| වසර | පෙට්‍රල් 95 | පෙට්‍රල් 92 | ඔටෝ ඩීසල් | සුපර් ඩීසල් | භූමිතෙල් |
|---|---|---|---|---|---|
| **2018** | **203.08** | **1,337.38** | **2,120.15** | **97.91** | **259.16** |
| 2017 | 178.55 | 1,210.23 | 2,269.11 | 88.42 | 198.09 |
| 2016 | 144.86 | 1,123.33 | 2,216.64 | 74.68 | 167.41 |
| 2015 | 107.31 | 993.75 | 1,866.54 | 55.42 | 155.63 |
| 2014 | 71.65 | 831.36 | 2,077.16 | 36.62 | 138.51 |
| 2013 | 56.07 | 785.21 | 1,842.74 | 29.41 | 142.32 |

## පිරිපහදු මෙහෙයුම්

| | බොරතෙල් යෙදවුම් (මෙ. ටො.) | වසර සඳහා වැඩකළ දින | දිනකට ටොන් ගණන |
|---|---|---|---|
| **2018** | **1,675,245** | **327** | **5141** |
| 2017 | 1,646,041 | 351 | 4510 |
| 2016 | 1,746,180 | 362 | 4771 |
| 2015 | 1,692,074 | 324 | 4636 |
| 2014 | 1,760,170 | 334 | 4822 |

## අංශික කාර්ය සාධනය (ලී.මි)

| ප්‍රවාහනය | බලශක්ති උත්පාදනය | ගුවන් අංශය | කර්මාන්ත |
|---|---|---|---|
| 3,552.06 | 866.32 | 630.72 | 147.73 |

| ගෘහස්ථ | කෘෂි රසායන | ලිහිසි තෙල් | අපනයන |
|---|---|---|---|
| 281.28 | 0.13 | 7.60 | 126.44 |

## වෙනත්

| මුළු සේවක සංඛ්‍යාව | පිරවුම්හල් ගණන | සපුගස්කන්ද පර්යන්තය විසින් හසුරුවන ලද ප්‍රමාණය (ලී.මි) | සමුච්චිත සේවා පළපුරුද්ද (අවුරුදු) |
|---|---|---|---|
| 2,770 | 1,278 | 489.34 | 39,200 |





# සභාපතිතුමාගේ පණිවුඩය

# සභාපතිතුමාගේ පණිවුඩය

අඩු මිල, අකාර්යක්ෂමතාව, නියාමන අවහිරතා මෙන්ම තොරතුරු ප්‍රතිව්‍යුහගත කිරීම මත වසර ගණනාවක් ගැටළුකාරී තත්ත්වයකට මැදිවී සිටි ලෝක ඛණිජතෙල් සහ ගෑස් කර්මාන්තය ශුභවාදී අනාගතයක් පෙන්නුම් කිරීමට පටන් ගෙන තිබේ. වසර පුරා බොරතෙල් බැරලයක සමාන්‍ය මිල ඩොලර් 70 මට්ටමේ ස්ථාවර වෙමින් ඉන්ධන මිල ස්ථාවර තත්වයට පැමිණ තිබේ.

එසේ වුවද වසර කිහිපයකින් තෙල් සැපයීමේ ගැටළුවක් ඇතිවිය හැකි යැයි යන අදහසක්ද පවතී. අන්තර්ජාතික බලශක්ති අධිකාරිය මෙන්ම ඇතැම් දැවැන්ත ව්‍යාපාරයන්හි ප්‍රධානීන් විසින්ද අනතුරු ඇඟවා ඇත්තේ ඉන්ධන සඳහා ඇති වර්ධනය වන ඉල්ලුම මෙන්ම අත්‍යවශ්‍ය විශාල ව්‍යාපෘතිවල ආයෝජනය දිනෙන් දින කල් දැමීමේ ප්‍රතිඵලයක් ලෙස ඉන්ධන සැපයීම මද වශයෙන් අඩුවීමේ අනතුරක් උද්ගතව ඇති බවයි.

## ගෝලීය පරිසරය

මෙම ගෝලීය වර්ධනයන්හි සෘජු බලපෑමක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව කෙරෙහි මෙන්ම රට කෙරෙහි ඇති බව පැහැදිලි කරුණකි. ඉන්ධන මිලෙහි ඉහළ යාමක් සිදු වුවද එහි වැඩි බර සංස්ථාව විසින් දරා ගැනීමට සිදු වූයේ ගෝලීය වශයෙන් සිදුවන මිල විචලනයන්ට නිරතුරුව මුහුණ දීමට සිදුවීම මතයි.ඉහළ යමින් ඇති ඉල්ලුම මෙන්ම මුදලේ අගය ක්ෂය වීමද ඊට හේතුවකි. මේ තත්ත්වය තුළ අවදානමත් ලාභ කෙරෙහි බලපෑමත් සංස්ථාවට එල්ල විය.

බලශක්ති ඉල්ලුමේ වර්ධනය පසුගිය කාලය පුරාම දක්නට ලැබුණු අතර එය ආසියානු කලාපයේ ව්‍යාප්ත ආර්ථිකයන් තුළ විශේෂයෙන් දක්නට ලැබුණි. මේ අතර පිරිපහදු පුනර්ජනනීය බලශක්තිය පිළිබඳ උනන්දුවක් ඇති වූ අතර එම තත්ත්වය දියුනු රටවල් තුළද දක්නට ලැබුණි. ශ්‍රී ලංකාව තවමත් ඉන්ධන නිෂ්පාදකයෙකු නොවූවද තිරසර සංවර්ධන ක්‍රියාවලියේ ප්‍රකාශිත අරමුණු තුළ ප්‍රතිපත්තිමය පරමාර්ථයන් ඇති බව තොරතුරු පෙන්වයි.ඒ අනුව මෙම බලාපොරොත්තු තැබිය හැකි වෙනස මගින් පොසිල ඉන්ධන ලංකාවේ බලශක්ති ප්‍රභවය තුළ ඉතාම වැදගත් අංගය ලෙස පවතින බවට සැක නැත.

එසේම සංස්ථාව සමස්ත ඉන්ධන අවශ්‍යතාව සපුරනු සඳහා උසස් ප්‍රමිතියෙන් යුත් නිෂ්පාදන දැරිය හැකි මිලට පාරිභෝගිකයාට ලබාදෙමින් ඉදිරියටත් කටයුතු කිරීමට වගබලා ගනු ඇත. ඒ තත්වය සහනාධාර ලබාදෙමින් රජය විසින් විසඳනු ලබන අතර ගෝලීය මිල විචලනයන් දුර්වල සහ නිරන්තරයෙන් ඉහළ යන විනිමය අනුපාතයන් මේ තතත්වයට බලපාන හේතු සාධකයන්ය.

## දේශිය සන්දර්භය

මහ බැංකු වාර්තා වලට අනුව 2017 වසරේ 3.4% ක් වූ ආර්ථික වර්ධනය 2018 වසරේදී 3.2% ක ඉතා මද වර්ධනයක් සහිත බවක් පෙන්නුම් කරයි.

විශේෂයෙන්ම 2018 වසරේ අවසාන කාර්තුවේ පමණක් වර්ධනය පහත වැටීමක් පෙන්නුම් කරන අතර රටේ පැවති දේශපාලන තත්වය ඊට හේතු විය. එසේම එම කාලය තුළ ශ්‍රී ලංකා රුපියල ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව 16.4% ක පහත වැටීමක් පෙන්නුම් කළ අතර ලොව පුරාම ඩොලරයේ අගය ශක්තිමත් වනු දක්නට ලැබිණ. තවද ඒ හරහා රජයේ සුරැකුම්පත් වෙලඳපළ තැම්පතු පිටතට ගලාගිය අතරම විදේශ විනිමය ලැබීමේ අර්බුධයකට මුහුණ දීමට සිදුවිය. සමස්තයක් ලෙස රජයේ මූල්‍ය ප්‍රතිපත්තිය කෙරෙහි එම සිදුවීම් දැඩි බලපැමක් එල්ල කරන ලදි .

ඒ සියලු තත්ත්වයන් හමුවේ වුවද ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව ජාතික ආර්ථිකය සඳහා ප්‍රධාන දායකත්වයක් ලබාදෙන්නේ 2018 වසරේ රුපියල් බිලියන 125ක් ලබාදෙමින්ය. එය සංස්ථාවේ සමස්ත ආදායමෙන් 23.93% ක් වූ අතර සහන මිළ ගණන් යටතේ වුවද රටේ ඉන්ධන ඉල්ලුමට සරිලන ජනතාවට තත්ත්වය සුරකින ජිවන රටාවක් ගතකිරීමට මගපාදා දීමක් විය.

## කාර්යසාධනය

පිරිපහදුව මගින් 2018 වසරේදී බොරතෙල් මෙට්‍රික් ටොන් 1,675,000 ක් සකසනු ලැබීය. ඉන්ධන සහ ගෑස් වලට ඇති වූ ඉල්ලුම එම වසර තුළ දී 0.4% කින් ඉහළ ගිය අතර පෙරකී බාහිර සාධකයන්ද හේතුකොට ගෙන සංස්ථාවට ඒ සඳහා දරන්නට වූ වියදම 28% කින් ඉහළ ගොස් තිබුණි. රටට අවශ්‍ය පිරිපහදු ඉන්ධන හිඟ ප්‍රමාණය ලබාදෙනු වස් පිරිපහදු කරන ලද නිෂ්පාදනයන්ම ආනයනය කරන්නට සිදුවිය.

සමාලෝචනයට ලක් කරන වසර තුළ අභ්‍යන්තර විකිණීම් ප්‍රධානතම ආදායම් මාර්ගය විය. රජය විසින් 2018 වසරේදී පිරිවැය පරිවර්තිත මිල යානත්‍රණයක් හඳුන්වාදීම විශේෂයෙන් සඳහන් කළ යුතු වේ. ඒ අනුව මාසිකව පෙට්‍රල් සහ ඩීසල් මිල යම් නියාමනය කරන ලද ක්‍රමවේදයන්ට අනුව සංශෝධනය කරන ලද අතර ලෝක වෙළඳපොලේ මිල විචල්‍යතාව මත ලංකාවේ ද ඉන්ධන මිල නියමවනු දක්නට ලැබිණ.

අන්තර්ජාතික ඉන්ධන වෙළඳපලේ මිල විචල්‍යතාවන් හරහා සංස්ථාවට ඇති වූ අලාභයන් මිලයාන්ත්‍රණය මගින් ක්‍රමානුකූලව යම් ප්‍රමාණයකට කපාහරින්නට හැකි විය.

2018 වසරේදී ඔටෝ ඩීසල් වැඩිම ආදායමක් ඉපැයූ අතර 92 පෙට්‍රල් දෙවන ආදායම් උපයන්නා බවට පත්විය. 2017 වසරට සාපේක්ෂව පෙට්‍රල් 92 වලට ඇති ඉල්ලුම 10% කින් ඉහළ ගිය අතර පෙට්‍රල් 95 සහ සුපර් ඩීසල් සඳහා වූ ඉල්ලුමේ වර්ධනය මගින් පෙනුනුම් කර ඇත්තේ වඩාත් කාර්යක්ෂම සහ පරිසරහිතකාමී ඉන්ධන කෙරේ පරිභෝගිකයා තුළ ඇති කැමැත්තයි.

විමසුමට ලක්කරන වසර තුළදී සංස්ථාවේ ප්‍රතිරූපයට මෙන්ම සංස්ථාවට දැඩි මූල්‍යමය අවාසි සිදුකළ හැකි දුර්වලතාවයන් මෙන්ම අනෙකුත් සාධක රැසක් හඳුනාගැනීමට සමත් විය. ඒ අනුව රටට වර්ධනාත්මක සේවයක් ලබාදෙනු වස් ව්‍යාපෘති රැසකට ප්‍රාග්ධන ආයෝජනයන් ලෙස රුපියල් මිලියන 595කින් ආයෝජනය සිදුකර ඇත. එසේ තවත් ව්‍යාපෘති රැසක් එම වසර තුළ නිමවා ඇත. මෙහි සඳහන් කරන ලද විශාල ව්‍යාපෘති අතර පිරිපහදු අංගනය සඳහා බොයිලේරු සවි කිරීම ද සඳහන් කළ යුතුය.

එසේම **Jet - A -1** ඉන්ධන බෙදාහැරීම අංගනය ඉදිකිරීම ඇරඹීම සපුගස්කන්ද බෙදාහැරීම් පර්යන්තය ස්වයංක්‍රිය ක්‍රියාකාරීත්වයට යොමු කිරීම කොළොන්නාව CPSTL ආයතනය තුළ තෙල් පෙරහන් යන්ත්‍ර සවි කිරීම්ද වසරේ විශාල ව්‍යාපෘති අතරට එක්වේ.

## අනාගත දැක්ම

අපගේ මෙහෙයුම් සන්දර්භය තුළ දැවැන්ත අභියෝගයන් මතුවීම අපට පුදුම වීමට කරුණක් නොවිණ. අභියෝගයේ තරම නොතකා අනාගතය වෙත පියමැනිමට අප නිරන්තරයෙන් සූදානම්ව සිටියෙමු.

ශ්‍රී ලංකාවේ බලශක්ති සුරක්ෂිතතාව තහවුරු කරමින් පාරිභෝගිකයාට තත්ත්වයෙන් උසස් නිෂ්පාදන සැපයීමේදී ඇති නොසැලෙන කැපවීම පිලිබඳව අප ආඩම්බරයට පත්වෙමු. අප අපගේ වටිනාකම් ජාලය නිරන්තරයෙන් වර්ධනය කරනු වස් රට පුරා ඇති ඉන්ධන පිරවුම්හල් වල තත්ත්වය අන්තර්ජාතික ප්‍රමිතීන් යටතේ ඉහළ දැමීමට කටයුතු කරන්නෙමු.එසේම දේශීය හා විදේශීය ව්‍යාපාරික හැසිරීම්වල විචලනයන් නොසලකා හරිමින් අපගේ පිරිපහදු පහසුකම් පුළුල් කිරීම සහ වර්ධනය කිරීම් ද සිදු කරන්නනෙමු.

අපට නියත වශයෙන්ම ඉතා අපහසු තීරණ ද ගැනීමට සිදු වේ. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව රටේ සංවර්ධනය පෙරටු කරගනිමින් සංස්ථාවට හිමි ස්ථානය ආරක්ෂා කර ගැනීමට නිරන්තයෙන් පෙනී සිටීමට ඇති විශ්වාසය හේතුවෙනි. බාහිර සහ අභ්‍යන්තර බලපෑම් නොතකා සංස්ථාවේ අරමුණු වෙත ළඟාවීමට වෙහෙස නොබලා වැඩකටයුතු කරන කළමනාකරණ අධ්‍යක්ෂ වරයා සහ ඔහුගේ යටතේ මෙම කාර්යයන් සිදු කරන ආයතනයේ කළමණාකරණ කන්ඩායම මාගේ ඇගයීමට ලක්වේ. ඔවුන්ගේ වෘත්තීමය සහ අවංක මැදිහත්වීම් නිරන්තරයෙන්ම අපට අපහසු අවස්ථාවන්හිදී ශක්තියක් ලබාදුන් බවද කිව යුතුය. එනිසාම සංස්ථාවේ යහපත වෙනුවෙන් කටයුතුකළ සියළු දෙනාට මගේ ස්තුතිය හිමිවේ.

සංස්ථාවට මගපෙන්වමින්, උපදෙස් ලබාදෙමින් දිරි දුන් ගරු ඇමතිතුමා, ගරු නියෝජ්‍ය ඇමතිතුමිය, ඛණිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යංශයේ නිළධාරීන් සියළු දෙනාටද මගේ ස්තුතිය මේ මොහොතේ පිරිනමමි.

එසේම ඉතා ප්‍රවීණ උසස් දක්ෂතාවයන්ගෙන් හෙබි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබාදුන් කිසිවෙකුටත් නොදෙවෙනි නායකත්වය මෙහිදී අගය කළ යුතුය. විශේෂයෙන්ම පසුගිය වසර අභියෝගාත්මක වසරක් වූ බැවින් ඔවුන් නිරන්තරයෙන් ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවට රජය සතු ශඛ්‍යතාවක් සහිත ආයතනයක් බවට සපථ කර සිටී.

සමස්තයක් ලෙස අමිල වූ එම මානව ප්‍රාග්ධනය සමගඉදිරියේ ඇතිවන ප්‍රවණතාවන් මුළුමනින්ම වෙනස් කරමින් ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව එලඹෙන හෙට දිනයේදී ජයග්‍රාහී ලෙස සංවර්ධන මාවතට ගමන් කරනු ඇති බව මාගේ විශ්වාසයයි.

ස්තූතියි

**ජී.එස්. විතානගේ**

සභාපති






# කළමනාකාර අධ්‍යක්ෂතුමාගේ සමාලෝචනය

# කළමනාකරණ අධ්‍යක්ෂතුමාගේ සමාලෝචනය

සංවර්ධනය තුළ ඊටම ආවේනික වූ න්‍යායන් මත ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව සාමාන්‍යයෙන් ගැටළු වලට මුහුණ දෙන අතර 2018 වසර තුළ දී එම ගැටළුවල උග්‍රවීමක් දක්නට ලැබුණි. කෙසේ වෙතත් සංස්ථාව ඒ සියල්ල කෙරෙහිම උපරිම ස්ථායීතාවක් රඳවාගනිමින් ප්‍රතිචාර දක්වන ලද්දේ සංස්ථාවේ මෙහෙයුම් වලට හෝ සංවර්ධන ඉලක්කයන් මත කිසිදු බලපෑමක් ඇති නොවන ලෙසටය.

එසේම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ජනතාව වෙත පිරිපහදු කරන ලද ඛණිජ තෙල් නිෂ්පාදන සැපයීම සිදු කරන අතරම කාබන් විමෝචනය අවම කරමින් පැවරී ඇති සමාජ වගකීම ඉතා හොඳින් ආරක්ෂා කරන්නට කටයුතු කර තිබේ.

වසරේ අවසන් මාස දෙක හැරුණු විට 2018 වසර පුරා ජාත්‍යන්තර බොරතෙල් මිලේ ඉහළයාමක් දක්නට ලැබුණි. විශේෂයෙන්ම 2018 අගෝස්තු මැද සිට ඔක්තෝබර් මාසය ආරම්භය දක්වා දක්නට ලැබුණු ඉන්ධන මිලේ ඉහළයාමට එක්සත් ජනපදය විසින් ඉරානය කෙරෙහි පනවා තිබූ වෙළෙඳ තහනමද හේතුවක් විය. ලෝක මිළ දර්ශකයන් සැකසීම මෙන්ම එක්සත් ජනපදය තුළ බොරතෙල් නිෂ්පාදනය ඉහළ මට්ටමකට ගෙනඒම, අඩු අගයන් ගත් ලෝක ආර්ථික වර්ධනය සමග එක්විම මත 2018 වසර අවසානය වන විට ඉන්ධන මිළ පහළ යාමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරන්නට විය. දළ වශයෙන් බොරතෙල් බැරලයක මිල 2018 වසර අවසානය වන විට ඇමරිකානු ඩොලර් 71 .76ක් ලෙස සටහන් විය. එය 2017 වසරේදී ඇමරිකානු ඩොලර් 54.76කි. මැයි මස මැද වන විට ඉහත තත්ත්වය පාලය කිරීම සඳහා ප්‍රධාන පියවරක් ලෙස නව මිල ක්‍රමයන් හඳුන්වාදීම සිදු කරන ලදි. ඒ ඉන්ධන මිල ඉහළ යාම තුළින් අගතියට පත් මහජනතාව ඇතුළු පාර්ශවයන්ට සාධාරණයක් ඉටු කිරීමට අදහස් කරමිනි.

## මෙහෙයුම් පරිසරය

මහබැංකු වාර්තා වලට අනුව 2018 වසරේ රටේ ආර්ථික වර්ධනය 3.2% ක් වූ අතර එය 2017 වසරේ මට්ටම වූ 3.4% ට වඩා අඩු අගයකි. මෙය ගෝලීය හා දේශීය ක්‍රියාකාරීත්වයන්ගේ ප්‍රතිඵලයකි. රුපියල දරුණු අවප්‍රමාණයකට ලක්වීමේ තත්ත්වයක් තුළ වුවද දේශීය ඛණිජ තෙල් සඳහා මිල සූත්‍රයක් හඳුන්වාදීම තුළ 2018 වසරේදී උද්ධමන අගය තනි ඉලක්කමක් යටතේ එනම් 4.3% කට පවත්වා ගැනීමට හැකිවිය. 2017 වසරේ එම අගය 6.6% ක් විය.

සමස්තයක් ලෙස රටේ ආර්ථිකයේ බාහිර අංශය ගෝලීය සහ දේශීය කරුණු රැසක් හේතුකොටගෙන ස්ථාවර නොවුණි.

වෙළඳ හිඟය තවදුරටත් පුළුල් වූයේ අපනයන ආදායමට වඩා වියදමක් ආනයනයට ගෙවීමට සිදුවීමෙනි. එසේම සේවක ප්‍රේෂණ වර්ධනය නොවීම මෙන්ම ඉහළ යන පොලී අනුපාතය ද ඊට බලපෑ බව සඳහක් කළ යුතුය. රුපියලේ අගය අවප්‍රමාණය වීම පසුගිය වසරේ 16.4% ක් ලෙස සටහන් වූ අතර ඉන්ධන ආනයනය සඳහා වැඩිවූ මිල විසින් ගෙවීම් තුලනය කිරීම අපහසු කරනු ලැබ තිබුණි.

## කාර්ය සාධනය

2017 වසරට සපේක්ෂව 2018 වසරේ සංස්ථාවේ ආදායම 14.6% කින් වර්ධනය වී තිබූ අතර ජාත්‍යන්තර මිලට සමානුපාතව පෙට්‍රල් සහ ඩීසල් සඳහා සකසනු ලැබූ ඉන්ධන මිල සූත්‍රය ඊට හේතුවිය. අන්තර්ජාතික වෙළඳපොලේ ඉන්ධන මිල වෙනස්වීම් පදනම් කරගනිමින් රජය විසින් මැයි මාසයේ සිට පෙට්‍රල් සහ ඩීසල් මිල සංශෝධනයට ලක් කිරීම සිදු කරන ලදි.

කෙසේ වෙතත් 2018 වසර අභියෝගාත්මක වසරක් වූ අතර රුපියල් බිලියන 105 ක අලාභයක් දරාගැනීමට සිදුවුණි. සංස්ථාවට එවන් විශාල අලාභයක් විඳීමට සිදුවූයේ අන්තර්ජාතිකව ඉන්ධන මිල ඉහළයාම මෙන්ම විනිමය අනුපාතයන් පහළවැටීමේ කරුණු මතයි. වෙළඳපොළ තුළ ඇමරිකානු ඩොලර් හිඟවීම එම තත්ත්වය ඉහළයාමට බලපෑ අතර එය සංස්ථාවේ මූල්‍ය තත්ත්වය කෙරේ බැලපෑම් ඇතිකරන ලදි.

සංස්ථාවේ ප්‍රවාහන අංශය රුපියල් බිලියන 413ක ආදායමක් උපයමින් වැඩිම ආදායම වාර්ථා කළ අතර එය 2017 වසරට සාපේක්ෂව 20.9% ක වර්ධනයකි. කෙසේ වෙතත් ඉල්ලුම මෙන්ම මිල ද ඉහළ යාම හේතුවෙන් සංස්ථාවට රුපියල් බිලියන 96ක අලාභයක් විඳින්නට සිදුවිය. මිල සූත්‍රය මගින් ඉන්ධන මිල සංශෝධනයන් මාසිකව සිදු වුවද එය සංස්ථාවේ සියලු වියදම් පියවීමට හෝ විනිමය අනුපාතයන්හි වෙනස්වීම්වලට මුහුණ දීමට සමත් නොවුණි.

එසේම පහත වැටුණු විදුලි නිෂ්පාදන ඉල්ලුමට සාපේක්ෂව බලශක්ති ක්ෂේත්‍රය සඳහා ඉන්ධන මිලදී ගැනීම 33.6% කින් පහත වැටුණි. කෙසේ වෙතත් ගුවන් යානා සඳහා ඉන්ධන සැපයීම

### දේශීය මිලගණන්




ලාභදායී වූ අතර 2017 වසරට සාපේක්ෂව 26.3% ක ලාභයෙහි වර්ධනයක් දක්නට ලැබුණි. එසේම කර්මාන්ත අංශයේ ද 7.4% ක ආදායම් වර්ධනයක් මේ කාලය තුළ පෙන්නුම් කර ඇත. නමුත් සාමාන්‍ය ඉන්ධන අලෙවිය අපේක්ෂා කළ පරිදිම අලාභ ලබන්නට වූයේ පාරිභෝගික හිතවාදී ජාතික මිල ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමේ රටාව තුළයි.

ගෝලීය වශයෙන් ඉන්ධන මිල ඉහළ යාම සැලකියයුතු ආකාරයකින් සංස්ථාවට බලපෑ අතර වසර තුළ දී අන්තර්ජාතික වශයෙන් ඉන්ධන මිල ඉහළ 31.% කින් ඉහළ ගියද ශ්‍රී ලංකාව තුළ ඉන්ධන අලෙවිය සිදුවූයේ පාඩු ලබන තත්ත්වයක් තුළය. රජයේ තීරණ මත භූමිතෙල් රු.70ක් වැනි ඉතා විශාල සහනදායී මිලක් යටතේ මහජනතාව වෙත නිකුත් කිරීම සඳහන් කළ යුතුය. මෙම ක්‍රියාවලිය රුපියල් මිලියන 14,735 ක මෙහෙයුම් අලාභයක් සංස්ථාවට ජනිත වීමට හේතු විය. එමෙන්ම ලංකා විදුලි බල මණ්ඩලය විසින් පිරිපහදු කරන ලද නිෂ්පාදන සම්පූර්ණයෙන් මිලදී නොගැනීම දැඩි වැසි සහිත කාලගුණ තත්ත්වයන් ඇති විට දැවි තෙල් සහ නැප්තා අපනයනය කිරීමට සිදුවීම වැනි කරුණු හේතුකොට ගෙන සංස්ථාවට රුපියල් මිලියන 1064ක අලාභයක් දරාගැනීමට සිදු වී තිබේ.

එමෙන්ම විනිමය අනුපාතයන් වෙනස්වීම සංස්ථාවේ මෙහෙයුම් කෙරෙහි සෘජුවම බලපෑම් එල්ලකර තිබේ. වර්ෂය තුළ ඩොලරයට සමානුපාතිකව රුපියලේ අගය අවප්‍රමාණ වීම රු 29.45 ක් හෝ 19% ක් වන අතර සංස්ථාවට දරන්නට සිදු වූ විනිමය අලාභය මිලියන 82,717 කි. සංස්ථාවට දරන්නට වූ අලාභයෙන් 78% ක්ම දරන්නට වූයේ විනිමය අනුපාතයෙන් මගින් ඇති වූ වෙනස්කම් වලිනි. 2017 වසරට සාපේක්ෂව පොලී සඳහා වියදම් රු. මිලියන 1534 කින් (15%) කින් ඉහළ ගොස් ඇත්තේ බැංකු හරහා ලබාගත් ණය හේතුවෙනි.

වෙළඳපොල තුළ විදේශ මුදල් ඉතා සීමිත වූ බැවින් රාජ්‍ය බැංකු දෙකකින් ලබාගත් ණය සමුච්චිත වී වර්ධනය වන ලදි. කෙසේ වෙතත් දෛනික ආදායම කෙටි කාලීන ආයෝජනයන්හි යෙදවීමෙන් වූ අලාභය මදකින් හෝ අඩුකර ගැනීමට හැකියාව ලැබිණ.

වර්ෂය තුළ ප්‍රාග්ධන ව්‍යාපෘතීන්හි ආයෝජනය කිරීම රු. මිලියන 595කින් වර්ධනය වූ අතර ඉතා වැදගත් ව්‍යාපෘති කිහිපයක් මෙම වසර තුළ අවසන් කර තිබේ. ඒ අනුව කොළොන්නාව අංගනය තුළ ඉදි කරන ලද JET -A1 ඉන්ධන පෙරහන් යන්ත්‍රය නිදසුනක් ලෙස දැක්විය හැකිවේ. එමගින් අන්තර්ජාතික තත්ත්වයන්ට සරිලන ඉහළම තත්ත්වයේ ගුවන් යානා ඉන්ධන ලබාදීමට සමත්ව තිබේ.

එසේම සංස්ථාවේ ඉන්ධන පිරිපහදුව මගින් නැවත වතාවක් තාර නිෂ්පාදනය ආරම්භ කරන ලද අතර සංස්ථාව විසින් වෙළඳපොල තුළ තාර තොග ප්‍රමාණය වර්ධනය කරන ලදි. නවීකරන පිරිපහදු කර්තව්‍යයේ දැවැන්තම අදියරක් ලෙස දින 35ක් වැනි කාලයක් තුළ දී පිරිපහදු නවීකරණ කාර්යයන් රැසක් සිදු කරන්නට සමත් විය.

එසේම අප විසින් 2018 ජනවාරි මාසයේදී බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ ගුවන් යානා ඉන්ධන සැපයීමේ පද්ධතිය කඩිනමින් සංවර්ධනය කිරීම ආරම්භ කරන ලදි. එසේම වසර ගනණාවත් තිස්සේ අනුගමනය කරන ලද ප්‍රමිතීන් කෙරහි උපරිම වැදගත් කමක් ලබාදෙන අතරම නියමනයන්ට අනුකූලව කටයුතු කරමින් සංස්ථාවේ ගරුත්වය රැකගැනීමට හැකි උපරිමයෙන් කටයුතු සිදු කර තිබේ.

එසේම සංස්ථාව විසින් ජාතියේ දුවා දරුවන්ගේ සංවර්ධන ප්‍රමුඵතාවන් තේරුම් බේරුම් කරගනිමින් කාර්මික සම්මතයන් ආරක්ෂා කර ගනිමින් මෙන්ම සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වෙමින් එහි තතත්වයන් ආරක්ෂා කර ගනිමින් කටයුතු සිදු කර ඇත. සංස්ථාව විසින් රටට අවශ්‍ය සේවා සැපයුවා පමණක් නොව රටේ ආර්ථික වර්ධනයටද නිරන්තරයෙන් අත්වැලක් සපයන ලදි. සංස්ථාව අප රට තුළ බදු ගෙවන දැවැන්තම ආයතනයක් වන අතර මෙම වර්ෂයේ රු. මිලියන 124,805 ක් මුදලකින් දායක වී ඇති අතර එය සංස්ථාවේ ශුද්ධ ආදායමෙන් 23.93% කි.

## ඇගයීම

අනාගතය පිළිබඳ අප ඉතා සුභවාදී වෙමු. එසේම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති උසස් ප්‍රමිතිගත තත්ත්වයන් එහි අරටුව සේ ක්‍රියා කරයි. සියලුම පහසුකම් සහ ක්‍රියාදාමයන් නිරන්තර ඇගයීමට ලක් කිරීම සඳහා අවශ්‍ය ඉහළම යාන්ත්‍රණයන් අප සතුව ඇති අතර ඒ තුළින් විනිවිදභාවය සහ වගවීම සපථ කර සිටින්නෙමු. ඛනිජ තෙල් කර්මාන්තයේ දේශීයව සහ විදේශීයව මතු වූ විවිධාකාර අර්බුද වලදී අවබෝධයෙන් යුතුව මාවෙත සහයෝගය දක්වමින් මා සමගින් කටයුතු කළ කළමනාකරණ කණ්ඩායම පිළිබඳව මා නිරන්තරයෙන් ආඩම්බර වෙමි. සංස්ථාවේ අනාගතය සහ යහපත සඳහා ඔවුන්ගේ කැපවීම අගය කළ යුතුවේ. එසේම සියලුම අංශයන්හි අපගේ කාර්ය මණ්ඩලයේ සේවයද අගය කළ යුතුය. සංස්ථාව වෙත හෙට දිනයේදී පැමිණෙන අභියෝග සමග නිරන්තරයෙන් ඉදිරියට යාමට සූදානම්ව සිටින බව මගේ විශ්වාසයයි.

ස්තූතියි,



**එන්.ආර්.ආර් ජයසේකර**

කළමනාකාර අධ්‍යක්ෂ






# අපගේ නායකත්වය

# අපගේ නායකත්වය



**පී.එස්. විතානගේ මහතා**
සභාපති



**එන්. ආර්. ආර්. ජයසේකර මහතා**
කළමනාකර අධ්‍යක්ෂ



**ආර්.එම් විජේසිංහ මහතා**
අධ්‍යක්ෂක



**කේ. ඒ. විමලේන්තිරරාජා මහතා**
අධ්‍යක්ෂ



**ඩබ්. ආර් පෙරේරා මහතා**
අධ්‍යක්ෂක



**පී. සමන් රෝහිත මහතා**
අධ්‍යක්ෂක



**එම්.වයි. හුසේන් මහතා**
අධ්‍යක්ෂක

# අධ්‍යක්ෂ මණ්ඩලය



## පී.එස්. විතානගේ මහතා
**සභාපති**

පී.එස්. විතානගේ මහතා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ලෙසත්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අනුබද්ධිත ආයතනයක් වන ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමෙහි සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ලෙසත් කටයුතු කරයි.

විතානගේ මහතා ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ සහ සීමාසහිත ශ්‍රී ලංකන් කේටරින් හි සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ද වේ. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් කළමනාකරණ උපාධිය ලබාගත් අතර කොළඹ විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා තිබේ.1984 වසරේදී රාජ්‍ය පරිපාලන අමාත්‍යංශයේ සහකාර අධ්‍යක්ෂවරයෙකු ලෙස සහ 1990 දී සහකාර අධ්‍යක්ෂවරයෙකු ලෙස ශ්‍රී ලංකා පරිපාලන සේවයට බැඳුණු ඔහු ශ්‍රී ලංකා සීනි සංස්ථාවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරට පත් කරන ලදී. පසුව ආරක්ෂක අමාත්‍යංශයේ සහකාර ලේකම් ධුරයට පත් විය. 1995 දී විතානගේ මහතා ජනමාධ්‍ය, සංචාරක හා ගුවන් සේවා අමාත්‍යංශයේ සහකාර ලේකම් ලෙස පත් කරන ලද අතර 2002 වසරේදී ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුරට උසස් කරන ලදී. 2004 දී ප්‍රවාහන, මහාමාර්ග හා සිවිල් ගුවන් සේවා අමාත්‍යංශයේ අතිරේක ලේකම් ධුරය සඳහා පත් කරන ලද අතර 2012 වනතුරු එහි සේවය කර ඇති පී. එස්. විතානගේ මහතා පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යංශයේ ලේකම් ලෙස වැඩ බාර ගන්නා ලදී. ඉන් පසුව 2015 දී ඔහු විදේශ රැකියා අමාත්‍යංශයේ ලේකම් ලෙස පත් කරන ලද අතර 2017 ඔහු විශ්‍රාම යන තෙක් ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යංශයේ ලේකම් ලෙස රාජකාරී ඉටු කළේය. ඔහු සිය වෘත්තීය ජීවිතය පුරාම ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ප්‍රවීණ නිලධාරියෙකු ලෙස කටයුතු කරමින් ඉහත තනතුරු හෙබවූ විතානගේ මහතා කිහිප අවස්ථාවකදීම විදේශ රටවලදී ශ්‍රී ලංකා රජයේ නියෝජිත කණ්ඩායම් මෙහෙයවීම සඳහා පත් කර තිබේ. ඔහු 2006 මැයි මාසයේදී කොළඹදී පවත්වන ලද සාර්ක් කලාපීය බහුමාදිලි ප්‍රවාහන සම්මන්ත්‍රණයේ සභාපතිවරයා ලෙස පත් කෙරිණි. ඊට අමතරව, ඔහු අමාත්‍යංශ උපදේශන කොළඹ ක්‍රියාවලියේ 5වන තානාපති උපදේශන ක්‍රියාවලිය (ශ්‍රම සැපයුම් රටවල් අතර කලාපීය උපදේශන ක්‍රියාවලිය) සංවිධානය කර ඇති අතර 2016 දී දෙවන වරටත් ලංකාවේ සභාපති ධුරය දරා තිබේ. තවද 2017 ජනවාරි 24 වන දින  කොළඹදී පැවැත්වූ අබුඩාබි සංවාදයේ සිව්වන අමාත්‍ය උපදේශනය සංවිධානය කිරීමට විතානගේ මහතා සහභාගී වී ඇති අතර ශ්‍රී ලංකාවේ සභාපති ධුරය ද හොබවා තිබේ.



## එන් ආර්. ආර්. ජයසේකර මහතා
**කළමනාකාර අධ්‍යක්ෂක**

ජයසේකර මහතා පෙරාදෙනිය විශ්ව විද්‍යාලයෙන් යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ  උපාධියක් ලබා ඇති අතර ශ්‍රී ලංකාවේ විවෘත විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනවේදී පශ්චාත් උපාධියක් ලබා ඇත. ඔහු වරලත් ඉංජිනේරුවරයෙකු මෙන්ම ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සාමාජිකයෙකි. ඊට අමතරව ඔහු අබුඩාබියේ ADNOC පිරිපහදු මධ්‍යස්ථානවල (රුවයිස් සහ උම් අල් නාර්)  පිරිපහදු නඩත්තුව පිළිබඳව ද ස්වීඩනයේ ස්ටොක්හෝල්ම් හි නඩත්තු කළමනාකරණය පිළිබඳව ද ජර්මනියේ මැන්හයිම් හිදී බලාගාර පුහුණුව සහ පුද්ගල සංවර්ධනය පිළිබඳවත් වෘත්තීය පුහුණුව ලබා ඇති අතර එවැනි තවත් ජාත්‍යන්තර පුහුණු වඩසටහන් රැසකට ද සහභාගි වී ඇත.

ඔහු සිය වෘත්තීය ජීවිතයේ සැලකිය යුතු කාලයක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ගත කර ඇති අතර 1992 සිට 1995 අතර කාල පරිච්ඡේදයේදී දෝහා,කටාර් නුවර රාස් අබු එබවුඩ් බලශක්ති මධ්‍යස්ථානයේ ජල හා විදුලි අමාත්‍යාංශයේ ඉන්ධන ඉංජිනේරු තනතුර හෙබවීය.

සිය වෘත්තීය ජීවිතය ආරම්භයේදී ඔහු මුලින්ම පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ උපදේශකයෙකු ලෙස ද පසුව කන්තලේ සීනි කර්මාන්ත ශාලාවේ යාන්ත්‍රික ඉංජිනේරු වරයෙකු ලෙස ද ඉන් අනතුරුව 1981 යාන්ත්‍රික ඉංජිනේරු වරයෙකු ලෙස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පිරිපහදුවට බැඳුණු ඔහු එහි වසර 37ක් සේවය කර ඇත. ඔහු ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ නියෝජ්‍ය ඉංජිනේරු කළමනාකරු (බලාගාර උපකරණ), ඉංජිනේරු කළමනාකරු (නඩත්තු), නියෝජ්‍ය පිරිපහදු කළමනාකරු (නඩත්තු සහ ව්‍යාපෘති) සහ පිරිපහදු කළමණාකරු ලෙසත් උසස්වීම් ලද ඔහු වර්ථමානයේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ කළමනාකාර අධ්‍යක්ෂක ලෙස කටයුතු කරයි.



## කේ.ඒ. විමලේන්තිරරාජා මහතා
**අධ්‍යක්ෂක**

විමලේන්තිරරාජා මහතාගේ පළමු උපාධිය යාපනය විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳවය. ඔහු ව්‍යාපෘති කළමනාකරණය සම්බන්ධයෙන් පශ්චාත් උපාධියක් ද, මහජන ආර්ථික විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධියක් ද සංවර්ධන අධ්‍යනයන් හා මහජන ප්‍රතිපත්ති පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමාවක් ද, ජාත්‍යන්තර කටයුතු පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයෙන් නීති උපාධියක් ද නීතිය පිළිබඳ ඇර්ටනි සහතිකයක් ද ලබාගෙන ඇත. ඔහු ඔස්ට්‍රේලියානු පරිගණක සමාජයේ සහතිකයක් ද ලබා ඇති අතර ඔහු ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු ද වෙයි. ඔහු කොළඹ විශ්ව විද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනයේ විද්වත් සන්සදයේ සාමාජිකයෙකු ද වෙයි. වර්තමානයේ ඔහු රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යයක්ෂ ජනරාල් ලෙස සේවය කරයි. ඔහුගේ දීප්තිමත් වෘත්තීය ජීවිතය තුළ දී ඔහු ප්‍රධාන රාජ්‍ය තනතුරු ගණනාවක් දරා ඇත. ඔහු ලංකා බැංකුවේ  විකල්ප අධ්‍යක්ෂවරයකු මෙන්ම ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ අධ්‍යක්ෂවරයෙකි. ඔහු වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ මෙන්ම මුදල් අමාත්‍යාංශයේ ද හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු ද වෙයි. ඔහු චීනයේ බීජිං නුවර ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ හිටපු අමාත්‍යංශ උපදේශක වරයෙකු / අධ්‍යක්ෂවරයෙකු මෙන්ම සාර්ක් සංවර්ධන අරමුදලේ ජාතික අධ්‍යක්ෂවරයෙකු ද වෙයි. ඔහු මහජන සේවා පාරිතෝෂික අරමුදල් පදනමේ හිටපු භාණ්ඩාගාර නියෝජිතයෙකු, රාජ්‍ය පරිපාලන සහ දේශීය කටයුතු අමාත්‍යංශයේ හිටපු ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් වරයෙකු ද විය. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ ප්‍රතිස්ථාපන වැඩසටහනේ ධාරිතා සංවර්ධන කටයුතු පිළිබඳ සහකාර වැඩසටහන් කළමනාකරුවකු, වරාය පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ සැලසුම් සහ ප්‍රතිසංස්කරණය පිළිබඳ හිටපු සහකාර ලේකම්වරයෙකු, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන අයතනයේ හිටපු කැඩෙට් නිළධාරියෙකි. වවුනියා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හිටපු සමෘධි කළමනාකරු සහ එම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේම හිටපු සංවර්ධන වැඩසටහන් සහකාරවරයෙකු ලෙස ද ඔහු කටයුතු කර ඇත.



## ආර්.එම් විජේසිංහ මහතා
**අධ්‍යක්ෂක**

රාජකීය විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා ඇති විජේසිංහ මහතා, බ්‍රසල්ස් හි වර්ජේ විශ්ව විද්‍යාලයෙන් ජාත්‍යයන්තර නීති සහයෝගීතාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇති අතර එංගලන්තයේ සහ වේල්සයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ සොලිසිටර් වරයෙකු ලෙස සුදුසුකම් ලබා තිබේ. ඕස්ට්‍රේලියානු කලාපයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ සොලිසිටර් සහ බැරිස්ටර් වරයෙකු සහ ඔස්ට්‍රේලියාවේ මහාධිකරණයේ බැරිස්ටර් වරයෙකි,රාජ්‍ය සහ පුද්ගලික අංශයේ අතීත සහ වර්තමාන නීතිමය අත්දැකීම් විශ්වීය ලෙස ලබා ඇති විජේසිංහ මහතා දේශීය හා ජාත්‍යන්තර නීතිය පිළිබඳ අත්දැකීම් සම්භාරයක් ලබා තිබේ.2011 දෙසැම්බර් මාසයේ සිට දැනට කලම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් හි ජ්‍යේෂ්ට සාමාන්‍යාධිකාරී ලෙස සේවය කරන අතර,ලොව විශාලතම වරාය මෙහෙයුම් සමාගම වන සීමාසහිත චයිනා මර්චර්න්ට්ස් පෝර්ට්ස් හෝල්ඩිංග්ස් පුද්ගලික සමාගමේ ජේෂ්ඨ ජාත්‍යන්තර උපදේශක ලෙස සේවය කරයි.එම සමාගම දැනට සීමාසහිත හම්බන්තොට වරාය පුද්ගලික සමාගම සමග කටයුතු කරන අතර විජේසිංහ මහතා එහි ප්‍රධාන විධායක නිළධාරියාගේ නීති උපදේශක ලෙස කටයුතු කරයි. එසේම සීමාසහිත මගනැගුම මාර්ග ඉදිකිරීම් උපකරණ පුද්ගලික සමාගමේ සහ ටොපෑස් හෝටලයේ ද ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයේ ජාතික වැඩසටහන් කමිටුවේ ද අධ්‍යක්ෂ ධූරයන් හොබවයි. ඔහු ඕස්ට්‍රේලියානු රාජ්‍ය සේවයේ අංශයක් වන ඕස්ට්‍රේලියානු අධීක්ෂණ කොමිෂන් සභාවේ සහකාර අධ්‍යයක්ෂවරයෙකු ලෙස සේවය කර තිබේ, එසේම ජාතික ලොතරැයි මණ්ඩලයේ විධායක අධ්‍යයක්ෂ සහ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අධ්‍යයක්ෂ ජනරාල් ලෙස සේවය කර ඇති විජේසිංහ මහතා රාජ්‍ය සේවයේ බහුල අත්දැකීම් ලබා තිබේ. විජේසිංහ මහතා නීති වේදියෙකු ලෙස සුදුසුකම් ලැබීමෙන් පසු මහාරාජා සමාගම් සමූහයට බැඳී 1989 වසරේදී ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වන තෙක් එහි සමූහ පිරිස් කළමණාකරු ලෙස කටයුතු කර තිබේ.



## ඩබ්. ආර් පෙරේරා මහතා
**අධ්‍යක්ෂක**

කොළඹ ආනන්ද විද්‍යාලයෙන් අධ්‍යාපනය හදාරා ඇති පෙරේරා මහතා අතිවිෂ්ට ව්‍යවසායකයකුගේ ආදර්ශයක් වන අතර ලෝකය වෙනස් කිරිම සඳහා එම බලපෑම යොදා ගනී. ඔහුගේ පෞද්ගලික ගති ලක්ෂණයන් සාර්ථක ව්‍යයවසායකයින් අතර ඇති ගති ලක්ෂණ ස්වභාවයක් ගනී.ඔවුන්ගේ සිතිවිලි සහ සහ ක්‍රියාදාමයන් පාලනය කිරීමට ඔහුට හැකි අතර ඔවුන් ඉදිරියේ ඇති ඕනෑම වර්ථමාන තත්ත්වයකට මුළුමනින්ම පෙනී සිටිමින් අවධානය යොමුකිරීමේ හැකියාව පවතී.

මානව යහපැවැත්ම නංවාලීම සඳහාත්, කොලොන්නාව නගර සභා ප්‍රදේශයේ පදිංචි වූවන්ගේ මූලික මානව අවශ්‍යතා සපුරාලීම සඳහාත්, අවදානනම් සහිත, පීඩිත බවින් පෙළෙන පුද්ගලයින් සවිබල ගැන්වීම සඳහාත් 2002 සිට 2006 සිට දක්වා කාලය තුළ තෝරාපත්වූ නගර සභා නියෝජිතයෙකු ලෙස ඔහු සිය සමාජ වැඩ කටයුතු වැඩි දියුණු කර තිබේ. ඔහු දරිද්‍රතාවයෙන් පෙළෙන ජනතාවගේ අයිතිවාසිකම් සහ යහපත වෙනුවෙන් පෙනී සිටියි.





## එම්.වයි. හුසේන් මහතා

**අධ්‍යක්ෂක**

හුසේන් මහතා වසර 45 කට වැඩි පළපුරුද්දක් ඇති ඛනිජ තෙල් කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රවීණයෙකි. ඛනිජ තෙල් කර්මාන්තයේ නියැලී සිටින ඉහළ පිළිගැනීමක් ඇති ජාත්‍යන්තර ඛනිජ තෙල් සමාගම්වල අත්දැකීම් ලබා ගනිමින් වෘත්තීය සහ ජාත්‍යන්තර මට්ටමේ පුහුණු අත්දැකීම් රාශියක් ඔහු සතු වේ. ඔහු ජාත්‍යන්තරව පිළිගත් සහතිකයක් පිරිනමන කැනඩාවේ උතුරු ඇල්බර්ටා  තාක්ෂණ ආයතනයේ පිරිපහදු ක්‍රියාවලි මෙහෙයුම් සඳහා ප්‍රධාන උපදේශක වශයෙන් පිදුම් ලබා ඇත.හුසේන් මහතා ටකීර් හි පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ  ජ්‍යෙෂ්ඨ නියමු ඉංජිනේරුවරයෙකු ලෙස සේවය කර ඇති අතර  හයිඩ්‍රෝ ට්‍රීටින්ග් සහ හයිඩ්‍රෝ කැකර් යන්ත්‍රෝපකරණ දෙවර්ගය සඳහා ප්‍රධාන යන්ත්‍රයේ (ද්විත්ව ප්‍රතිසංස්කරණ ) ස්ථාපන කිරීම්, නියෝග ලබාදීම සහ  පරීක්ෂණ ධාවන සඳහා වැඩබිම් භාරව ක්‍රියාකාරී ලෙස සම්බන්ධවීමේ වගකීම් දරා තිබේ. ඔහු 2001 සිට 2009 වසර දක්වා කාලය තුළ තාක්ෂණික ක්‍රියාදාම උපදේශක ලෙස ඇඩ්නොක් තාක්ෂනික ආයතනයේ සේවය කර ඇත.ඔහු විවිධ ක්‍රමෝපායන් භාවිත කරමින් ඇඩ්නොක් සෙවකයින් වන ක්‍රියාදාම මෙහෙයවන්නන්, වැඩමුර පරීක්ෂකවරුන්, වැඩමුර පාලකයින් සහ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික මෙහෙයුම්කරුවන් හට නායකත්ව සහ තාක්ෂණික උපදෙස් ලබාදී ඇති අතර එමෙන්ම එක්සත් අරාබි එමීර් ජාතිකයින් සඳහා පුහුණුව උසස් කිරීම සඳහාත් සහ පළපුරුද්ද ඇතිකිරීම සඳහාත් කටයුතු කර තිබේ. හුසේන් මහතා ඛනිජ තෙල් කර්මාන්ත ක්ෂේත්‍රයේ අත්දැකීම් සම්භාරයක් ලැබූ අයෙකි.1969 සිට 2016 දක්වා කාලය තුළ හුසේන් මහතා ඇඩ්නොක් ඇරැම්කෝ සහ බහරේන් ජාතික ගෑස් සමාගමේ සේවය කර ඇති අතර ඔහු අබුඩාබි රජයේ ප්‍රධාන තෙල් පිරිපහදු යන්ත්‍රවල මෙහෙයුම් අධීක්ෂණය කර ඇත.

## පී. සමන් රෝහිත මහතා

**අධ්‍යක්ෂක**

රෝහිත මහතා හට තීන්ත හා රසායනික නිෂ්පාදන කළමනාකරණයේ වසර 17 කට වැඩි පළපුරුද්දක් ඇති අතර අධ්‍යක්ෂ සහ කළමණාකාර අධ්‍යක්ෂ ලෙස සිය සේවය ලබා දී ඇත. මේ වන විට ඔහු රසායනික කර්මාන්තයේ ප්‍රමුඛ සමාගමක් වන ස්ටෑන්ඩර්ඩ් කෙමිකල්ස් ලිමිටඩ් හි අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරයි. 2009 සිට 2013 දක්වා කාලය තුළ රෝහිත මහතා සීමාසහිත රොවෙක්ස් පේන්ට් ඉන්ඩස්ට්‍රීස් පුද්ගලික සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ ලෙස කටයුතු කර ඇත. ඔහු සමාගමේ සියලු මෙහෙයුම් අධීක්ෂණය කර ඇති අතර එමගින් වඩා උසස් මෙහෙයුම් සහ මූල්‍ය තත්ත්වයක් ලබාදීමට කටයුතුකර තිබේ.

තවද, රෝහිත මහතා 1996 සිට 2009 සිට දක්වා කාලය තුළ  කෙමිසේල්ස් හෝල්ඩින්ග් පුද්ගලික සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ ලෙස කටයුතු කර ඇත. කීර්තිමත් සමාගම්වල ඉහළ තනතුරු දරමින් ඔහු කළමනාකරණ අවකාශය පිළිබඳ අත්දැකීම් සම්භාරයක් ලබා ඇති අතර සමාගම් වැඩිදියුණු කිරීම සඳහා දායක වී තිබේ.

# ආයතනික කළමණාකරණ කණ්ඩායම







**ඊ.ඒ. එස්. එදිරිසිංහ මහතා**
**වැඩබලන පිරිපහදු කළමනාකරු**

එදිරිසිංහ මහතා රසායනික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා ඇති අතර ශ්‍රී ලංකාවේ ඉංජිනේරු ආයතනයේ සාමාජිකයෙක් සහ ශ්‍රී ලංකා බලශක්ති කළමනාකරුවන්ගේ සංගමයේ සාමාජිකයෙකි.

වසර හතරක නියමිත වැඩකොටසක් ඉටුකිරීම සඳහා ඔහු 1988 දී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට බැඳුනේ වසර දෙකක කාලයක් සෞදි අරාබියේ යාන්බු හි සවුදි ඇරම්කෝ තෙල් පිරිපහදුවේ මිශ්‍රණ විශේෂ ඉංජිනේරුවරයෙකු ලෙස කටයුතු කිරීමට පෙරය. නැවත ඔහු 1996 සංස්ථාවට බැඳුනේ එම තනතුර සඳහාම වන අතර 2002 වසරේදී තාක්ෂණික සේවා සහකාර කළමනාකරු (ක්‍රියාමාර්ග) ලෙස උසස්වීමක් ලැබීය. 2005 වසරේදී ඔහු නියෝජ්‍ය කළමණාකරු කාර්මික සේවා (ව්‍යාපෘති) ලෙස උසස් වීමක් ලැබීය. 2009 වසරේදී මෙහෙයුම් කළමණාකරු 2014 නියෝජ්‍ය පිරිපහදු කලමනාකරු (නිෂ්පාදන හා මෙහෙයුම්) ලෙසත් කටයුතු කර ඇති අතර වර්ථමානයේ සංස්ථාවේ පිරිපහදු කලමනාකරු ලෙස ඔහු සේවය කරයි.

**එස්.බඩ්. ගමගේ මහතා.**
**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී**
**(මානව සම්පත් හා පරිපාලන)**

ගමගේ මහතා රුහුණු විශ්ව විද්‍යාලයෙන් ජීව විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී දී උපාධියක් ලබා ඇති අතර පසුව නෙදර්ලන්තයේ වැගනිං කෘෂිකාර්මික විශ්ව විද්‍යාලයෙන් විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ගත්තේය. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් එම්බීඒ උපාධියක් ද, ව්‍යාපාර හා මූල්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනයෙන් පුහුණුව හා කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි සහතිකයක් ද ලබා ඇත. ඔහු පුද්ගල හා සංවර්ධන පිළිබඳ වරලත් ආයතනයේ සහකාර සාමාජිකයෙකි.

කළමනාකරණ අභ්‍යාස ලාභියකු ලෙස 1991 වසරේදී  දී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට බැඳුණු ඔහු කළමනාකරණ තනතුරු ගණනාවක සේවය කර ඇති අතර සංස්ථාවේ වසර විසි අටක් අඛණ්ඩව සේවය කර තිබේ. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ගුවන් තෙල් කටයුතු මගින් සේවා ආරම්භ කළ ඔහු ජාත්‍යන්තර ගුවන් තොටුපලවල ගුවන් යානා ඉන්ධන පිරවීමේ මෙහෙයුම් සඳහා සහතික සහ සුදුසුකම් ලත් නිලධාරියෙකු ලෙස තහවුරු කර ඇත.

2009 වසරේදී ඔහු වර්ථමාන තනතුර වන මානව සම්පත් හා පරිපාලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරට උසස් කරන ලදී.

**එම්. කේ. ගරුසිංහ මහතා**
**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී**
**(වාණිජ හා සැපයුම් දාමය )**

ගරුසිංහ මහතා කොළඹ විශ්ව විද්‍යාලයෙන් විද්‍යාවේදී උපාධියක් ලබා ඇති අතර ස්වීඩනයේ මැල්මෝහි ලෝක සමුද්‍රීය විශ්ව විද්‍යාලයෙන් සමුද්‍රීය කටයුතු පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ගත්තේය. ඔහු ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් එම්බීඒ උපාධියක් ද ලබා ඇත.

ඔහු වරලත් නැව් තැරැව්කරුවන්ගේ ආයතනයේ සාමාජිකයෙක් වන අතර ශ්‍රී ලංකාවේ සැපයුම් සහ ද්‍රව්‍ය කළමනාකරණ ආයතනයේ ආයතනික සාමාජිකයෙකි. ඔහු මේ වන විට වාණිජ හා සැපයුම් දාම කාර්‍යංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයාය.



## ඩබ්. එම්. කේ. ආර්. බී. වික්‍රමසිංහ. මහතා

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී අලෙවි**

වික්‍රමසිංහ මහතා පේරාදෙනිය විශ්ව විද්‍යාලයෙන් විද්‍යාවේදී උපාධියක් ලබා ඇති අතර කොළඹ විශ්ව විද්‍යාලයෙන් එම්බීඒ උපාධියක් ලබා ඇත. ඔහු ලංකාවේ රසායන විද්‍යා ආයතනයේ සාමාජිකයෙකු වන අතර වන අතර ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයේ සහතික ලත් සාමාජිකයෙකි. මීට අමතරව, ඔහු දකුණු අප්‍රිකාවෙන් මානව සම්පත් නායකත්ව කළමනාකරණ විශිෂ්ටත්වය පිලිබඳ වෘත්තීමය පුහුණුවක් ලබාඇත, ව්‍යාපාර මෙහෙයවීම - එක්සත් රාජධානියේ සිට කාර්ය සාධනය සහ අලෙවිකරණ ව්‍යාපාර මෙහෙයවීම - එක්සත් රජධානියේ අලෙවි හවුල්කාරීත්වය සහ එම කටයුතු මෙහෙයවීම, මතුපිට සත්කාර සමග ආකලනය- ඇවෙසියා - එක්සත් රාජධානිය, සිංගප්පූරුවේ අක්වලොන් හි සිට මතුපිට පෘෂ්ඨයන්හි භූවිද්‍යාත්මක වෙනස් කිරීම්, 1999 - 2008 දක්වා සීමාසහිත කෙමිකල් ඉන්ඩස්ට්‍රීස් හි ජ්‍යෙෂ්ඨ නිෂ්පාදන කළමනාකරු ලෙස සේවය කර තිබේ. සීඅයිසී හි ඔහුගේ ප්‍රධාන කටයුත්ත වූයේ ශ්‍රී ලංකාවේ කර්මාන්ත සඳහා කාර්මික අමුද්‍රව්‍ය ශ්‍රී ලංකාවට ආනයනය කිරීම, ගබඩා කිරීම සහ අලෙවිකරණය මෙන්ම ඉමල්ෂන් පොලිමර් නිෂ්පාදනය හා අලෙවිකරණයයි. මූල්‍ය ප්‍රාග්ධන සහ පොදු කාර්ය වියදම් සඳහා අයවැය සැකසීම, සමතුලිත ලකුණු කාඩ්පත් ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රවීණත්වය, අධීක්ෂණය, ද්‍රව, යන්ත්‍රෝපකරණ පර්යේෂණ සහ සංවර්ධනය වැනි කරුණු පිළිබඳ ගැඹුරු ප්‍රායෝගික අවබෝධයක් ඔහුට තිබේ. වර්ථමානයේ ඔහු ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අලෙවි ලෙස කටුයුතු කරන අතර අතර ඔහුට පැවරී ඇති වගකීම් අතර ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අලෙවිකරණ මෙහෙයුම් පාලනය කිරීම හා සම්බන්ධීකරණය කිරීම ඇතුළුව දේශීය ඉන්ධන වෙළඳපොල, කෘෂි රසායනික ක්‍රියාකාරීත්වය, තාර, ලිහිසි තෙල් සහ විශේෂ නිෂ්පාදන කාර්යයන් සහ පාරිභෝගික සත්කාර සහ ආයතනික සන්නිවේදන ඒකකය මෙන්ම සේවා ස්ථාන උපකරණ සහිත එවක පාලනය සහ සම්බන්ධීකරණය වේ. සංස්ථාවේ සැලසුම් සහ අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී ව්‍යාපාරික පරිසරය තුළ ඇති අභියෝගයන්ට මුහුණ දීම සඳහා අදාළ වෙනස්කම් සිදු කරමින් අවශ්‍ය ව්‍යාපාරික පරිසරය නිර්මාණය කිරීම ඔහුට පැවරුණු අමතර වගකීම් අතර වේ.



## වී.එන්. වීරසූරිය මහතා

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී- මූල්‍ය**

වීරසූරිය මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියක් ලබා ඇති අතර එම විශ්ව විද්‍යාලයේම පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනයෙන් එම්බීඒ උපාධියක් ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ සාමාජිකයෙකි. CPA (ASA) හි ආශ්‍රිත සාමාජිකයෙක් වන අතර CMA (FCMA) හි අධි සාමාජිකයෙකි.

ඔහු සිය වෘත්තීය ජීවිතය ආරම්භ කර ඇත්තේ 1994 දී බී.ආර්.ද සිල්වා විගණන සමාගමේ විගණන ලිපිකරුවෙකු සහ බදු පරීක්ෂකවරයෙකු ලෙසයි. පසුව ඔහු මයික්‍රොසෙල්ස් ලිමිටඩ් හි ගණකාධිකාරීවරයෙකු ලෙසත්, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ මූල්‍ය කළමණාකරු ලෙසත්, තුඩාවේ බ්‍රදර්ස් හි කළමනාකරණ ගණකාධිකාරී ලෙසත්, වීකොම් ඉන්ටර්නැෂනල් හි සමූහ මූල්‍ය හා පරිපාලන කළමනාකරු ලෙසත්, එන්කාර් ට්‍රැරැවල්ස් ඇන්ඩ් ටුවර්ස් ලිමිටඩ් හි සමූහ මූල්‍ය කළමනාකරු ලෙස කටයුතු කළේය. ඔස්ට්‍රේලියාවේ මෙල්බර්න් හි ෆෙස් ෆ්‍රීස් පුද්ගලික සමාගමේ මූල්‍ය සහ පරිපාලන කළමනාකරු ලෙසත්,2017 ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට සම්බන්ධ වීමට පෙර හන්ටර් ඇන්ඩ් කම්පනි පීඑල්සී හි මූල්‍ය කළමනාකරු ලෙස කටයුතු කර තිබේ

ඔහු ගණකාධිකරණ හා මූල්‍ය සම්බන්ධ සියලු කටයුතු, භාණ්ඩාගාර කළමනාකරණය, බදු සහ රක්ෂණ, අයවැය සහ යෝජනා, රජයේ රෙගුලාසි හා වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව ගිණුම්කරණ සහ මූල්‍ය ප්‍රතිපත්ති කෙටුම්පත් කිරීම සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ක්‍රියාකාරකම් සඳහා විවිධ අනුමැතීන් ලබාගැනීම සිදු කරයි.



## එම්.ඒ.ඩී. මල්ලිකාරච්චි මහතා.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී**

**තාක්ෂණික සේවා සහ ආයතනික කටයුතු -වැඩ බලන**

මල්ලිකාරච්චි මහතා පේරාදෙනිය විශ්ව විද්‍යාලයෙන් ඉංජිනේරු (නිෂ්පාදන) උපාධියක් ලබා ඇති අතර ඇමරිකා එක්සත් ජනපදයේ ව්‍යාපෘති කළමනාකරණ ආයතනයේ සාමාජිකයෙක් මෙන්ම ශ්‍රී ලංකාවේ ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකි. එසේම ඔහු දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ප්‍රමුඛ පෙළේ කළමනාකරණ ,නායකත්වය සම්බන්ධ වෘත්තීමය සහ කාර්මික පහසුකම් පිළිබඳ පශ්චාත් උපාධි පුහුණු වැඩසටහන් රැසකට සහභාගී වී ඇත. ඔහු තෙල් සහ ගෑස් කර්මාන්තයට අදාල ගුවන් ඉන්ධන මෙහෙයුම් කළමනාකරණය, ගුවන් ඉන්ධන තත්ත්ව සහතික පාලනය, අක්වෙරළ තෙල් ගබඩා උප නල මාර්ග ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා අවශ්‍ය තත්ත්ව පරීක්ෂාව, ගුවන් යානා ඉන්ධන නිෂ්පාදනාගාර සහ ඉන්ධන නල පද්ධති වලට අදාල ව්‍යාපෘති කළමනාකරණය සහ කොන්ත්‍රාත් පරිපාලනය, ඉංජිනේරුමය තහවුරු කිරීම් සහ ක්‍රියාවලි සැලසුම් කිරීම සහ දැනුවත් කිරීම් පිළිබඳ වසර 20කට අධික අත්දැකීම් ලබා තිබේ. 1996 ජිනසේන සමූහයේ ඉංජිනේරුවෙකු ලෙස සිය වෘත්තීය ජිවිතය ආරම්භ කළ අතර පසුව ඉන්ට්‍රිබැච් පෝසිලේන් පුද්ගලික සමාග මේ සහකාර යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකු ලෙස සේවය කළේය.1999 දී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකු ලෙස බැඳුණු ඔහු කොලොන්නාව පර්යන්තයට අනුයුක්ත කරන ලදී. පසුව ඔහු ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකු (ගුවන් යානා සඳහා ඉන්ධන ලබාදීමේ පර්යන්ත) ව්‍යෘපෘති ඉන්ජිනේරුවරයෙකු (ඉන්ධන හයිඩ්‍රන්ට් පද්ධති) වශයෙන් ද ලංකා ඛනිජ තෙල් සංස්ථාවට අයත් බන්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල අංගනයේ නියෝජ්‍ය කලමනාකරු (ගුවන් මෙහෙයුම්) ලෙස සේවය කර තිබේ.ගුවන් ඉන්ධන නිෂ්පාදනාගාර ව්‍යපෘති කළමනාකරු,ගුවන් මෙහෙයුම් කලමනාකරු ලෙස සේවය කළ ඔහු අවසන් වශයෙන් 2017 සිට තාක්ෂණික සේවා සහ ආයතනික කටයුතු සඳහා වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයා ලෙස සේවය කරයි



### ඩී.එම්.පී. දිසානායක මහතා
**නියෝජ්‍ය පිරිපහදු කළමනාකර (නඩත්තු සහ ව්‍යාපෘති)**

දිසානායක මහතා යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධියක් ලබා ඇති අතර වරලත් ඉංජිනේරුවරයෙකු සහ ශ්‍රී ලංකාවේ ඉංජිනේරු ආයතනයේ සාමාජිකයෙකි.
ඔහු නීතිවේදී උපාධියක් ලබා ඇති අතර නීතිඥවරයෙකි.

ඔහු 1988 වසරේ දී යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකු ලෙස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පිරිපහදු අංශයට සම්බන්ධ වූයේ ය.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ දශක තුනක දීර්ඝ සේවා කාලය තුළ ඔහු නියෝජ්‍ය ඉංජිනේරු කළමණාකරු, ඉංජිනේරු කළමනාකරු (යාන්ත්‍රික), ජ්‍යෙෂ්ඨ ඉන්ජිනේරු කළමනාකරු (නඩත්තු සහ ව්‍යාපෘති) යන තනතුරු ද අවසාන වශයෙන් 2016 සිට නියෝජ්‍ය පිරිපහදු කළමණාකරු (නඩත්තු සහ ව්‍යාපෘති ) වශයෙන් කටයුතු කරයි.



### එල්.ජී. එම්. ආර්. පෙරේරා මහතා
**නියෝජ්‍ය පිරිපහදු කළමනාකරු (විදුලි සහ උපකරණ)**

පෙරේරා මහතා මොරටුව විශ්ව විද්‍යාලයෙන් ඉලෙක්ට්‍රොනික සහ විදුලි සංදේශ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා ඇත. ඔහු 1992 දී ලංකා ඛනිජ තේල් නීතිගත සංස්ථාවේ පිරිපහදු උපකරණ ඉංජිනේරුවරයෙකු ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළේය.

මෙහෙයුම් පාලන උපකරණ ක්ෂේත්‍රයේ වසර 25 කට වැඩි පළපුරුද්දක් ඇති ඔහු උපකරණ ක්ෂේත්‍රයේ විවිධ තනතුරු හෙබවා තිබේ. වර්ථමානයේ නියෝජ්‍ය පිරිපහදු කළමණාකරු (විදුලි හා උපකරණ) තනතුරේ සිටින ඔහු පිරිපහදුවේ විදුලි, උපකරණ හා අමුද්‍රව්‍ය අංශවල ප්‍රධානියා ලෙස කටයුතු කරයි.



### සී.ආර්. කේ. ගමගේ මහතා.
**නියෝජ්‍ය පිරිපහදු කළමණාකරු (තාක්ෂණික සහ උපකරණ)**

ගමගේ මහතා මොරටුව විශ්ව විද්‍යාලයෙන් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා ඇති වරලත් ඉංජිනේරුවරයෙකු වන අතර ශ්‍රී ලංකාවේ ඉංජිනේරු ආයතනයේ ආයතනික සාමාජිකයෙකි.

තවදුරටත් ඔහු UT,PT,DT,MT,RT,IR ( දෙවන පෙළ) සහතිකලත් කම්පන විශ්ලේෂක පියවර 1 සහතික ලබා ඇත්තේ ඇමරිකා එක්සත් ජනපදයේ මොබියස් ආයතනයෙන් සහ නන් ඩිස්ට්‍රක්ටිව් ටෙස්ටින්ග් සමාජයෙනි.

ඔහු 1993 වසරේ දී යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකු ලෙස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පිරිපහදු අංශයෙන් තාක්ෂණික ඉංජිනේරුවරයෙකු ලෙස සිය වෘත්තීය ජීවීතය ආරම්භ කළේය.

පිරිපහදුවේ නඩත්තු, පරීක්ෂාව සහ තාක්ෂණික සේවා වැනි ඉංජිනේරු ක්ෂේත්‍රයේ ව්‍යාපෘති පිළිබඳ වසර 26 කට වැඩි පළපුරුද්දක් ඔහු සතුය. 2018 ඔක්තෝබර් වැඩබලන නියෝජ්‍ය කළමනාකරු තනතුරට පත්වීමට පෙර නියෝජ්‍ය ඉංජිනේරු කළමනාකරු (පරීක්ෂණ) සහ ඉංජිනේරු කළමනාකරු (පරීක්ෂණ) යන තනතුරු දැරීය. මේ වන විට ඔහු පරීක්ෂණ කටයුතු, රසායනාගාර සහ තාක්ෂනික සේවා අංශය මූලික කරගෙන තාක්ෂණික සේවා අංශයේ ප්‍රධානියා ලෙස කටයුතු කරයි.

# ජ්‍යෙෂ්ඨ කළමණාකරණ කණ්ඩායම



**එම්. සී. ඩී. පෙරේරා මෙනෙවිය**
ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මූල්‍ය)



**කේ. ඩබ්ලිව්. එස්. පුෂ්පලාල් මහතා**
කළමනාකරු (මානව සම්පත්)



**ආර්. ඒ. කේ. සී. ආරියරත්න මිය**
ප්‍රධාන නීති නිලධාරි



**ඩබ්ලිව්. ඩී. එල්. සී. අබේගුණවර්ධන මහතා**
කළමනාකරු (අලෙවි) (වැඩ බලන)



**ඩබ්ලිව්. කේ. එස්. ගුණවර්ධන මහතා**
කළමනාකරු (පර්යේෂණ හා සංවර්ධන



**එස්. ඩී. එස්. රාජපක්ෂ මහතා**
කළමනාකරු (ප්‍රසම්පාදන හා ගබඩා)



**මේජර්. එම්. ආර්. එස්. පී. සමරසිංහ මහතා**
කළමනාකරු
(ආරක්ෂක සහ විමර්ශන)



**ජී. පී. කේ. විජේකෝන් මහතා**
කළමනාකරු (ඉංජිනේරු හා පරීශ්‍ර)



**එම්. එස්. ආර්. ප්‍රනාන්දු මිය**
කළමනාකරු (තොරතුරු තාක්ෂණ)



**ආර්. ඒ. ටී. අයි. රණසිංහ මහතා**
කළමනාකරු (විගණන)



**පී. ඒ. යූ. ආර්. කරුණාරත්න මහතා**
කළමනාකරු (නැව්ගත කිරීම්)



**කේ. කේ. ඒ. ජයවික්‍රම මහතා**
කළමනාකරු (වාණිජ) (වැඩ බලන)



**බී. එස්. එස්. පෙරේරා මහතා**
කළමනාකරු (කෘෂි රසායන)



**එන්. බී. එම්. පී. ජීවසිරි මහතා**
කළමනාකරු
(මෙහෙයුම් - තොග හා පර්යන්ත
මෙහෙයුම්) (වැඩ බලන)



**ආර්. ඩබ්ලිව්. එස්. එම්. රාජසිංහ මහතා**
නියෝජ්‍ය කළමනාකරු
(ගුවන් සේවා - මෙහෙයුම්)



**කේ. ජී. එච්. කෝදාගොඩ මහතා**
කළමනාකරු (පිරිපහදු මෙහෙයුම්)



**ජී. එම්. යූ. ඩබ්ලිව්. දොළොස්වල මහතා**
කළමනාකරු
(ලිහිසි තෙල් හා විශේෂ නිෂ්පාදන)



**ආර්. ඒ. එස්. රාජපක්ෂ මහතා**
කළමනාකරු (ද්‍රව්‍ය)



**කේ. ඒ. කේ. කේ. කුරුප්පු මහතා**
කළමනාකරු (ඉංජිනේරු - ව්‍යාපෘති)



**කේ. වී. ජේ. චන්ද්‍රවංශ මහතා**
කළමනාකරු
(ඉංජිනේරු - විදුලි)



**ඩබ්ලිව්. ඒ. එන්. ආර්. වික්‍රමසිංහ මහතා**
කළමනාකරු (තාක්ෂණික සේවා)



**ඒ. අයි. වන්සේකර මහතා**
නියෝජ්‍ය කළමනාකරු
(ST - මෙහෙයුම්)



**එස්. ප්‍රේමකාන්ති මිය**
කළමනාකරු
(ආර්ථික හා උපලේඛනගත කිරීම)



**එච්. කේ. එන්. රත්නසිරි මහතා**
නියෝජ්‍ය කළමනාකරු (තාක්ෂණික සේවා - රසායනාගාරය)



**ආර්. එම්. එම්. ඩබ්. බන්ඩාර මහතා**
නියෝජ්‍ය කළමනාකරු (ගිනි හා ආරක්ෂාව)



**සී. එන්. විතානාරච්චි මිය**
ජ්‍යෙෂ්ඨ වෛද්‍ය නිලධාරී



**ඒ. බී. කෝරලගෙදර මහතා**
කළමනාකරු (වැඩබලන ලේකම්)



**පී. එෆ්. ඩබ්ලිව්. දයානාත් මහතා**
කළමනාකරු (ඉංජිනේරු - සිවිල්)



**ආර්. ඒ. බී. තිලන්ග මහතා**
කළමනාකරු (ඉංජිනේරු - යාන්ත්‍රික)



**ඩබ්ලිව්. එස්. රේබල් මහතා**
කළමනාකරු (ඉංජිනේරු - උපකරණ)

# ආයතනික ව්‍යුහය


Chairman
Managing Director
Refinery Manager
DRM
(Elec. & Ins.)
DRM
(Maint. & Pro.)
DRM
(Tech. Ser.)
DRM
(Manu. & Ops.)
Dy. Ops.Mgr.(Sapu.Ter.)
Snr Med. Offi.
Mgr. Materials
Mgr. Electrical
Mgr. Instrumentals
Mgr. Civil
Mgr. Projects
Mgr. Mechanical
Mgr. Inspec.
Mgr. TS
Mgr. Lab
Mgr. Eco & sche
Mgr. Ops
D. Mgr. Fire & Safety



DGM (A / HR)
DGM (F)
DGM (TS&CA)
DGM (MKT)
DGM (C & SC)
CLO
CIA
Mgr. Security& Inves.
Head of Secretary
xMgr. HR
Snr. Mgr.(F)
Mgr. IT
Mgr. (Eng. & Premises)
Operations Mgr. (AV)
Manager (R&D)
Mgr. (OP)
MKT Mgr.
Head of CC & CCU
Marketing Mgr. (Lubs & SP)
Mgr. Agro
Mgr. Shipping
Commercial Mgr.
Mgr . Supplies
Mgr (Legal)
Mgr (Internal Audit)

# අපගේ ව්‍යාපාරය



ලිහිසි තෙල්

46
නිෂ්පාදන
වර්ග

**1,583**
රු. මි



ප්‍රවාහන
අංශය සඳහා
ඉන්ධන

පෙට්‍රල් 92
පෙට්‍රල් 95
ඔටෝ ඩීසල්
සුපර් ඩීසල්

**412,716**
රු. මි



විදුලිබල නිෂ්පාදන
අංශය

දැවි තෙල්
ඩීසල්
නැප්තා

**74,757**
රු. මි



ගුවන් තෙල්

ජෙට් A 1
ඇව්ගෑස්

**64,190**
රු. මි



කාර්මික අංශය

දැවි තෙල්
ඩීසල්
සොල්වන්ට්
භූමිතෙල්

**11,011**
රු. මි

|  |  |  |  |  |
|---|---|---|---|---|
| ගෘහස්ථ ඉන්ධන | තාර | කෘෂි රසායන | නැව් තෙල් | අපනයන |
| භූමිතෙල් LPG | තාර බැරල් දුව තාර | විවිධ කෘෂි නිෂ්පාදන වර්ග | දැව් තෙල් | දැව් තෙල් නැප්තා |
| 17,688 රු. මි | 1,066 රු. මි | 151 රු. මි | 495 රු. මි | 8,595 රු. මි |





# කළමනාකරණ විමසුම

# කළමනාකරණ විමසුම

## මෙහෙයුම් සන්දර්භය සහ උපායමාර්ග

### ගෝලීය පරිසරය

ආසියානු ආර්ථිකයෙන් ඉහළටම යාමේ ප්‍රවණතාවයන් මත බලශක්ති ඉල්ලුමේ වර්ධනයක් දක්නට වූ අතර ලෝක බලශක්ති රාමුව පිරිසිදු පුනර්ජනනීය බලශක්ති කෙරෙහි යොමුවීමක් දක්නට ලැබිණි. එහි බලපෑම තුළ පොසිල ඉන්ධන කර්මාන්තය ශක්තිමත් වූ අතර නුදුරු අනාගතයේදී එය තවත් ශක්තිමත් වනු ඇතැයි බලාපොරොත්තවක් ඇතිවිය. එසේම ඛනිජ තෙල් මිලේ විචල්‍යතා කර්මාන්ත යුගයකින් තිරසාර යුගයක් කරා ඒමට ගෝලීය වශයෙන් ඇති වූ පෙළඹවීම වඩාත් අවධානයකට ලක්වූ කරුණකතක් විය.

**බොරතෙල් මිල** (FOB) - USD / BBL




2018 වසරේදී අන්තර්ජාතිකව බොරතෙල් මිල සැලකියුතු අයුරින් ඉහළ ගිය අතර මිලෙහි කඩාවැටීම සිදු වූයේ වසරේ අවසන් මාස දෙක තුළය. ඉරානයේ තෙල් සැපයීම පිළිබඳව ඇමරිකානු සම්බාධක 2018 වසරේ අගෝස්තු ඔක්තෝබර් කාලය තුළ තෙල් මිලේ වර්ධනය වෙනසක් කිරීමට හේතුවිය. වාර්තාගත අයුරින් ගෝලීය ඉන්ධන ගබඩාකර තබාගැනීම හා එක්සත් ජනපදය විසින් ඉන්ධන නිෂ්පාදනය වැඩි කිරීම යන කරුණු දෙක මන්දගාමී ආර්ථික වර්ධන වේගයක් හමුවේ, 2018 වසරේ අවසාන කාලය ඉන්ධන මිලට දැඩි බලපෑමක් එල්ල කරන ලදි. ඒ අනුව 2018 වසරේදී බොරතෙල් බැරලයක සාමාන්‍ය අගය ඇමරිකානු ඩොලර් 71.76ක් ලෙස සටහන් විය.

2017 වසරේදී එය ඇමරිකානු ඩොලර් 54.76ක් විය. මේ තත්ත්වය තුළ සංස්ථාව නව සංවර්ධන අවස්ථාවන් සොයා ගියද උඩුගම් බලා දිවෙන ඉන්ධන කර්මාන්තයට  වඩාත් සැලකිලිමත් වීමට සිදුවිය.

## ජාත්‍යන්තර ඉන්ධන මිල - USD/BBL




## දේශීය හැසිරීම

මහබැංකු වාර්තා වලට අනුව රටේ දළ දේශීය නිෂ්පාදනය 2018 වසරේදී 3.2 % ක් ලෙස සටහන් වූ අතර එය 3.4 % ක් වූ 2017 වසරේ සිට සංඛ්‍යාත්මකව පසුබැසීමකි. ඒ සමගම මහබැංකු වාර්තා කළේ සේවා අංශයන්හි 4.7 % ක වර්ධනයක් වූවා මෙන්ම කෘෂිකර්ම ක්ෂේත්‍ර 4.8% කින් වර්ධනය වූ බවයි. නමුත් ඉන්ධන ක්ෂේත්‍රය සැලකියයුතු මන්දගාමී බව නිසා ඉහත කී වර්ධනය අවශ්‍යතාවන්ගේ ප්‍රයෝජනයක් නොවිණි.ඒ අනුව කර්මාන්ත අංශයෙහි වෙනස 0.9 % ක් ලෙස පෙන්නුම් කළේය. ලංකාවේ ආර්ථිකය ඇමරිකානු ඩොලර් බිලියන 88.9ක් ලෙස සටහන් කළ අතර එය ඒක පුද්ගල ආදායමද ආමරිකානු ඩොලර් 4102ක් වූ පසුබෑමක් සහිත සංඛ්‍යාවකින් පෙන්නුම් කරන ලදි. අපනයන හැසිරීමේ වර්ධනය පරදා ආනයන වියදම් ඉහළයාමේ තත්ත්වයන් තුළ රටේ ඉතිහාසයේ පළමු වතාවට ඇමරිකානු ඩොලර් බිලියන 10ක් ඉක්මවා ගිය වෙළඳ හිගයක් මතු වූ අතර එය වාර්ථාගත තත්ත්වයක් විය.

ගෝලීය මූල්‍ය ප්‍රත්පත්ති සාමාන්‍යකරණය විශේෂයෙන්ම ඇමරිකාව තුළ එය සිදුවීමට ගෝලීය මූල්‍ය තත්ත්වයන් සිරකර තැබීමට හේතු විය. ඒ නිසාම වර්ධනය වීමට තිබූ ආර්ථිකයෙන් ප්‍රාග්ධනය යෙදවීම පාලනය කිරීමට මෙන්ම විනිමය අනුපාතයන්හි දැඩි බලපෑමක්ද ඇති විය. මේ අතරතුර මහබැංකුව රුපියලේ අවප්‍රමාණය සමගාමීව මන්දගාමී වෙළඳපොල කේන්ද්‍ර කොටගත් පොලී අනපාතය පවත්වාගෙන යන ලදි.

නමුත් එම මෙහොතේම වෙළඳපොල තුළ අසාමාන්‍ය විචල්‍යයක් ඇතිවීමට විශාල ලෙස ප්‍රාග්ධන අඩුවීම් දක්නට ලැබීම සහ සැක සහිත තත්ත්වයකදී එම තත්ත්වයන් වෙනස් කිරීමට අවශ්‍ය පියවර ගනිමින් තිබුණි. ආහාර අංශයේ මිල වෙනස්වීම් මත උද්දමන අගයන් ඉතා විශාල වශයෙන් ඉහළ නැග ගිය අතර වසර පුරා පැවති යහපත් කාලගුණික තත්ත්වයන් යටතේ මිල ගණන් පහත ගිය බව සඳහන් කළ යුතුවේ.

එසේම 2018 වසරේදී රජයේ ආදායම දළ දේශීය නිස්පාදනයෙන් 13.3% ක් ලෙස පහත ගිය අතර රාජ්‍ය වියදම් මෙන්ම ණයදීමේ අඩුවක් දක්නට ලැබිණි. විශේෂයෙන්ම රටේ පැවති දේශපාලනීය විචලනය බව නිසාද මහජන අපේක්ෂාවන් පහළ ගිය අතර අයවැය මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමට ඒ හරහා ප්‍රමාදයක් ඇතිවුණි. ආර්ථික කටයුතු කඩාවැටීම කෙරෙහි අඩුකරන ලද ප්‍රාග්ධන වියදම් එක් හේතුවකි. මේ අතර මහබැංකුව තැනපතු පොලී අනුපාතය ඒකක 75කින් වැඩිකළ අතර ස්ථාවර තැම්පතු සඳහා ඒකක 50කින් අඩුකළ අතර මෙම තත්ත්වය නිසා පොලී තැන්පතු හා ණය අනුපාතයන් ඒකක සියයකින් අඩුකිරීමක් විය. ඒ අනුව 2018 වසරේදී SDFR & SLFR අගයන් 8%ක් සහ 9%ක් ලෙස සටහන් විය. කෙසේ වෙතත් ආදායමේ අඩුවීම නොසලකා 2018 වසරේදී මූල්‍ය මෙහෙයුම් ඉහළ මූලික අතිරික්තයක් මෙන්ම ඉතා අඩු ආදායම් හිගයක් පෙන්නුම් කරන ලදි.

## ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් මිල ගණන්

මෙරටේ සර්ව ආර්ථික ස්ථායිතාවයට මෙන්ම ජීවන වියදම සහ නිෂ්පාදන වියදම සැලකිල්ලට ගැනීමේදී ඉන්ධන මිල ප්‍රතිසංශෝධනය දීර්ඝ කාලීන ප්‍රතිපත්තිමය අවශ්‍යතාවක් විය. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව උපාය මාර්ගික ඉතා වැදගත් රාජ්‍ය ව්‍යාපාර ආයතනයක් ලෙස රටේ සමස්ත සිල්ලර ඉන්ධන අවශ්‍යතාවයෙන් 86%ක් සම්පූර්ණ කරන අතර රටේ ඛනිජ තෙල් ක්ෂේත්‍රයේ දැවැන්තයා විය. ශ්‍රී ලංකාව ඉතා විශාල වශයෙන් රටේ මූලික සහ ද්විතියික බල ශක්ති අවශ්‍යතාවන් හිදි ආනයනික ඛනිජ තෙල් මත රඳා පවතී. තවද ඉන්ධන ආනයනය කරන රටක් ලෙස ශ්‍රී ලංකාව ආනයකින වෙළෙඳ පොලේ මිල මත මිලදී ගැනීම් සිදුකරයි. ඉන්ධන නිෂ්පාදන ක්‍රියාවලියට මේ කෙරෙන නිෂ්පාදන වියදම මත ජීවන වියදමට ඉන්ධන මිල වියදම පියවීම සැමවිටම දේශපාලනිකව සම්බන්ධ වන කරුණක් බවට පත් වී ඇත. පසුගිය දශකයේදී ගෝලීයව ඉතා විශාල ලෙස ඉන්ධන මිල ඉහළ පහළයාම් වලට ගොදුරු විය. මහජනතාව ඇතුලුව ඉන්ධන කර්මාන්තයේ සියලු පාර්ශවයන්ට ප්‍රමාණවත් පරිදි සහ සාධාරණයක් ඉටු කරනු වස් පසුගිය මැයි මාසයේ පෙට්‍රල් සහ ඩීසල් සඳහා හඳුන්වාදුන් මිල සූත්‍රය රජය විසින් ගන්නා ලද ප්‍රධාන පියවරකි. ඒ අනුව මිල නියම කිරීමේදී ඉන්ධන පිරිවැය, රක්ෂණය, නාවික ගාස්තු, ආනයන ගාස්තු , ගබඩා ගාස්තු, තොග බෙදාහැරීම් ගාස්තු, ප්‍රවාහන ගාස්තු, බදු, හා මානව සම්පත් සඳහා වන වියදම් සලකා බැලේ. කෙසේ වෙතත් මිල සූත්‍රය සංස්ථාවේ මූල්‍ය වියදම් හෝ විනිමය අනුපාතයන් වෙනස් වීමට මෙන්ම පර්යන්ත ගාස්තු දරාගැනීමට තරම් ප්‍රමාණවත් නොවීය.

## ඉන්ධන සහනාධාර මිල ගණන්

මහජනතාව වෙත ලබාදෙනු ලබන සහනාධාරය අදාළ නිෂ්පාදනයේ සම්පූර්ණ වියදම, මිල සහ විකිණීමට නිර්දේශිත මිල අතර වෙනස සලකා බලා තීරණය කෙරේ. වියදම් දර්ශක මිල යනු සැපයුම් ගාස්තු, ප්‍රවාහන ගාස්තු,බදු,ලාභාංශ ද ඇතුලු සියලු නිමැවුම් මිල වේ.

2018 වසරේදී භූමිතෙල් සඳහා වැඩිම සහනාදාරය ලබා දී ඇති අතර එය රුපියල් මිලියන 14735ක් වේ. ඩීසල් සහ භූමිතෙල් අතර විශාල මිල වෙනසක් ඇති විට භූමිතෙල් සහනාධාරය රට තුළ විශාල වශයෙන් අවභාවිතා කරනු දක්නට ලැබිණ. මිල සූත්‍රය සැකසීමට පෙර විකුණුම් ආදායම සහ සැපයුම් වියදම අතර වෙනස මත සලකා සහනාධාර සැලසීම සිදුකෙරේ.

ඉන්ධන සඳහා නිර්දේශිත මිල එහි සත්‍ය වියදම් මිලට වඩා අඩු වුවද ඒ සඳහා විදිමත් වූ අයවැය හරහා කිසිදු මූල්‍ය වෙන් කිරීමක් නොමැත. ඒ අනුව පසුගිය අවුරුදු කීපය තුළදීම සංස්ථාවට මූල්‍යමය පාඩු වලට ලක්වන්නට සිදුවී ඇත්තේ එම සහනාදාර මිල නිසාවෙනි. එසේම බැංකු ණය හරහා පාඩු පියවා ගැනීම හේතුවෙන්

| නිෂ්පාදන | ලීටරයකට පාඩුව (රු.) | මුළු පාඩුව (රු. මිලියන) |
|---|---|---|
| භූමිතෙල් | (56.86) | (14,735) |

සහ ණය ගෙවීමේ අවශ්‍යතාවන්ට ද මුහුණ දෙන්නට සිදුවිය. සංස්ථාවේ විශාල ණය ගැනීම් රාජ්‍ය බැංකුවල ශේෂ පත්‍රයන්ට බලපෑම් කරන අතර ණය වර්ධනය වූ බව පෙනේ. එමනිසා මහබැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති මෙහෙයුම් සංකීර්ණතාවයකට හේතුවේ. සංස්ථාවේ ණය ගැනීම් වලදී රජයට ඇප තබන්නට සිදුවීමේ රජයේ වගකීම් නිරන්තර වර්ධනය වේ.

## ලාභ සඳහා බලපෑ ප්‍රධාන කරුණු.

වසර තුළ දී ඛනිජ තෙල් ප්‍රමාණාත්මක ඉල්ලුම එකම තත්ත්වයේ පැවතුනද 14.61%ක් හෙවත් දළ වශයෙන් රුපියල් බිලියන 75කින් ආදායම ඉහළ යන්නේ ප්‍රවාහන, ගුවන් තෙල්, ආනයනික හා ගෘහස්ථ අංශයන් හරහාය. 2017 වසරට සාපේක්ෂව බලශක්ති ක්ෂේත්‍රයේ ඉල්ලුම 33.65%කින් පහළ යන අතර 2017 වසරේදී ඇරිකානු ඩොලර් 54.89ක් වූ බොරතෙල් බැරලයේ මිල 2018 වසරේදී ඇමරිකානු ඩොලර් 72.02 ක් දක්වා ඉහළ යයි. තවද 2017 වසරේදී ඇමරිකානු ඩොලරයට ගෙවන ලද රුපියල් 155.41 ක් වූ විනිමය වටිනාකම 2018 වසරේදී 164.10 ක් දක්වා සාමාන්‍ය වාර්ෂික වර්ධනයක් දක්නට ලැබිණි. සැලකියයුතු ලෙස ඉහළ ගිය ඛනිජ තෙල් නිෂ්පාදනයේහි ආනයනික වියදම මෙන්ම විනිමය අනුපාතය පහත යාම ද ඉතා විශාල ලෙස සංස්ථාවේ ලාභය අඩු කිරීමට හේතු වූ අතර අවසාන ප්‍රතිඵලය වූයේ සංස්ථාව ලාභ නොලබන තත්ත්වයකට පත්වීමයි. සමාගමේ ලාභ තත්ත්වයට බලපෑම් කළ කරුණු පහත විස්තර කෙරේ.

## ඉන්ධන සහනාධාර

රජය විසින් මිල පාලනය කරන නිෂ්පාදන ලෙස ඛනිජ තෙල් නිෂ්පාදනය සැලකේ. එයට හේතුව වූයේ මෙම නිෂ්පාදන මහජනතාවට අත්‍යවශ්‍යවීම මෙන්ම ඒවායේ මිල පැහැදිලිවම ජීවන වියදම කෙරෙහි බලපෑමයි. ජනතාවට ලබාදුන් මෙම සහනාධාර පරස්පර වශයෙන් සංස්ථාවේ ලාභ වලට බලපෑ අතර සංස්ථාව සහ එහි ලාභ ලැබීමේ අරමුණ, සමස්ත ජාතියේම සමාජ අවශ්‍යතාවයක කොටසක් ලෙස කැපකෙරේ. ධීවර කටයුතුවල නියැලෙන ජනතාවට සහ අඩු ආදායම් ලාභී නිවාස හිමියන් වෙනුවෙන් භූමිතෙල් ඉතා ඉහළ සහනාධාරයක් යටතේ ලබාදෙනු ලැබිණ. එසේම මෙහි සඳහන් කළ යුතු ඉතා වැදගත් කරුණක් නම් එම සහනාධාරය ප්‍රවාහන ක්ෂේත්‍රයේදී අවභාවිතාවට ලක් වූ බවයි. නීත්‍යානුකූල නොවන ලෙස භූමිතෙල් භාවිතා කරනු ලැබ තිබූ අතර 2017 වසරට සාපේක්ෂව භූමිතෙල් ඉල්ලුම 30.8% ක් ලෙස වැඩිවී තිබුණ

| අභියෝග | ඇගයීම් | ජයගැනීමට ගතයුතු උපාය මාර්ග |
|---|---|---|
| ඛනිජ තෙල් නිෂ්පාදන සහන මිල යටතේ අලෙවිය. | සහනදායී මිල ගණන් හේතුවෙන් සංස්ථාවේ ආදායමට, ලාභ වලට ,මුදල් සංසරණයට සෘණාත්මක බලපෑමක් ඇති විය.<br><br>සංස්ථාව තුළ මුදල් හිඟ වූ විට සහ සංස්ථාවේ ලාභදායීත්වයට බලපෑම් හරහා පොලී සහිත ණය ලබාගැනීමට සිදු වේ. | ■ රජය විසින් වියදමට අනුකූල මිල ගණන් භූමි තෙල් සඳහා ඉදිරිපත් කිරීම<br><br>■ 1971 අංක 38 දරණ පනතේ 17 වන කොටසට අනුව සහනාධාර හිමිකම් ලැබීම පිළිබඳව රජය සමග සාකච්ජා කිරීම<br><br>■ වියදම් පාලනය කිරීම සඳහා උපාය මාර්ග අනුගමනය කිරීම |

## සංස්ථාව ගෝලීය වෙළඳපොලේ මිල ගැණුකරුවකුවීම

ශ්‍රී ලංකාව තුළ ඛනිජ සම්පත් නොමැතිවීමේ හේතුව මත සියලු ඛනිජ තෙල් නිෂ්පාදන ගෝලීය වෙළඳපොලේ මිල ගණන් යටතේ මිල දී ගැනීමට සිදුවේ. අනෙක් අතට මිල ගණන් අඩුවන කාලසීමා වලදී වැඩිපුර මිලදී ගෙන ගබඩා කර ගැනීමේ පහසුකම් ලංකාව සතුව නැත .මෙම කරුණු දෙක මත ලංකාවට ගෝලීය වෙළඳපොලේ මිල වෙනස්කම් මත මිල දී ගැනීමට සිදුවේ. අබුඩාබි වෙළපොලේ බොරතෙල් බැරලයක මිල 31%කින් ඉහළ යන්නේ 2017 වසරේ පැවති මිල වූ ඇමරිකන් ඩොලර් 54.89 සිට 72.02 දක්වා 2018 වසරේ එය ඉහළ නැග තිබේ. මෙය විකුණුම් වියදම් සඳහා ඉතා අදිසි බලපෑමක් එල්ල කළේය. ඉහත තත්ත්වය යටතේ වුවද පෙට්‍රල් සුපර් ඩීසල් සහ භූමිතෙල් වලට ඉල්ලුම වසර පුරාවට වර්ධනය විය. වාර්තාගත අයුරින් ගෝලීයව තොග ගොඩ නැංවීම, ඇමරිකාව තුළ බොරතෙල් නිෂ්පාදනය, ගෝලීය ආර්ථික වර්ධන අඩු වේගයක් ගැනීම යන කරුණු මත 2018 වසරේ අගභාගයේදී ඉන්ධන මිලට දැඩි බලපෑමක් එල්ල විය.

| අභියෝගය | ඇගයීම් | ජයගැනීමට ගත යුතු උපාය මාර්ග |
|---|---|---|
| වෙළඳපොල මිල ගණන් යටතේ මිලදී ගැනීමට සිදුවීම | ඉතා ඉහළ මිල ගණන් විසින් ලාබ සීමාවන්ට අවපීඩනයක් ඇති කරයි | ■ ගෝලීය වෙළඳපොලේ මිල ගණන් පහළ යන අවස්ථාවලදී ඛනිජ තෙල් නිෂ්පාදන මිලදී ගෙන ගබඩා කර ගැනීම සඳහා අවශ්‍ය සැපයුම් සලසා ගත යුතුය |

## රුපියල අවප්‍රමාණ වීම

ඩොලරයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණයට ලක්වීම රුපියල් මිලියන 82,717 ක සෘණාත්මක බලපෑම සංස්ථාවට රුපියල් බිලියන 105.02 අලාභයක් සටහන් කරමිනි.එය සිදුවූයේ 2017 වසරේදී සංස්ථාවට රුපියල් බිලියන 2.82 ක ලාභ ලබන තත්ත්වයක් සිටය.

විදේශීය ණය පියවීම සඳහා අවශ්‍ය තරම් ඩොලර් වෙළඳපළ සතුව නැතැයි යන මතය මෙන්ම සංස්ථාව විසින් ණය ගතයුත්තේ රාජ්‍ය බැංකු වලින් පමණක් යන මතයද අනෙක් බැංකු විසින් දෙන ලද තරගකාරී මිල ගණන් හා සැසඳීමට පහසු කටයුත්තක් නොවුණි.

## සාමාන්‍ය විනිමය අනුපාතය : රු/. ඩො




| අභියෝගය | ඇගයීම | ගතයුතු ක්‍රියාමාර්ග |
|---|---|---|
| රුපියල අවප්‍රමාණය වීම | මුදල් හුවමාරුවට මෙන්ම ලාභදායිත්වය කෙරෙහි රුපියලේ අවප්‍රමාණය වීම සෘණාත්මක බලපෑමක් ඇති කරයි<br><br>තරගකාරී මිල ගණන් යටතේ ඇමරිකානු ඩොලරය මිල දී ගැනීමට ඇති නොහැකියාව අලාභය වර්ධනය කරයි | ■ සියලු වානිජ බැංකු සමග සාකච්ඡා කර සංස්ථාව තරගකාරී මිල ගණන් යටතේ ඩොලර් මිල දී ගැනීමට හැකියාවක් ලබාදිය යුතුය<br><br>■ ඇමරිකානු ඩොලර් ණය රුපියල් ණය බවට පත්කිරීමට රජයේ මැදිහත්වීම |

## තෙල් පිරිපහදු ගබඩා හිඟය

ප්‍රමාණවත් තරම් බොරතෙල් පිරිපහදු ගබඩා පහසුකම් නොමැතිවීම, එකිනෙකට වෙනස් බොරතෙල් වලින් නිමවන ලද නිෂ්පාදන එකම ටැංකි වල ගබඩා කළ නොහැකිවීම යනාදිය මෙයට හේතු විය.සංස්ථාව විසින් ගබඩා පහසුකම් පුළුල් කිරීම හා සංස්ථාවේ පිරිපහදු ධාරිතාවයන් වැඩි කිරීමට මූල්‍යමය බාධාවන් පවතින අතර ලෝක වෙළඳපොලේ මිල ගණන් පහල යන විට මිල දී ගැනීමේ හැකියාවන් සංස්ථාවට නොමැති වීම මීට බලපෑ ප්‍රධාන කාරණය විය.

## අතිරික්ත නිෂ්පාදන අපනයන කිරීම නිසා වන අලාභය

| නිෂ්පාදන | ලීටරයකට පාඩුව (රු.) | මුළු පාඩුව (රු. මිලියන) |
|---|---|---|
| දැවි තෙල් | (11.26) | (317) |
| නැප්තා | (7.60) | (747) |

| අභියෝගය | ඇගයීම් | ගතයුතු පියවර |
|---|---|---|
| ගබඩා පහසුකම් හිගය | වියදම් රටාවට බලපෑම් ඇති කරයි<br><br>සංස්ථාවේ නිෂ්පාදන පාඩු ලබමින් අපනයනය කිරීමට සිදුවූයේ අවශ්‍ය තරම් ගබඩා පහසුකම් නොමැති වීම නිසාය ඉන්ධන පිරිපහදු ධාරිතාවයේ හිගය සහ ගබඩා පහසුකම් හිගය අපගේ ආදායමට බලපෑම් එල්ල කරයි. | ■ වෙළඳපොල ඉල්ලුමට සරිලන පරිදි බොරතෙල් සහ වෙනත් පිරිපහදු නිෂ්පාදන සඳහා අවශ්‍ය ගබඩා පහසුකම් වැඩි කළ යුතුය<br><br>■ ධාරිතාවය වැඩිකර ගනිමින් ඉහළ තත්ත්වයේ නිෂ්පාදන බිහිකරමින් පිරිපහදු මෙහෙයුම් තත්ත්වය වර්ධනය කළ යුතුය |

## ඩොලර් ණය පියවීමේ බාධාවන්

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව නිරන්තරයෙන්ම එහි ඩොල්ර් ණය මුදල් ගෙවීමට ඇති මුදල් නොමැති වීමේ අපහසුතාවයට මුහුණ දෙනුයේ රුපියල් වශයෙන් මුදල් තිබුණද එය වෙළඳපොල තුළ ඇති තරම් ඩොලර් සංසරණය නොවීමේ හේතුව මත විනිමය අනුපාතයේ වෙනස්වීමේ ගැලපුම පාලනය කිරීමට අපොහොසත් විය. මෙය සැහැල්ලුවෙන් ණය ගෙවා දැමීමේ හැකියාවට බාධා පමුණුවනු අතර සංස්ථාවේ මූල්‍ය තත්වයට බලපෑම් එල්ල කළ කරයි. වැඩිපුර පොලී ගෙවීම යනු සංස්ථාවේ සියලු සම්පත් කෙරෙහි සෘණාත්මක බලපෑම් එල්ල කරන්නට විය.

## සංවර්ධනය උදෙසා බල ගැන්වීම

| අභියෝගය | ඇගයීම් | ගතයුතු පියවර |
|---|---|---|
| ඩොලර් ණය පියවීම | නොගෙවූ ණය සංස්ථාවේ ලාභදායකත්වයට සහ මූල්‍ය වියදම් වලට මෙන්ම විනිමය පාඩු ද ඇති කළේය | ■ පොලී අනුපාතය අඩු කිරීමට බැංකු සමග සාකච්ජා කිරීම<br>■ ඵලදායී ලෙස භාන්ඩාගාර කළමනාකරණය කිරීම<br>■ ඩොලර් ණය රුපියල් ණය බවට පත් කිරීමට බැංකු සහ භාණ්ඩාගාරය සමග සාකච්ජා කිරීම<br>■ සංස්ථාවට වාසිදායක අයුරින් ඩොලර් ණය පියවීමට පහසුකම් ඉල්ලා සිටීම |

## අබලන් නල මාර්ග

කොළඹ වරායේ සිට තෙල් අංගනය දක්වා බනිජ තෙල් නිෂ්පාදන පොම්ප කෙරෙන නල මාර්ග සැලකියයුතු මට්ටමකට ගරාවැටී ඇත.

යම් යම් ස්ථානවල නීති විරෝධී පදිංචිවීම් සිදුවී ඇති අතර දේශපාලන කරුණු හේතුවෙන් ඔවුන් ඉවත් කිරීමට ඇති අපහසුතා නිසා අත්‍යවශ්‍ය කටයුතු පවා කරගත නොහැකි තත්තවයක් උදා වී ඇත. වසර ගණනාවක් තිස්සේ ප්‍රශ්ණ එකම තැන පවතින අතරේ ද සිදුවී ඇත්තේ ඉතා අඩු පීඩන තත්ත්වයන් යටතේ තවත් කාන්දුවීම් ඇති නොවන සේ වගබලා ගනිමින් ඉන්ධන පොම්ප කිරීමයි. මෙය තෙල් බෑමේ ක්‍රියාවලිය ප්‍රමාද කරන අතර වරායේ තදබදය අදික කරවන අතරම තෙල් බෑමේ පාලනය දිගුවීම මත සංස්ථාවට ගෙවීමට සිදුවන ප්‍රමාද ගාස්තු ඉහළ නැංවීමට සිදුවේ.

| අභියෝගය | ඇගයීම් | ගතයුතු පියවර |
|---|---|---|
| අබලන් වූ නල මාර්ග | නිෂ්පාදන මාරු කරන අවස්ථාවේ බනිජ තෙල් නිෂ්පාදනයේ කාන්දුවීම්.<br>ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ ප්‍රතිරූපයට හානි කරන අතරම ආනයන පිරිවැය වැඩි කිරීමෙන් ලාභදායිතාවයට අහිතකර ලෙස බලපායි. | ■ නල මාර්ග වැඩි දියුණු කිරීම සහ නඩත්තු කිරීම<br>■ නව නල මාර්ග ඉදිකිරීම |

# එක් එක් අංශයන්හි කාර්ය සාධනය

කළමනාකරණ කටුයුතු වල කාර්යක්ෂමතාව සලකා ලංකා ඛනිජ තෙල් නීති ගත සංස්ථාව එහි අංශයන් කොටස් කිහිපයකට බෙදා ඇති අතර වසරේ කාර්ය සාධනය මෙලෙස සාරාංශ කර දක්වනු ලැබේ.

| | විකුණුම් | ලාභදායිත්වය |
|---|---|---|
| | රු.මි | රු.මි |
| ප්‍රවාහනය | 412,716 | (96,042) |
| බලශක්ති උත්පාදනය | 74,757 | (10,669) |
| ගුවන් තෙල් | 64,189 | 3,841 |
| කර්මාන්ත | 13,661 | (75) |
| ගෘහස්ථ | 17,688 | (14,619) |
| කෘෂි | 151 | (19) |
| අපනයන සහ නැව්තෙල් සැපයීම | 9,090 | (1,132) |
| **එකතුව** | **592,253** | **(118,715)** |

## ප්‍රවාහන ක්ෂේත්‍රය

ප්‍රවාහන ක්ෂේත්‍රය 2018 වසරේදී සංස්ථාවට වැඩිම ආදායමක් ලෙස රු.බිලියන 413ක දායකත්වයක් ලබා දී ඇත. 2017 වසරට සාපේක්ෂව එය 20.9 % ක වර්ධනයකි.මහජනතාව විසින් පොදු ප්‍රවාහන සේවාව වෙනුවට පුද්ගලික වාහන භාවිතයට නැඹුරුවක් දැක්වීම මෙයට හේතුවයි.

ඒ අනුව 92 පෙට්‍රල්, සුපර් ඩීසල් සහ 95 පෙට්‍රල් සැලකියුයතු වර්ධනයක් පෙන්නුම් කරන ලදි. එහිදී සුපිරි ඩීසල් වලට සහ 95 පෙට්‍රල් වලට වැඩි ඉල්ලුමක් ලැබෙන සේ තත්ත්වයෙන් ඉහළ වාහන ආනයන කිරීම හේතුවෙහි. එසේම රජය විසින් අනිවාර්ය කරන ලද දුම් පරීක්ෂාව ද ඊට හේතු විය. මේ තත්ත්වය 2020 දක්වා පවතිනු ඇතැයි අපේක්ෂිතය.ප්‍රවාහන කරන වාහන හිමිකරුවන් විසින් (ලොරි, බස්) භූමිතෙල් අවභාවිතාවේ ඉහළ වර්ධනය හේතුවෙන් භූමිතෙල් වල ඉල්ලුම ඉහළ ගිය අතර එය සිල්ලර වෙළෙඳාමට මෙන්ම බෙදාහරින්නන් වෙත බලපෑම් එල්ල කළේය. එසේම රජය විසින් මිල සූත්‍රයක් හඳුන්වාදීම නිසා කිහිප විටකම වසර තුළ දී ඩීසල් සහ පෙට්‍රල් මිල වෙනස්කම් වලට භාජනය විය. නොවැම්බර් දක්වා සිදුවූ මිල ඉහළ යාම නිසා සමාගමේ ලාභයෙහි වර්ධනයක් දක්නට ලැබිණ.

| වෙනස් කළ දිනය | LP 95 | LP 92 | LAD | LSD |
|---|---|---|---|---|
| 22.01.2015 | 128 | 117 | 95 | 110 |
| 11.05.2018 | 148 | 137 | 109 | 119 |
| 11.07.2018 | 155 | 145 | 118 | 129 |
| 11.08.2018 | 157 | 145 | 118 | 130 |
| 11.09.2018 | 161 | 149 | 123 | 133 |
| 11.10.2018 | 169 | 155 | 123 | 141 |
| 02.11.2018 | 169 | 145 | 116 | 141 |
| 16.11.2018 | 164 | 140 | 111 | 136 |
| 01.12.2018 | 159 | 135 | 106 | 131 |
| 22.12.2018 | 149 | 125 | 101 | 121 |

වාර්ෂික සමාලෝචනයට යටත්ව වසර තුළ දී අලුත් පිරවුම් හල් 24ක් විවෘත කරන ලදි. එසේම 2017 සහ 2018 වසර වල නව ඉදිකිරීම් සඳහා ලබාදුන් ලිපි අනුව වැඩ සම්පූර්ණ කළ යුතු පිරවුම්හල් කිහිපයක් වෙයි. සංස්ථාව විශ්වාසය වන්නේ නව පිරවුම්හල් නිමවීමෙන් පසුව දැනට පවතින ඒවාට වඩා හොඳ සේවයන් සැපයිය හැකි පිරවුම්හල් බවට පත් වන බවයි. එසේම සංස්ථාවේ පිරවුම්හල් සහ සේවා ස්ථාන දියුණු කිරීමේ සහ පරිසර හිතකාමී පිරවුම්හල් ඇති කිරීමේ ප්‍රතිපත්තිය යටතේ

### ප්‍රවාහන අංශයේ පාඩුව (රු. මි)




වසරකට අඩුම වශයෙන් සංස්ථාවට අයත් පිරවුම් හල් 10 ක් නවීකරණය කෙරේ. ප්‍රවාහන ක්ෂේත්‍රයේ ඉල්ලුමට මෙන්ම මිල ඉහළයාමේ කාරණය නොසලකා හරිමින් සංස්ථාව රුපියල් බිලියන 96ක අලාභයක් දරන්නට සිදුවූයේ ඉන්ධන විකුණුම් මිල මගින් දැරූ වියදම පියවීමට අපොහොසත් වූ නිසාය. ඉන්ධන මිල සංශෝධනයේ දී අලුතින් හඳුන්වාදුන් මිල සූත්‍රය උපකාර වුවද එය මූල්‍ය පිරිවැය සහ විනිමය අනුපාතය වෙනස්වීමේ පාඩුව පියවීමට ප්‍රමාණවත් නොවීය.

## බලශක්ති අංශය

2018 වසර පුරා පැවති කාලගුණ තත්ත්වය හේතුවෙන් 2017 වසරට සාපේක්ෂව බලශක්ති ඉල්ලුම අඩු වූ අතර ඒ අනුව බලශක්ති ක්ෂේත්‍ර සඳහා ඉන්ධන මිලදී ගැනීම 31.5% කින් අඩුවිය. මේ තත්ත්වය සංස්ථාවේ දෙවෙනි ස්ථානයට ආදායම් ඉපයූ බලශක්ති ක්ෂේත්‍රය රුපියල් බිලියන 74.5 කට සීමා කළේය. 2017 වසරේ ආදායම වූ රුපියල් බිලියන 109.20 ක් වූ ප්‍රමාණයෙන් 31.54% අඩු

### බලශක්ති අංශයේ විකුණුම්



වීමක් පෙන්නුම් කරමිනි. 2017 වසරේදී රුපියල් බිලියන 37.7ක් වූ ඩීසල් ආදායමට 2018 වසරේදී රුපියල් බිලියන 20.53ක් වූ අතර එය රුපියල් බිලියන 6.6 ක ශුද්ධ අලාභයක් පෙන්නුම් කළේය. 800 වර්ගයේ දැවි තෙල් රුපියල් බිලියන  21 .65 ක ආදායමක් පෙනුම් කළ ද ශුද්ධ අලාභය රුපියල් බිලියන 0.87ක් ලෙස සටහන් විය. නැප්තා සහ දැවි තෙල් L/S අලෙවියෙන් පිළිවෙලින් රුපියල් බිලියන 7.44 ක් හා 17.5ක් ලැබීය. මෙහිදී සංස්ථාවට කිසිදු බාධාවකින් තොරව රටේ බලශතක්ති ඉල්ලුමට අවශ්‍ය සැපයුම ලබාදීමට හැකි වූ බව කිව යුතුය.

## ගුවන් යානා අංශය

පසුගිය වසරට සාපේක්ෂව ගුවන් යානා අංශය රුපියල් බිලියන 64.19ක ආදායමක් ඉපයූ අතර 48.9ක ප්‍රතිශතයක් සාපේක්ෂ ඉහළ රුපියල් බිලියන 3.8 ක ලාභයක් ද වාර්තා කලේය. වියදම් පරාවර්තික කරන මිල ක්‍රමය හඳුන්වාදීමත් සමග JET A-1 සහ AVGAS යන වර්ග දෙකේ මිල අන්තර්ජාතික මිලට සමගාමී කරන ලදි. එසේම 2017 වසරට සාපේක්ෂව ගුවන් යානා ඉන්ධන ඉල්ලුමේ ප්‍රමාණය 9.33% ඉහළ ගියේය. එසේම JET A-1 සඳහා දේශීය ගැනුම්කරුවන් මෙන්ම අන්තර්ජාතික ගැනුම්කරුවන් ගෙන් ද ලද සතුටුදායක ඉල්ලුමට කර්මාන්තයේ සරු කාලයක් සඳහා මගපෙන්වීය.

### ගුවන් තෙල් විකුණුම් සහ ලාභදායීතාවය




### ගුවන් තෙල් විකුණුම්




2018 වසරේ ජනවාරි මාසයේ දී  ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපොල ගුවන් තෙල් අංශය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි. එම කටුයුතු සම්පූර්ණ කිරීමෙන් පසු කටුනායක ගුවන් තොටුපොළ නවීනතම පහසුකම් වලින් සමන්විත ගුවන්තොටුපොළක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එසේම සංස්ථාව ගුවන් තොටුපොළ JET A-1  ගබඩා පහසුකම් මුතුරාජවෙල සිට ගුවන්තොටුපොළට අඩු වියදමින් ඉන්ධන සැපයීම සඳහා ශක්‍යතා වාර්තා සහ අධ්‍යන ක්‍රියාවලිය ආරම්භ කර ඇත. මෙම ව්‍යාපෘතිය මගින් වියදම් අඩු කිරීමට මෙන්ම ඊට සමගාමීව ඉන්ධන මිලේ අඩුවීමද බලාපොරොත්තු වේ.

## කර්මාන්ත අංශය

කර්මාන්ත අංශයේ ආදායම රුපියල් බිලියන 13.66 ක් ලෙස පෙන්නුම් කළ අතර එය පසුගිය වසරට වඩා 7.4ක වර්ධනයකි. 800 කාණ්ඩයේ දැවි තෙල් පමණක් රුපියල් මිලියන 8.8ක ආදායමක් ලබාදෙමින් ප්‍රධාන ආදායම් ඉපයීම බවට පත්විය.2017 වසරේ පාඩු ලැබූ තාර වෙළඳාම 2018 වසරේදී රුපියල් මිලියන 110ක ලාභයක් ඉපයීම් තත්ත්වයට පත්විය.වෙළෙඳපොල අත්පත් කරගැනීමේ අදහසින් සංස්ථාව ඒ වන විට ද්‍රව වශයෙන් තාර නිෂ්පාදනය අරඹා තිබිණි. දැවි තෙල් භාවිතා කරමින් පිරිපහදු

### කාර්මික අංශයේ විකුණුම් (රු. මි)




හරහා තොග වශයෙන් තාර නිෂ්පාදනය ප්‍රධාන වශයෙන් සිදු කෙරිණි. මේ හරහා සංස්ථාවේ වෙළඳපොල කොටස තරමක් දුරට සපුරාගන්නා ලදි. යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සඳහා ඉතා උසස් තත්ත්වයේ තාර අඩු මිලට ලබාදෙන්නට සංස්ථාව සමත්විය.

සැපයුම් ජාලයේ තිබූ ගැටලු කිහිපයක් නිසා 2017 වසරට සාපේක්ෂව ලිහිසි තෙල් විකුණුම් ආදායම 19.8% කින් පහළ බැස තිබුණි. විකුණුම් ක්‍රියාවලිය අඩුවක් දක්නට ලැබුනද එහි අගය රුපියල් මිලියන 130ක ලාභයක් ලබාදෙන්නට සමත් විය. ලිහිසි තෙල් නිෂ්පාදන යන්ත්‍රාගාරය දැනටමත් ලංකාවේ පිහිටුවා ඇති අතර අඩු මිලට ලිහිසි තෙල් සපයමින් නැති වූ වෙළඳපොල ග්‍රහණය කර ගැනීමට ප්‍රයත්න දරමින් සිටී.

## ගෘහස්ථ අංශය

භූමිතෙල් සහනාධාර මිලට ලබාදීම නිසා දිගින් දිගටම අලාභ ලබන්නට වූ අතර අලාභයේ ප්‍රමානය රුපියල් බිලියන 14.6ක් විය. භූමිතෙල් අලෙවියෙන් රුපියල් බිලියන 15.3ක් උපයා තිබුණ ද සංස්ථාවේ අලාභයට එහි දායකත්වය රුපියල් බිලියන 14.4 පමණක් විය. 2017 වසරට සාපේක්ෂව විකුණුම් ප්‍රමාණය 30.8%, කින් වැඩි වූ අතර විකුණුම් මිල ද වැඩි කර තිබුණි. සමහර ලොරි සහ බස් රථ ප්‍රවාහකයන් විසින් තෙල් බාල කිරීම කිරීමද මෙයට හේතු විය. අන්තර්ජාතිකව මිල වැඩිවීම ඉන්ධන සහනාධාරය සහ අධික ඉල්ලුම යන කරුණු අපගේ පාඩුවට බලපෑ හේතු විය.

ඔසේම එල්පීජී ගෑස් අලෙවිය 28% කින් ඉහළ යන්නේ පසුගිය වසරේ ප්‍රමාණය වූ රුපියල් මිලියන 1822 සිට රුපියල් මිලියන 2337ක් දක්වායි .නමුත් ලාභය රුපියල් මිලියන 273 සිට රුපියල් මිලියන 116ක් දක්වා අඩුවීමක් දක්නට ලැබුණි. වියදම් ක්ෂේත්‍රයේ ඉහළයාම මෙන්ම විනිමය අනුපාතයන්හි බලපෑම මෙයට හේතු විය.

**දේශීය විකුණුම් සහ ලාභදායීතාවය**




**නැව් ඉන්ධන සැපයීම - පාඩු (රු. මි)**




## කෘෂි රසායන අංශය

මේ අංශයේ ආදායම රුපියල් මිලියන 75 සිට රුපියල් මිලියන 151 දක්වා වර්ධනයක් අතර සංස්ථාවේ සමස්ථ කෘෂි අලාභය රුපියල් මිලියන 273 සිට රුපියල් මිලියන 19 දක්වා අඩු වී තිබුණි. මේ අතර නියාමන අදිකාරී රෙගුලාසි වලට යටත් වන සේ රබර් වගාව සඳහා ග්ලයිෆෝසේට් ආනයනය කිරීමේ අවසරය සංස්ථාවට ලැබුණි. 2018 වසරේදී සමාගම විසින් ග්ලයිෆෝසේට් ආනයනය කරන ලද අතර වසරේ නොවැම්බර් සහ දෙසැම්බර් මාස වලදී ඒවා අලෙවි කරන ලදි.කෘෂි රසායන අංශයේ අලාභය අඩුකිරීමට මෙම වෙළඳාමද හේතුවිය.

එසේම ISO 18001 තත්ව සහතිකයේ මෙන්ම OSHAS 2007 තත්ත්ව සහතිකය ලබාගැනීමට උනන්දු විය. තවද බෙදාහැරීමේ ජාලය පුලුල් කිරීම සංස්ථාවේ කෘෂි රසායනික නියෝජිතයින් 117ක් එක් කරනු ලැබූ අතර රබර් වගාව තුළින් නව ගනුදෙනු කරුවන් 56 දෙනෙකුට පහසුකම් සපයන ලදි.

## ගබඩා කිරීම සහ අපනයනය කිරීම්

මෙම අංශයේ ආදායම රුපියල් මිලියන 495ක් වූ අතර දැව් තෙල් සහ නැප්තා අඩු කළ මිල ගණන් යටතේ විකිණීමට සිදුවීමෙන් සංස්ථාවට රුපියල් මිලියන 66ක අලාභයක් විඳීමට සිදුවිය. මෙහි ප්‍රධානතම හේතුව ඉන්ධන ගබඩාකර තබාගැනීමට පහසුකම් හීනවීමයි. කෙසේවෙතත් වසර තුළ දී දැව් තෙල් සහ නැප්තා අපනයනයෙන් සංස්ථාව රුපියල් බිලියන 8.59ක ආදායමක් උපයා තිබූ අතර සංස්ථාවට විඳින්නට වූ අලාභය රුපියල් බිලියන 1.06ක් විය.

# පිරිපහදුව

ඇති වූ වැසි සහිත කාලගුණ තත්ත්වය නිසාවෙන් දැව්තෙල් සහ නැප්තා සඳහා වූ දේශීය ඉල්ලුමේ අඩුවක් දක්නට ලැබුණි. ඇතැම් අවස්ථාවලදී අපනයනය කරන ලද්දේ වියදම් පාර්ශවය හෝ පිරිමසා නොගෙනය.

### බොරතෙල් සැකසීම




පිරිපහදු නිෂ්පාදන වලින් 35%ක්ම ඔටෝ ඩීසල් වන අතර දෙවන තැන ගන්නා ලද නිෂ්පාදය වන්නේ 27%ක් ලෙස දැව්තෙල් නිෂ්පාදනයි.

### පිරිපහදු කළ නිෂ්පාදන




### ප්‍රධාන ක්‍රියාවලි ඒකකවල මෙහෙයුම් කාල කාර්යක්ෂමතාව

| | 2018 | 2017 |
|---|---|---|
| බොර ආසවනය කිරීමේ ඒකකය | 89.70% | 96.20% |
| නැප්තා යුනිෆයිනර් ඒකකය | 87.85% | 87.80% |
| වේදිකා ඒකකය | 89.09% | 90.30% |
| ගෑස් තෙල් ඒකාබද්ධ කිරීමේ ඒකකය | 66.43% | 81.60% |
| විස්බ්‍රේකර් ඒකකය | 85.30% | 85.00% |
| එල්පීජී මෙරොක්ස් ප්‍රතිකාර ඒකකය | 85.35% | 93.50% |
| බිටුමන් ඒකකය | 25.84% | - |
| LPG ඒකකය | 85.67% | 93.50% |
| භූමිතෙල් මෙරොක්ස් ඒකකය | 75.31% | 69.90% |
| ජල පරිපහදු කිරීමේ ඒකකය | 43.84% | 38.10% |

බොරතෙල් මෙට්‍රික් ටොන් 1,675,337 ක් පිරිපහදුවට ලක්කරන ලද අතර දිනකට ක්‍රියාන්විතය මගින් සාදන ලද මෙට්‍රික් ටොන් ප්‍රමාණය 5123 සිට 5741 දක්වා වේ.එසේම පිරිපහදුව දින 327.42ක් මෙහෙයුම්හි නිරතව තිබූ අතර බොරතෙල් පිරිපහදු ඒකකයේ කාර්ය සාධනය 89.70% ක් විය.

ප්‍රමාණාත්මකව ගත්කළ ඉන්ධන සහ ගෑස් භාවිතය 2.68% කින් වැඩිවූ නමුත් අගයක් ලෙස ගත්විට එම වැඩිවීම 60.63% ක් ලෙස දක්නට ලැබුණි. නැවත වතාවක් සඳහන් කළයුතු කරුණක් ලෙස සඳහන් කළ යුතු වන්නේ වියදම් අංශය සැලකියයුතු ලෙස ඉහළ යාම මෙන්ම රුපියල අවප්‍රමාණ වීමද මේ සඳහා බලපෑ බවයි.

2017 වසරට සාපේක්ෂව සැබෑ මෙහෙයුම් වියදම මෙට්‍රික් ටොන් 1ක් සඳහා 36.76% කින් වැඩි වී තිබුණි. මේ තත්ත්වය ඇතිවූයේ මිල වැඩිකරන ලද සංස්ථාවේම ඉන්ධන සහ ගෑස් භාවිතයෙන් විය. අපේක්ෂිත වියදම සහ සන්සන්දනයේදී මෙහෙයුම් වියදම 8.03% කින් අඩුවී තිබුණි. පිරිපහදු අංගනයේ මෙහෙයුම් කාර්යසාධනය දියුණු කරනු වස් වසර තුනකට වතාවක් එහි වැඩකටයුතු නතර කරනු ලැබේ.

පෙබරවාරි 18 සිට මාර්තු 27 දක්වා වී අනුව මෙහෙයුම් අංගනයේ සේවා සහ ප්‍රමිතිගත කටයුතු කරන ලද්දේ එහි ආරක්ෂාව තහවුරු කරමිනි. එසේම මෙහෙයුම් පද්ධතියේ දෝෂ වලට එරෙහිව වැඩිදියුණු තත්වයට පත්කරමිනි.2017 වසරේ 0.717%ක්වූ ගබඩා කිරීම් සහ මෙහෙයුම් අලාභ 2018 වසරේදී 0.330% ක් දක්වා අඩුවූයේ සංස්ථාවේ තුළම ඉන්ධන පිරිපහදු ක්‍රියාවලිය සිදුවන තත්ත්වයන් තුළයි.ඉන්ධන මිල නොමැතිව මෙහෙයුම් වියදම, රුපියලේ අගය අවප්‍රමාණය වීම,බොරතෙල් මෙට්‍රික් ටොන් 1ක් සඳහා ගාස්තු 10.57% කින් වැඩිවූ අතර ඉන්ධන ගාස්තු ඇතුලත්ව වියදම 37.38% ලෙස මිල ඉහළ ගියේ මිල වැඩි කරන ලද ඉන්ධන සහ ගෑස් භාවිතය හේතුවෙනි.

2018 වසරේදී තෙල් බැරලයක් සඳහා ආනයන වියදම සැලකිය යුතු අයුරින් ඉහළ ගිය අතර එයට හේතුව අන්තර්ජාතික ඉන්ධන මිලේ විචල්‍යතාවයි.

| | 2018<br>ඇමරි ඩො | 2017<br>ඇමරි ඩො |
|---|---|---|
| මර්බන් බොරතෙල් | 80.01 | 56.41 |
| ඩී. ඒ. එස් | 83.63 | 65.39 |

(පිරිවැයCIF පදනම මත)

ඛනිජ තෙල් නිෂ්පාදන සැකසීම

ලාෆ්ස් ගෑස් සමාගම සහ ලිට්‍රෝ ගෑස් සඳහා පිළිවෙලින් මෙට්‍රික් ටොන් 6,169ක් සහ මෙටොන් 16,764ක ගෑස් ලබාදුන් අතර ලංකා විදුලි බල මණ්ඩලයට සහ ඒෂියා පවර් සංස්ථාව සඳහා සංස්ථාව ලබා දී තිබූ ප්‍රමාණය ඉන්ධන ප්‍රමාණය පිළිවෙලින් මෙට්‍රික් ටොන් 126,309ක් සහ මෙට්‍රික් ටොන් 10,745කි.

## සපුගස්කන්ද බෙදාහැරීම් පර්යන්තය

සපුගස්කන්ද බෙදාහැරීම් පර්යන්තය සංස්ථා සතු බෙදාහැරීම් පර්යන්තයක් වන අතර පිරිපහදුව මගින් පිරිසිදු කරන ඔටෝ ඩීසල්, පෙට්‍රල් 92, දැවි තෙල් සහ JET A-1 ඉන්ධන මෙමගින් බෙදාහරිනු ලැබේ.

පර්යන්තය මෑතකදී ප්‍රතිසංස්කරණයට ලක් කරන ලද අතර පර්යන්ත හරහා JET A-1 ඉන්ධන ගුවන් තොටුපොලට ප්‍රවාහනය පහසු කිරීම සඳහා පිරවීමේ ක්‍රියාවලිය ස්වයංක්‍රීය කරනු ලැබීය. පර්යන්තයේ මෙහෙයුම් කාර්යක්ෂමතාව පහත දැක්වේ.

| | 2018 | |
|---|---|---|
| නිෂ්පාදන | හසුරුවන ලද ප්‍රමානය (ලී.මි) | මුළු විකුණුම් (ලී.මි) |
| පෙට්‍රල් 92 | 51.37 | 1,337.39 |
| ඔටෝ ඩීසල් | 212.04 | 2,120.16 |
| දැවිතෙල් | 158.90 | 362.07 |
| භූමිතෙල් | 24.15 | 259.16 |
| ජෙට් A-1 | 42.88 | 630.43 |
| එකතුව | 489.34 | 4,709.21 |


HYUNDAI
25DF -7
CEYPETCO



# අප අගය එකතු කරන්නේ කෙසේද ?

# අප අගය එකතු කරන්නේ කෙසේද ?

## මූල්‍ය ප්‍රාග්ධනය

### ආදායම

අදායම් ඉපයීම මූලිකව සිදු කරනු ලබන්නේ ඛනිජ තෙල් නිෂ්පාදන දේශීයව අලෙවි කිරීමෙනි. ඉන්ධන සඳහා මිල යාන්ත්‍රණයක් රජය විසින් 2018 මැයි මාසයේදී හඳුන්වාදුන් අතර නියමකරන ලද පරිදි නියාමන අවශ්‍යතාවන්ට අනුව ඩීසල් හා පෙට්‍රල් මිල වෙනස් වූ අතර මිල නියාමන යාන්ත්‍රණය සංස්ථාවට සාධනීය ලෙස දායකත්වයක් සැපයුවේ අන්තර්ජාතික මිල විචලනයන් මත සංස්ථාවට විඳින්නට සිදු වූ අලාභය අවම කරමිනි.

**විකුණුම් : (රු.බි)**




රු. 592 බි

ආදායම

රු. 13.7 බි

මූල්‍ය සහ වෙනත් ආදායම්

රු. 329 බි

මුළු වත්කම්

### ආදායම් සංයුතිය




එසේම 2018 වසරේදී ඔටෝ ඩීසල් ඉහළම ආදායමක් වාර්තා කළ අතර 92 පෙට්‍රල් දෙවන ආදායම් උපදවන ලද නිෂ්පාදනයයි. 2017 වසරට සාපේක්ෂව පෙට්‍රල් 92 සඳහා ඉල්ලුම 10% කින් වර්ධනය වී තිබුණි. එසේම පෙට්‍රල් 95 සහ සුපිරි ඩීසල් සඳහා වැඩි වූ පාරිභෝගික කැමැත්ත පෙන්නුම් කළේ වඩාත් ක්‍රියාශීලී සහ පරිසර හිතකාමී ඉන්ධන කෙරෙහි ජනතාව තුළ ඇති කැමැත්තයි. කෙසේ වෙතත් භූමිතෙල් වලට ඇති වූ ඉල්ලුම පෙන්නුම් කරනු ලැබුවේ ලබාදුන් සහනාධාරය විශාල ප්‍රමාණයේ ප්‍රවාහන කරුවන් විසින් බස් සහ ලොරි සඳහා තෙල් බාල කිරීමේ ක්‍රියාවලියකට යොදා ගෙන ඇති බවයි. කෙසේ වෙතත් මේ තත්ත්වය අවම කිරීමට යාන්ත්‍රණ කිහිපයක්ම ක්‍රියාත්මක කරනු ලැබීය. ඒ අතරම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව එහි පරිසර හිතකාමී මෙහෙයුම් මගින් සල්ෆර් අවම යුරෝ-4 නිෂ්පාදන වෙළඳපොලට හඳුන්වාදෙන ලදී.

## අනෙකුත් ආදායම්

2018 වසරේදී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ලාභාංශ ආදායම රු. මිලියන 434ක් ඉපයූ අතර එයට ප්‍රධාන වශයෙන්ම උපකාරී වූයේ සංස්ථාව යටතේ ඇති CPSTL ආයතනයයි. එසේම සේවක පොලී ආදායම රු මිලියන 215ක් ලෙස සටහන් වේ. සියලු ආයෝජනයන්, කුලී ආදායම්, විකිණුම් මෙන්ම තෙල් පිරවුම් හල් වල උපකරණද මීට අයත් වේ.

## විනිමය අනුපාත වෙනස්වීම්

සෘණාත්මක ලෙස සංස්ථාවේ ආදායමට බලපෑ විනිමය අනුපාතයන් වෙනස්වීම රු. මිලියන 82717 ක් වූ අතර 2017 වසරට සාපේක්ෂව එය රු. මිලියන 77795ක වැඩිවීමකි. විදෙස් මුදල් වලට එරෙහිව ශ්‍රී ලංකා රුපියලේ පහත වැටීම සංස්ථාවට විශාල අලාභයන් ගෙන එන ලද්දේ සංස්ථාව ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කළ හෙයිනි. 2018 වර්ෂයේදී ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල 16.4% කට ආසන්න වශයෙන් අවප්‍රමාණය විය. සංස්ථාව රාජ්‍ය බැංකු දෙකකින් ඩොලර් මිලදී ගෙන අදාල ණය පියවා දමන ලදී. කෙසේවෙතත් වෙළඳපොලේ අවශ්‍ය තරම් ඇමරිකානු ඩොලර් නොතිබීම මූල්‍ය තත්ත්වය දරුණු අතට හරවන්නක් විය.

### විනිමය පාඩු (රු. මිලියන)




## මූල්‍ය ආදායම

සංස්ථාව බැංකු අයිරා සඳහා පොලී නොගෙවන අයුරින් වගබලා ගනිමින් දිනපතා ලැබෙන අතිරික්ත මුදල් පොලී ලැබෙන මාර්ග යන් වෙත යොදවන ලදී. ඒ අනුව ආයෝජනයන්ගෙන් ලද මූල්‍ය ආදායම රු. මිලියන 258කින් වැඩි වූ අතර බැංකු අයිරා හෝ පොලී සඳහා ඉඩක් නොතබන ලදී. 2017 වසරට සාපේක්ෂව සමස්ථ මූල්‍ය ආදායම 16 % කින් ඉහළ ගියේය. ගනුදෙනුකාර භවතුන් විසින් ප්‍රමාද වී කරන ගෙවීම් වලට ලද පොලී මුදල් රු. බිලියන 1.5කින් වැඩි වී තිබුණි. ලංකා විදුලි බල මණ්ඩලය, පුද්ගලික බලාගාර සහ ශ්‍රී ලන්කන් ගුවන් සමාගම මෙලෙස පොලී ගෙවා තිබුණි. එසේම බැඳුම්කර, ස්ථිර තැන්පතු හා ඉල්ලීම් තැන්පතු වැනි අයෝජනයන් මගින් ලද ආදායමද මෙම වර්ධනයට දායකවී තිබුණි.

### මූල්‍ය ආදායම




## මූල්‍ය වියදම්

පසුගිය වසරට සාපේක්ෂව රු. බිලියන 12.06 ක මූල්‍ය වියදමක් සංස්ථාව දරා තිබූ අතර එය පසුගිය වසරට සාපේක්ෂව 14.5% ක වර්ධනයකි. සංස්ථාව මේ වියදම් අඩුකර ගැනීමට උපරිම උත්සාහයන් ගන්නා ලද්දේ බැංකු අයිරා පොලී ගෙවීමට නොසිදුවන ලෙස මුදල් පරිහරණයට ඉඩහසර සලසා ගනිමිනි. කෙසේ වෙතත් සංස්ථාවේ මූල්‍ය වියදම් තත්ත්වය ඉහළ ගියේ වෙළඳපොල තුළ ඇමරිකානු ඩොලර් හිඟවීම මත ණය ප්‍රමානය ඉහල යාම තුලිනි.

## ආදායම් බදු වියදම්

2017 වසරේ අංක 24 දරණ නව ආදායම් පනත අනුව සංස්ථාව ඉදිරියට ගෙන එන ලද බදු අලාභ තුලින් හිලව් කරගත හැකි නිසාවෙන් වසර තුළ දී ප්‍රමානාත්මක අදායම් බදු වගකීමක් සංස්ථාව වෙත පැවරුනේ නැත

## ලාභදායීත්වය

අන්තර්ජාතික ඉන්ධන වෙළෙඳපොලේ මිළ විචලයතාවය, සහන මිලකට ඉන්ධන සැපයීම, ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියල දරුණු ලෙස අවප්‍රමාණය වීම, සමස්ත ලාභයට දැඩි බලපෑමක් එල්ල කරන ලදි.

### ලාභ අනුපාතයන්හි වෙනස් වීම පහත දැක්වේ

| | 2017 | 2018 |
|---|---|---|
| දල ලාභ අනුපාතය | 6.05% | -0.58% |
| මෙහෙයුම් ලාභ අනුපාතය | 1.61% | -4.44% |
| ශුද්ධ ලාභ අනුපාතය | 0.24% | -20.16% |

2018 වසරේදී සංස්ථාව සමස්ත අලාභයක් වාර්තා කරන ලදි. නොනවත්වාම අන්තර්ජාතික ඉන්ධන මිල වැඩිවුවද 2018 මැයි මාසය වනතුරුම දේශීය වෙළඳපොලේ විකිණුම් මිල වෙනස් නොවී පැවතුණි. 2018 මැයි මාසයේ සිට රජය ඩීසල් සහ පෙට්‍රල් සඳහා මිල සූත්‍රයක් හඳුන්වා දුන් අතර එය අලාභ අඩුකිරීමට හේතුවුණි. එසේම සංස්ථාවේ ලාභය කෙරෙහි ඇමරිකානු ඩොලරයට එරෙහිව ශ්‍රී ලංකා රුපියල කඩා වැටීම ප්‍රධාන ලෙස බලපාන ලදි.

### දළ ලාභය/අලාභය (රු. මි)




ඒ අනුව 2018 වසරේදී විස්තීර්ණ ආදායම රු. බිලියන 104.77ක අලාභයකින් අවසන් වූ අතර එය පසුගිය වසරේ උපයන ලාභයට සාපේක්ෂව විශාල වෙනසකි. කෙසේවෙතත් සංස්ථාවට දරන්නට වූ අලාභයට බලපෑ සුවිශේෂී හේතු පහත දැක්වේ

- අන්තර්ජාතික මිළ වෙනස්වීම් වලට සාපේක්ෂව ලංකාවේ මිල සංශෝධනය සඳහා මිල නියාමන ක්‍රමයක් 2018 මැයි මාසය දක්වා නොතිබීම මෙන්ම රජය විසින් තීරණය කරන ලද සහන මිල ගණන් යටතේ ඉන්ධන විකිණීමද ඊට හේතු විය. එසේම බොරතෙල් මිල අන්තර්ජාතිකව ඉහළ ගියද ගෘහස්ථ ඉන්ධන සිල්ලර මිල 2015 ජනවාරි මාසයේ සිට නොවෙනස්ව පැවතුනි.

- ඇමරිකානු ඩොලරයට සාපේක්ෂිතව ශ්‍රී ලංකා රුපියලේ අගය 16.4% කින් පහලයාම මත එනම් විනිමය අනුපාතයේ වෙනස්කම් මත සංස්ථාවට දරන්නට වූ අලාභය රුපියල් බිලියන 82.72කි

- ඩොලර් ණය වල පොලී ගෙවීමට රුපියල් බිලියන 12.60 ක් වැය වී තිබූ අතර සංස්ථාව මුහුණ දුන් තවත් අභියෝගයක් වූයේ රජයෙන් ලැබිය යුතු සහනාධාර යටතේ ඩොලර් ණය ගෙවා දැමිය හැකි වන පරිදි සැකසූ ක්‍රමවත් යාන්ත්‍රණයක් නොමැති වීමයි.

- රජය වාණිජ බැංකු දෙකකින් පමණක් ඩොලර් මිලදී ගැනීමේ හැකියාව සංස්ථාවට ලබාදී තිබුණු අතර අනෙකුත් අවසර ලත් වාණිජ බැංකු වලින් ඩොලර් මිලදී ගැනීම සීමා කරනු ලැබ තිබුණි.

- වර්ෂාව ලැබීමෙන් ජල විදුලි නිෂ්පාදනයට නැඹුරුවක් ඇති වූ අතර සංස්ථාවට දැවි තෙල් සහ නැප්තා පාඩු ලබන තත්ත්වයක් යටතේ අපනයනය කිරීමට සිදුවිය. එම කාලය තුළ දේශීය ඉල්ලුමද පහළ වැටී තිබුණි. සංස්ථාවට මේ නිෂ්පාදන ගබඩා කර තැබීමට පහසුකම් නොතිබූ හෙයින් අඩු මිලට ඒවා විකුණා දැමීමට සිදු විය.

මේ අතරතුර විවිධාකාර අභියෝගයන්ට මුහුණ දීමට සිදු වුවද, සංස්ථාව විසින් නොයෙකුත් උපක්‍රම හරහා තිබූ පාඩු අවම කරගැනීමට උත්සාහයන් ගනු ලැබීය.

- ණයවර ලිපි ගාස්තු අඩුකර ගැනීම සඳහා ලංකා බැංකුව හා මහජන බැංකුව සමග නිතර සාකච්ඡා පවත්වනු ලැබිණි.

- මුදල් හිඟකරුනේ තිබීම වළකනු වස් භාණ්ඩාගාර කටයුතු නිසි පරිදි හා කාර්යශූර ලෙස මෙහෙයවීමට කටයුතු කරන ලදි. දෛනික අමතර ආදායම් පොලී උපයන ආදායම් මාර්ග බවට පත්කර ගත්තේ සංස්ථාව බැංකු අයිරාවක් කරා යාම වළක්වමිනි. ඒ අනුව වසර තුළදී ස්ථිර තැන්පතු, භාණ්ඩාගාර බිල්පත් හා කෙටිකාළීන තැන්පතු වලින් සංස්ථාව රුපියල් බිලියන 4.7ක් උපයා ගත් අතර බැංකු අයිරා සඳහා පොලී ගෙවීම වැළැක්වීමට සමත් විය.

- ආනයන ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඉතාම පාරදෘෂ්‍ය කරන ලද අතර විශාල පිරිසකට ලංසු තැබීමේ අවස්ථාව උදාවිය. මෙමගින් තත්ත්වයෙන් ඉහළ ඛනිජ තෙල් ආනයනය සඳහා සාධණීය තරගකාරීත්වයක් ඇති කිරීමට සමත් වූ අතර ආනයන මිල අඩු කිරීමට ද හැකියාව ලැබිණ.

- රජය විසින් 2018 මැයි සිට මිල සූත්‍රයක් පෙට්‍රල් සහ ඩීසල් සඳහා හඳුන්වා දුන් අතර එමගින් අලාභය අවම කරන ලදි.

- ගුවන් යානා ඉන්ධන වියදම් දර්ශක මිල ක්‍රමය නොනවත්වා භාවිත කළ අතර එම අංශයෙන් රුපියල් බිලියන 3.8ක් ලාභයක් ලැබිණි.

- මූලික කියකියවිලි නොමැති අවස්තාවන්හිදී ඇපකර හෝ බැංකු ලියකියවිලි භාවිතා කරමින් භාණ්ඩ නිදහස් කරගන්නා ලදි

- සංවර්ධන ක්‍රියා පටිපාටි බොහොමයක් දැනටමත් සිදු කර ඇති අතර, තවදුරටත් වැඩිදියුණු කිරීමට අවශ්‍ය වේ. තවද, ඉන්ධන හැසිරවීමේ හා බෙදා හැරීමේ කාර්යයේ බොහෝ අඩුපාඩු හඳුනාගෙන නිවැරදි කරන ලදී.

- ත්‍රිවිධ හමුදාව, පොලීසිය සහ දුම්රිය දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු වෙළෙඳ ලැබීම් වලට එරෙහිව ගෙවිය යුතු රේගු බද්ද හිලව් කරන ලදී.

## දේපළ, පිරියත සහ උපකරණ

රුපියල් මිලියන 595ක දේපළ, පිරියත සහ උපකරණවල වටිනාකම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වත්කම් පදනමට එකතු කර ඇත. ඉඩම් තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව සම්බන්ධ කර ගනිමින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් තෝරාගත් ඉඩම් නැවත තක්සේරු කරන ලදී. සංස්ථාව විසින් වර්ෂය තුළ විකුණූ වත්කම්වල වටිනාකම රුපියල් මිලියන 24කි. වර්ෂය සඳහා ක්ෂය කිරීමේ වටිනාකම රුපියල් මිලියන 957ක් වේ.

## තොගය

2017 වර්ෂයට සාපේක්ෂව තොග වල වටිනාකම 28.95% කින් ඉහළ ගොස් ඇත. පිරිපහදු කළ නිෂ්පාදනවල වටිනාකම වැඩි වීම, නිමි භාණ්ඩවල වටිනාකම වැඩි කිරීමට හේතු විය.

## වෙළෙඳ ලැබීම්

රජය සතු ව්‍යවසායන් විසින් ගෙවිය යුතු හිඟ මුදල් පියවා නොගැනීම හේතුවෙන් ලැබිය යුතු ශේෂය 2017 වසරට සාපේක්ෂව 12.5% කින් ඉහළ ගොස් තිබේ. වර්ෂය තුළදී ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට රේගු බදු වලට එරෙහිව ත්‍රිවිධ හමුදාව, පොලීසිය සහ දුම්රිය දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු වෙළඳ ලැබීම් රුපියල් බිලියන 11.94 හිලව් කරන ලදී. ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් ලිමිටඩ්, ලංවිම, අයිපීපී සහ ත්‍රිවිධ හමුදාව වෙතින් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු හිඟ මුදල් පිළිවෙලින් රු.බිලියන 25.6, බිලියන 47.6 ,බිලියන 6.7 සහ බිලියන 0.82 කි.

## කෙටිකාලීන ආයෝජන

වැඩිදියුණු කළ ණය එකතු කිරීමේ ක්‍රමවේදය සහ ඩොලර් ණය පියවීම සඳහා එ.ජ ඩොලර් වෙළෙඳපොලේ නොතිබීම හේතුවෙන් අතිරික්ත මුදල් සංස්ථාව කොටස් නොවන කෙටි කාලීන ආයෝජන සඳහා ආයෝජනය කළේය. ඒ අනුව කෙටිකාලීන ආයෝජන 829% කින් ඉහළ ගොස් ඇත.

## ණය සහ ණය ගැනීම්

වර්ෂය තුළ ණය සහ ණය ගැනීම් රු. බිලියන 116 කි. වෙළෙඳපොලේ ප්‍රමාණවත් ඩොලර් ප්‍රමාණයක් නොතිබීම හේතුවෙන් ණය පියවීම නොකිරීමේ ප්‍රතිපලයක් ලෙස ණය පියවා නොගැනීම හේතුවෙන් විශාල විනිමය විචලනයකට හේතු විය. මෙය සංස්ථාව පාඩු ලබන එක් ප්‍රධාන සාධකයකි. තවද, ඇමරිකානු ඩොලර් මිලියන 7.725 ක ණයක් ගුවන්තොටුපල පුළුල් කිරීමේ ව්‍යාපෘතියට මුදල් යෙදවීම සඳහා වර්ෂය තුළ මහජන බැංකුවෙන් ලබා ගන්නා ලදී.

## රඳවාගත් ඉපැයුම්

2008 සිට සෘණ සමුච්චිත රඳවා ගත් ඉපැයීම් තවදුරටත් සිදුවී ඇති අලාභය සමඟ රුපියල් බිලියන 325.57 ක් විය. ලාභ ලද වසරවල් වනුයේ 2014, 2016 සහ 2017 දී පමණි. පිරිවැය පරාවර්තක මිලකරණ ව්‍යුහයක් නොමැතිකම මෙම පාඩු සඳහා ප්‍රධාන හේතුව වූ අතර ඒවා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍යමය කාර්යසාධනය නරක අතට හැරෙන පොලී සහිත බැංකු ණය මගින් මූල්‍යනය කර ඇත.

## ආර්ථිකයට අගය එකතු කිරීම

| එකතු කරන ලද අගය | 2018 රුපියල් මිලියන | 2017 රුපියල් මිලියන |
|---|---:|---:|
| | | |
| විකුණුම් ආදායම | 520,967 | 445,950 |
| වෙනත් ආදායම් | 13,702 | 11,738 |
| ද්‍රව්‍ය හා සේවා වලින් මිල දී ගැනීම | (495,874) | (293,965) |
| ක්ෂයවීම | (957) | (923) |
| අගය එකතු කරන ලදි | 37,838 | 162,800 |
| | | |
| පහත දැක්වෙන ආකාරයට අදාළ වේ | | |
| සේවකයින්ට | | |
| වැටුප් සහ වාසි ප්‍රතිලාභ | 6,019 | 5,236 |
| ප්‍රාග්ධනය සපයන්නන්ට ගෙවීම | | |
| ණය සඳහා පොළිය | 12,065 | 10,531 |
| සංස්ථාවට | | |
| රඳවාගත් ලාභය | (105,051) | 1,056 |
| රජයට | | |
| බදු සහ තීරුබදු | 124,805 | 145,978 |
| අගය එකතු කරන ලදි | 37,838 | 162,800 |

ඉහත වගුවේ දක්වා ඇති පරිදි 2018 මූල්‍ය වර්ෂය තුළ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ආර්ථික දායකත්වය ණය දෙන්නන්, රජය, සේවකයින් සහ සේවා සපයන්නන් අතර නැවත බෙදා හරින ලදී.

# නිෂ්පාදිත ප්‍රාග්ධනය

ජාතියට වැඩිදියුණු කළ සේවාවක් සැපයීමේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සැලැස්මත් සමඟ ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා ආයෝජන ඉතා වැදගත් වේ. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව රු. මිලියන 595  වැඩිදියුණු කළ නිෂ්පාදන සහ සේවාවන් පාරිභෝගිකයින්ට සැපයීම සඳහා පවත්නා වත්කම් බඳුනට එකතු කර ඇත. වසර තුළ වැදගත් ව්‍යාපෘති බොහොමයක් සතුටුදායක ලෙස සිදු කරන ලදී. ඒ අතරම සුළු හා ප්‍රාග්ධන මිලදී ගැනීම් ද සම්පූර්ණ කිරීමට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට හැකි විය.

වර්ෂය තුළ නිම කරන ලද ප්‍රධාන ව්‍යාපෘති පහත දැක්වේ.

- පිරිපහදුව සඳහා බොයිලේරු සාර්ථකව ස්ථාපනය කරන ලදී
- ජෙට් ඒ -1 බෙදා හැරීමේ පහසුකම සපුගස්කන්ද බෙදාහැරීමේ පර්යන්තයට එක් කරන ලදී.
- සපුගස්කන්ද බෙදාහැරීමේ පර්යන්තය ස්වයංක්‍රීය කිරීම.
- ජෙට් ඒ -1 නිෂ්පාදන සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි කොලොන්නාව තෙල් නිමාවෙහි තෙල් පෙරහන් යන්ත්‍රය ස්ථාපනය කිරීම.
- චයිනා බේ බංගලාවේ සූර්ය බලශක්ති ස්ථාපන පද්ධතිය සම්පූර්ණ කිරීම.
- බොරතෙල් එස්පීබීඑම් අලුත්වැඩියාව
- කොළඹ වරායේ ඩොල්ෆින් ජැටිය නඩත්තු කිරීම

## ක්‍රියාත්මක වෙමින් පවතින ප්‍රධාන ව්‍යාපෘතිවල තත්වය

1. පිරිපහදුව සඳහා වන ජල පවිත්‍රාගාරය - ලංසු ලේඛනයට අවශ්‍ය සංශෝධන සිදු කිරීමෙන් පසු නව ටෙන්ඩරයක් නැවත කැඳවීමට අනුමැතිය ලබාගෙන ඇත.

2. බොරතෙල් ආසවනය කිරීමේ තීරුව, ගෑස් තෙල් හයිඩ්‍රොට්‍රීටර් ඒකක ප්‍රතික්‍රියාකාරක ඒකකය ප්‍රතිස්ථාපනය කිරීම - පෙරමුනු ඉංජිනේරු සැලසුම් (FEED) සිදු කිරීම සඳහා දක්ෂ පාර්ශවයන් තෝරා ගැනීම සඳහා කැමැත්ත ප්‍රකාශ කිරීම සඳහා ආරාධනා කරන ලද අතර ලංසුකරුවෙකු තෝරා ගන්නා ලදී.
3. ගුවන් ඉන්ධන පිරවුම් පර්යන්තය සංවර්ධනය කිරීම හා වැඩිදියුණු කිරීම සහ දැනට පවතින ඉන්ධන හයිඩ්‍රන්ට් පද්ධතිය සහ නව ඒප්‍රන් - ඊ හි ඉන්ධන හයිඩ්‍රන්ට් පද්ධතියක් ස්ථාපනය කිරීම.

4. කොළඹ කටුනායක අධිවේගී මාර්ගය (CKE) ඔස්සේ මුතුරාජවෙල සිට බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ දක්වා ජෙට් ඒ -1 මාරුවීමේ නල මාර්ගය ඉදිකිරීමේ ශක්‍යතා අධ්‍යයනය බොහෝ දුරට අවසන් වී ඇති අතර ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීමට නියමිතය.

5. පිරිපහදුවේ සිට ජල පරිභෝජනයට ජල මාර්ගය ප්‍රතිස්ථාපනය කිරීමට සහ තාප්පයක් සවි කිරීමෙන් ගං ඉවුර අලුත්වැඩියා කිරීමට ටෙන්ඩර් ලේඛනයක් සකස් කරන ලදී.



අලුත්වැඩියා කරන ලද පිරවුම්හල

රු **34,034** මි

සම්පූර්ණ ස්ථාවර වත්කම්

**1,278**

සම්පූර්ණ පිරවුම් හල්

රු **595** මි

ස්ථාවර වත්කම් සඳහා ආයෝජන

## 2018 දෙසැම්බර් 31 දිනට පිරවුම්හල් ගණන

| | |
|---|---|
| සංස්ථාවට අයත් බෙදුම්හල් | 248 |
| බෙදාහරින්නන්ට අයත් බෙදුම්හල් | 1030 |
| එකතුව | 1,278 |
| 2018 දී විවෘත වූ නව පිරවුම්හල් | 24 |

ප්‍රතිපත්තියක් ලෙස, සංස්ථාව සතු පිරවුම්හල් ප්‍රතිසංස්කරණය කිරීම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් අඛණ්ඩව සිදු කරන ලදී. ඒ අනුව, පාරිභෝගිකයින්ට වඩා හොඳ සේවාවන් සැපයීම සඳහා වාර්ෂිකව පිරවුම්හල් 10 ක් ප්‍රතිසංස්කරණය කෙරේ.

දිස්ත්‍රික් මට්ටමින් පිරවුම්හල් ගණන පහත දැක්වේ.

| | ලංකා සේවා ස්ථාන | ලංකා පිරවුම්හල් | ඩිපෝ |
|---|---|---|---|
| කොළඹ | 17 | 100 | 8 |
| ගම්පහ | 2 | 114 | 18 |
| කළුතර | 1 | 37 | 10 |
| මහනුවර | 2 | 51 | 10 |
| මාතලේ | 1 | 17 | 6 |
| නුවරඑලිය | 2 | 13 | 3 |
| ගාල්ල | 1 | 49 | 17 |
| මාතර | 1 | 30 | 10 |
| හම්බන්තොට | 2 | 24 | 8 |
| යාපනය | 2 | 44 | 39 |
| මන්නාරම | 0 | 10 | 24 |
| මුලතිව් | 0 | 9 | 14 |
| වවුනියාව | 0 | 12 | 11 |
| මඩකලපුව | 1 | 31 | 16 |
| අම්පාර | 3 | 43 | 14 |
| ත්‍රිකුණාමලය | 1 | 14 | 23 |
| කුරුණෑගල | 4 | 84 | 11 |
| පුත්තලම | 1 | 59 | 22 |
| අනුරාධපුර | 3 | 40 | 13 |
| පොළොන්නරුව | 2 | 21 | 5 |
| බදුල්ල | 2 | 23 | 1 |
| මොණරාගල | 3 | 19 | 3 |
| රත්නපුර | 2 | 33 | 12 |
| කෑගල්ල | 1 | 26 | 4 |
| කිලිනොච්චි | 0 | 9 | 10 |
| | 54 | 912 | 312 |

## අනාගත ව්‍යාපෘති

ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් කර්මාන්තය තිරසාර කර්මාන්තයක් බවට පත් කිරීම සඳහා නුදුරු අනාගතයේ දී කෙටිකාලීන හා දිගු කාලීනව ක්‍රියාත්මක කළ යුතු ප්‍රධාන ව්‍යාපෘති කිහිපයක් ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ කළමනාකාරිත්වය විසින් හඳුනාගෙන තිබේ.

1. පිරිපහදුවෙන් හා වරායෙන් ලැබෙන ඉන්ධන එකවර ක්‍රියාත්මක කිරීම සඳහා කොලොන්නාවෙහි නල මාර්ගය නවීකරණය කිරීම.

2. ජෙට් ඒ 1 මාරු කිරීම සඳහා පිරිපහදුව සහ මුතුරාජවෙල නල මාර්ගයක් හරහා සම්බන්ධ කිරීම.

3. සපුගස්කන්ද පර්යන්තය දුම්රිය මාර්ගය පුනරුත්ථාපනය කිරීම සහ සපුගස්කන්ද දුම්රිය ටැංකි (වැගන්) පැටවීම හඳුන්වා දීම.

4. මුතුරාජවේල පර්යන්තය සහ කොලොන්නාව පර්යන්තය සම්බන්ධ කිරීම

5. ස්වයං සේවා පොම්ප සමඟ ස්වයංක්‍රීය කර ලංකා පිරවුම්හල් සම්බන්ධ කරන්න

කෙටිකාලීන ව්‍යාපෘති සඳහා අභ්‍යන්තරව ජනනය කරන ලද අරමුදල් භාවිතා කිරීම සහ දිගු කාලීන ව්‍යාපෘති සඳහා බාහිර අරමුදල් ලබා ගැනීම අපේක්ෂා කෙරේ.

# මානව ප්‍රාග්ධනය

පක්ෂපාතී සහ කැපවූ සේවකයින් සංවිධානයේ සාර්ථකත්වයට තීරණාත්මක සාධක වේ. ඛනිජ තෙල් ව්‍යාපාරයේ වෙළඳපල ප්‍රමුඛයා සහ 85% ක සාමාන්‍ය වෙළඳපල කොටසක් තිබීම වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සේවකයින් සාර්ථකත්වයට උපරිම දායකත්වය ලබා දෙන අතර, ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඔවුන්ට ඉතා හොඳින් සලකයි.

| | |
|---|---|
| ස්ථිර කාර්ය මණ්ඩලය | 2455 |
| කොන්ත්‍රාත් | 2 |
| පුහුණු කාර්මිකයන් | 92 |
| අභ්‍යාසලාභීන් (බාහිර අධ්‍යයන ආයතන වලින්) | 221 |
| එකතුව | 2770 |

## ස්ථිර කාර්ය මණ්ඩලය - පලාත අනුව

| | පිරිමි | ගැහැණු |
|---|---|---|
| බස්නාහිර | 1803 | 286 |
| නැගෙනහිර | 24 | 1 |
| උතුර | 19 | 4 |
| ඌව | 15 | 3 |
| වයඹ | 36 | 13 |
| මධ්‍යම | 60 | 19 |
| සබරගමුව | 25 | 11 |
| දකුණ | 90 | 11 |
| උතුරු මැද | 30 | 5 |
| එකතුව | 2102 | 353 |

(සටහන - 2019 ජනවාරි මාසයේදී නැවත සේවයේ පිහිටුවීමේ ශේෂය හේතුවෙන් මූල්‍ය ප්‍රකාශ හි විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් ගණනය කිරීම් අනුව ස්ථිර කාර්ය මණ්ඩලය 2461 කි)

## ස්ත්‍රී පුරුෂ භාවය අනුව සේවකයින්



පිරිමි ගැහැණු

## වයස අනුව සේවකයින්



අවු 18-30 අවු31-40
අවු 41-50 අවු51-60

**2,770**
මුළු සේවක සංඛ්‍යාව

**19**
නව බඳවා ගැනීම්

**රු 6,019 මි**
කාර්ය මණ්ඩල පිරිවැය

## ශ්‍රේණියට අනුව සේවකයින්




## නව බඳවා ගැනීම්




## ත්‍යාග සහ පිළිගැනීම

වෙළඳපල අනුපාතයට අනුකූලව මූල්‍ය හා මූල්‍ය නොවන දිරිගැන්වීම් සහිත ආකර්ශනීය වේතන පැකේජයක් සේවකයින්ට ලබා දී ඇත. එය විධිමත් වැටුප් ව්‍යුහයක් ඇති අතර ස්ත්‍රී පුරුෂ භාවය, වයස හෝ ජනවාර්ගික රේඛා අනුව වෙනස් කොට සලකන්නේ නැත. ත්‍යාග ක්‍රමය පැමිණීම හා කාර්ය සාධනය සමඟ සම්බන්ධ වී ඇති අතර සේවකයින්ට නිසි පරිදි දිරි දීමනා කිහිපයක් ගෙවන ලදී.

වැටුප් වර්ධක සහ වෙනත් කොන්දේසි කළමනාකරණය කරනු ලබන්නේ සේවකයින් (වෘත්තීය සමිති) සමඟ අත්සන් කරන ලද සාමූහික ගිවිසුම්වලට අනුකූලවය.

## සේවා සම්මාන 2018

| | |
|---|---|
| වසර 20 සේවා කාලය | 37 |
| වසර 25 සේවා කාලය | 40 |
| වසර 30 සේවා කාලය | 30 |
| වසර 35 සේවා කාලය | 16 |
| එකතුව | 123 |

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සැමවිටම විශ්වාසවන්ත සේවකයින් සහ සංස්ථාවට ඔවුන්ගේ දායකත්වය අගය කරයි. සේවකයින්ට ඔවුන්ගේ දායකත්වය අනුව ත්‍යාග පිරිනමන ලද අතර, ඒ පිළිබඳ විස්තර ඉහත දැක්වේ.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සේවකයින් සේවක අර්ථසාධක අරමුදල (ඊපීඑෆ්) සහ සේවක භාර අරමුදල (ඊටීඑෆ්) ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ලබයි. විශ්‍රාම යාමෙන් පසු ඔවුන්ගේ අනාගතය සුරක්ෂිත කර ගැනීම සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව පිළිවෙලින් ඊපීඑෆ් සහ ඊටීඑෆ් සඳහා 15% සහ 3% දායක වේ. ඊට අමතරව, සංස්ථාව පාරිතෝෂික පනතට අනුව විශ්‍රාම යාමේදී පාරිතෝෂිකය සහ සකසුරුවම් සමාජය හරහා අතිරේක විශ්‍රාම ප්‍රතිලාභ ලබා දෙයි.



සේවා සම්මාන උළෙල BMICH

## විවිධත්වය හා සමාන අවස්ථාව

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සමාන අවස්ථා ලබා දෙන සේවා යෝජකයෙකු වන අතර සේවක වයස, ස්ත්‍රී පුරුෂ භාවය, ආගම ජනවාර්ගිකත්වය යන සෞඛ්‍ය සම්පන්නබව යන සංකලනයක් අන්තර්ගත වේ. පවරා ඇති රැකියාව සඳහා නිපුණතාවය සහ යෝග්‍යතාවය පදනම් කරගෙන සේවකයින් බඳවා ගනු ලැබේ. තවද, ස්ත්‍රී පුරුෂ භාවය නොසලකා එයට සමාන වේතන ප්‍රතිපත්තියක් ඇත. එකම රැකියා කාණ්ඩයේ සිටින කාන්තාවන් සහ පිරිමින් යන දෙදෙනාම එකම වේතන පැකේජයක් ලබා ගන්නා අතර සියලුම සේවක කාණ්ඩ සඳහා පිරිමින්ට මූලික වැටුප හා කාන්තාවන්ගේ වේතනය 1: 1 වේ.

## පුහුණුව

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සංස්කෘතිය සෑම විටම දැනුම හා පළපුරුද්ද ලබා ගැනීමට අවස්ථාව ලබා දෙමින් සිය සේවකයින්ගේ සංවර්ධනය ප්‍රවර්ධනය කරයි. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සිය සේවකයින්ට අභ්‍යන්තර හා බාහිර පුහුණුව ලබා දෙන අතර විදේශ විශ්ව විද්‍යාල සහ ආයතනවල පුහුණුව ඇතුළුව උසස් අධ්‍යාපන අවස්ථා ප්‍රයෝජනයට ගැනීමට මූල්‍ය ආධාර සපයයි. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව 2018 වර්ෂය තුළ පශ්චාත් උපාධි සහ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සඳහා මූල්‍ය ආධාර සඳහා රුපියල් මිලියන 1.74 සපයා ඇත.



ගුවන් තෙල් කටුනායක කාර්ය මණ්ඩල පුහුණුව

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සංස්කෘතිය සේවකයින්ගේ දරුවන්ට ශිෂ්‍යත්ව ලබා දීම දක්වා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ව්‍යාප්ත වන අතර වසර තුළදී එවැනි දරුවන්ට ශිෂ්‍යත්ව 25 ක් ලබා දෙන ලදී.

ඵලදායී හා ගුණාත්මක සේවාවක් සැපයීම සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඵලදායිතාව සහ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන් කිහිපයක් පවත්වයි.

## සෞඛ්‍ය සහ ආරක්ෂාව

නිෂ්පාදනවල ආවේනික ගිනි අවුලුවන සුලුස්වභාවය නිසා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මෙහෙයුම් ඉහළ සෞඛ්‍ය සහ ආරක්ෂිත බලපෑම් ඇති කරයි. තවද, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ නිසි සෞඛ්‍ය හා ආරක්ෂණ පියවරයන් සමස්තයක් ලෙස සමාජය ආරක්ෂා කරන අතරම මෙහෙයුම්වල සුමට ක්‍රියාකාරිත්වය ආරක්ෂා කරයි. එබැවින්, සියලු ආරක්ෂක පියවරයන් සෑම විටම ක්‍රියාත්මක වන අතර සෑම විටම නිරීක්ෂණය කරනු ලැබේ. ආරම්භක අවධියේදී ආරක්ෂිත උපාංග පරීක්ෂා කරනු ලබන අතර උපකරණ හොඳ ක්‍රියාකාරී පිළිවෙලකට ඇති බව තහවුරු කර ගැනීම සඳහා පරීක්ෂණ ලැයිස්තු අනුව සාමාන්‍ය හා මාසික පරීක්ෂණ සහ විගණන සිදු කරනු ලැබේ. හොඳ ගෘහ පාලක සමීක්ෂණ නිතිපතා සිදු කරන ලද අතර සෑම කාර්තුවකම මෙහෙයුම්, ඉංජිනේරු සහ කළමනාකරණ ආරක්ෂක රැස්වීම් පවත්වන ලදී. ආරක්ෂාව, සෞඛ්‍ය හා පාරිසරික සතිය 2018 නොවැම්බර් 12 සිට 19 දක්වා පැවැත්විණි.



ප්‍රධාන කාර්යාලයේ ගිනි පුහුණුව

නිතිපතා සේවකයින් සඳහා ගිනි පුහුණු පන්ති පවත්වන ලද අතර නිෂ්පාදන නිසි ලෙස හැසිරවීම, ප්‍රවාහනය සහ ගබඩා කිරීම සහතික කිරීම සහ සමාජයට සිදු විය හැකි කිසිදු සෞඛ්‍ය අනතුරක් වළක්වා ගැනීම සඳහා මාසික ගිනි අභ්‍යාස සංවිධානය කරන ලදී. ආරක්ෂක පියවරයන් පිළිබඳව සේවකයින්ගේ දැනුවත්භාවය ඉහළ නැංවීමේ අරමුණින්, CPC විසින් ඉලක්ක කරගත් ආරක්ෂිත සම්මාන යෝජනා ක්‍රමය සමඟ "මාසයේ සේවකයා" සම්මානය ඇතුළු මුදල් සම්මාන සමඟ ඉදිරියට ගියේය.

## පිරිපහදුවේ සෞඛ්‍ය හා ආරක්ෂාව

| | 2018 | 2017 |
|---|---|---|
| කාලය අහිමි වූ අනතුරු | 1 | 2 |
| ප්‍රථමාධාර අනතුරු | 5 | 3 |
| සුළු ගිනි | - | 1 |



ප්‍රධාන කාර්යාලයේ ලේ දන් දීමේ කඳවුර

## සේවක සුබසාධක

කැපවූ හා සේවයේ නියුතු කාර්ය මණ්ඩලයක් පවත්වා ගැනීම සඳහා මාණ්ඩලික සුභසාධනය අත්‍යවශ්‍ය යැයි සැලකේ. සහන පොලී අනුපාත යටතේ ණය යෝජනා ක්‍රම ඇතුළු විවිධ සුභසාධන කටයුතු වර්ෂය තුළ සංවිධානය කරන ලදී. සේවකයින්ගේ ජීවන තත්ත්වය නංවාලීම සඳහා සංස්ථාව විසින් නිවාස ණය 53 ක්, නිවාස වැඩිදියුණු කිරීමේ ණය 437 ක්, මෝටර්රථ ණය 10 ක් සහ 30 ක් සහ බයිසිකල් / ත්‍රිරෝද රථ ණය 95 ක් ලබා දී ඇත.



පිරිපහදුවේ පිරිත

## කාර්මික සම්බන්ධතා

මුළු රටේම දෛනික මෙහෙයුම් සඳහා ඛනිජ තෙල් නිෂ්පාදන අඛණ්ඩව සැපයීම අත්‍යවශ්‍ය වේ. එබැවින් රටේ බලශක්ති සුරක්ෂිතතාව සහතික කිරීමේ අරමුණ ඇතිව කාර්මික සම්බන්ධතා කළමනාකරණය සංස්ථාවට මෙන්ම සමස්ත ආර්ථිකයටම ඉතා වැදගත් වේ. අඛණ්ඩ මෙහෙයුම්,ඵලදායිතාව, ව්‍යාපාර අඛණ්ඩතාව සහ ලාභ වර්ධනය සඳහා සේවකයින් හා වෘත්තීය සමිති සමඟ සාමකාමී කාර්මික සම්බන්ධතා පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සේවකයින් වෘත්තීය සමිති නවයක් සමඟ ඒකාබද්ධ වී ඇත. කාර්මික සම්බන්ධතා පාරිභෝගිකයින්, රජය, බෙදාහරින්නන් වැනි බාහිර පාර්ශවකරුවන් වෙත ගුණාත්මකව හා නියමිත වේලාවට සේවා සැපයීම තුළින් ද ව්‍යාප්ත වේ. එබැවින් කම්කරු සබඳතා කළමනාකරණයට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දෙයි.

## ළමා ශ්‍රමය, බලහත්කාරයෙන් වැඩ කිරීම හෝ අනිවාර්ය ශ්‍රමය

සියළුම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සේවකයින් වයස අවුරුදු 18 ට වැඩි අය වන අතර, කම්කරු අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම වැළැක්වීම සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වෘත්තීය සමිති ක්‍රියා කරයි. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ළමා ශ්‍රමය, බලහත්කාරයෙන් වැඩ කිරීම හෝ අනිවාර්ය ශ්‍රමය ප්‍රවර්ධනය නොකරයි.

# සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය

ප්‍රජාව අතර විශ්වාසය ගොඩනැගීම සඳහා කීර්තිමත් අඛණ්ඩතාව සහ නියාමන අනුකූලතාවය මූලික ලක්ෂණයක් බව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විශ්වාස කරයි. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ප්‍රජා සම්බන්ධිත ආයතනික සමාජ වගකීම් ක්‍රියාකාරකම් සඳහා සෘජුවම මිලියන 5 ක් යොදවා ඇත. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ආර්ථික සංවර්ධනයට පහසුකම් සපයන, යහපාලනය ප්‍රදර්ශනය කරන සහ දිගු කාලීන තිරසාරභාවය ආරක්ෂා කරන සේවාවන් සපයයි. අපගේ සේවාවන් සෑම විටම හොඳම නිෂ්පාදන සහ වඩා හොඳ ගුණාත්මක බවක් ලබා දෙමින් රට පුරා ආවරණය කරයි.

## අපගේ ව්‍යාපාර හවුල්කරුවන්ට අගය එකතු කිරීම

සංස්ථාව උපායමාර්ගික හවුල්කරුවන් සමඟ විශේෂයෙන් රජයේ භාණ්ඩාගාරය, මහ බැංකුව, බැංකුකරුවන්, බොරතෙල් සැපයුම්කරුවන්, නැව් සමාගම්, දේශීය සැපයුම්කරුවන්, වෙළෙඳුන් සමඟ සම්බන්ධතා පවත්වා ගෙන ගියේය.

ලංකාවේ ඛනිජ සම්පත් නොමැති බැවින් සම්පත් බාහිර ප්‍රභවයන්ගෙන් ලබා ගත යුතුය. ගුණාත්මක, විශ්වාසදායක සහ දැරිය හැකි නිෂ්පාදන කිසිදු බාධාවකින් තොරව දේශීය වෙළඳපොළට සැපයීම සඳහා කොටස් සමාලෝචන කමිටුවේ ක්‍රියාකාරී මැදිහත්වීමත් සමඟ මනාව නිර්වචනය කරන ලද ප්‍රසම්පාදන පිළිවෙත් ක්‍රියාත්මක වේ. ඉරාන සම්බාධකවලින් පසුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මර්බන් තෙල් එහි බොරතෙල් මිශ්‍රණයට යොදා ගැනීම සඳහා යොමුවූයේ මර්බන් තෙල් පහළ නිෂ්පාදනවලට වඩා මධ්‍යම හා සැහැල්ලු ස්කාගාරවල ඉහළ අස්වැන්නක් ලබා දෙන බැවිනි. තවමත් පහළ නිෂ්පාදන ප්‍රතිදානය වැළැක්විය නොහැක.

| ප්‍රසම්පාදන කාණ්ඩය | සම්පූර්ණ කරන ලද ප්‍රසම්පාදන | වටිනාකම (රු. මි) |
|---|---|---|
| පහළ මට්ටමට පවරන ලද ප්‍රසම්පාදන | 747 | 36.4 |
| දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව | 166 | 475.2 |
| අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු | 2 | 264.8 |
| කැබිනට් මණ්ඩලය විසින් පත් කළ ප්‍රසම්පාදන කමිටු | 2 | 8,471.9 |
| එකතුව | 917 | 9,248.3 |

## රජයට ගෙවීම්

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව රජයට විශාලතම බදු ගෙවන්නන්ගෙන් එකක් වන අතර වර්ෂය තුළ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව රු. මිලියන 124,805 (2017 - රු.මිලියන 145,978) ලබා දී ඇති අතර, එය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ශුද්ධ ආදායමෙන් 23.93% කි.

### රජයට දායකත්වය (රුපියල් මිලියන)




වර්ෂය තුළ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් රේගු ගාස්තු ලෙස රුපියල් බිලියන 27.4ක් ගෙවන ලද අතර එය පෙර වර්ෂයට වඩා 47.5% කින් අඩුය. පොදු ජනතාවගේ ජීවන බර සැහැල්ලු කිරීමේ අරමුණ ඇතිව රටේ පවත්නා ඛනිජ තෙල් මිල තත්ත්වයන් පවත්වාගෙන යාම සඳහා රජය විසින් කලින් කලට රේගු බදු සංශෝධන කරනු ලැබේ. තවද නොවැම්බර් මස ඔටෝ ඩීසල් වල රේගු බදු අඩු කිරීමේ හේතුවෙන් දේශීය නිෂ්පාදන බද්ද රුපියල් බිලියන 67.69 ක් දක්වා 1%කින් අඩුවිය.

රු **125** බි
**රජයට දායක වීම**

**917**
**සම්පූර්ණ කරන ලද ප්‍රසම්පාදන ගණන**

රු **9,248** බි
**සම්පූර්ණ කරන ලද ප්‍රසම්පාදන වටිනාකම**

## නිෂ්පාදන වගකීම

දිවයින පුරා විවිධ ප්‍රදේශ වලින් අහඹු ලෙස තෝරා ගන්නා ලද පිරවුම් හල් කිහිපයක් ආරක්ෂක විමර්ශණයක් හා විගණනයක් සිදුකොට කිසියම් අනතුරු දායක තත්ත්වයක් හෝ අඩුපාඩු හඳුනාගැනීමට ක්‍රමවත් වැඩපිළිවෙලක් ආරම්භ කරන ලදි. එහි ප්‍රධාන පරමාර්ථය වූයේ ක්‍රියාපටිපාටි පිළිපැදීම, ආරක්ෂිත ක්‍රියා මාර්ග, ගෘහස්ථ උපද්‍රව හඳුනාගැනීම පිළිබඳ ප්‍රතිචාර හඳුනාගැනීමයි. ප්‍රාදේශිය කලමණාකරුවන්, කළාප කලමණාකරුවන් සහ අනෙකුත් කාර්ය මණ්ඩල පුහුණු කිරීම ද මෙහි අරමුණ විය. මෙම වැඩසටහන සාර්ථක එකක් වූ අතර මෙම ක්‍රමය හරහා බොහෝ ගැටලු හඳුනාගෙන නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරන ලදි. එසේම මෙමගින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ප්‍රාදේශීය නිළධාරීන්, පිරවුම් හල් අයිති කරුවන් සහ එහි සේවකයින් අතර ඉහළ මට්ටමේ උද්යෝගයක් පැවතුණි.

ලංකා රජය විසින් තහනම් කරන ලද කිසිදු නිෂ්පාදනයක් සංස්ථාව අලෙවි නොකරයි. 2019 වර්ෂයේදී ග්ලයිෆොසේට් රට තුළට ආනයනය කිරීමට එකම සහ බලයලත් ආයතනය ලෙස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ග්ලයිෆොසේට් ආනයනය කර විකුණනු ලැබුවේ නියාමකයින් විසින් අනුමත කරන ලද පාරිභෝගිකයින්ට පමණි.

## නිෂ්පාදන හා සේවා සලකුණු කිරීම

සෞඛ්‍ය සහ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ඛනිජ තෙල් නිෂ්පාදන නිවැරදි ලෙස ඇසුරුම් සහ සලකුණු කිරීම ඉතා වැදගත් වේ. එබැවින් නිෂ්පාදන සලකුණු කිරීම සමාජ වගකීමක් ලෙස සැලකිය හැකි අතර, අදාල අරමුණ සඳහා නිවැරදි නිෂ්පාදන භාවිතා කිරීම මෙමගින් තහවුරු වේ. එසේම සලකුණු කිරීම සංස්ථා සන්නාමය පිළිඹිඹු කරන අතර තරගකාරී වෙළඳපොලේ අලෙවි උපකරණයක් ලෙස කටයුතු කරයි.

## අධ්‍යාපනයට සහය දැක්වීම

වගකීම් සහගත සංස්ථායික පුරවැසියකු ලෙස සංස්ථාව සමග ගනුදෙනු කරනු ලබන සමාජ කණ්ඩායම් වල ජීවන තත්ත්වයට සහය ලබාදීමට අඛණ්ඩව කටයුතු කරයි. රටේ එකම බොරතෙල් පිරිපහදු කිරීමේ යන්ත්‍රාගාරය වන සංස්ථා පිරිපහදුවේ පහුණු වීමට රටේ ශිෂ්‍යයින් බෙහොමයක් අපේක්ෂා කරන අතර රටේ අනාගත අභිවෘද්ධිය පිණිස එවැනි සිසුන් වෙත පුහුණු අවස්ථා ලබා දීමට අපගේ නිළධාරීන් තම වටිනා කාලය කැප කරයි.

## ශිෂ්‍යයින් වෙත ලබාදෙන පුහුණුවීම්

**විශ්ව විද්‍යාල සිසුන් වෙත ගෘහස්ථ පුහුණු අවස්ථා ලබාදීම**

**ජාතික ආධුනිකත්ව මණ්ඩලයෙන් පහුණු වන්නන් වෙත මාසික සහ වාර්ෂික ඇගයීම් පවත්වන ලදි**

**ත්‍රිවිධ හමුදා,විශ්ව විද්‍යාල සහ කාර්මික විද්‍යාල සඳහා කාර්මික සංචාර 13ක් ක්‍රියාත්මක කරන ලදි**

සංස්ථා මෙහෙයුම් ශ්‍රී ලංකා ආර්ථිකයට සෘජුව මෙන්ම වක්‍රව ද විශාල වශයෙන් බලපෑමක් එල්ල කරයි. සමස්ත ජාතික ආර්ථික වර්ධනයට සහ ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමට වෙනත් කර්මාන්ත වල ක්‍රියාදාමයන් වක්‍ර ආර්ථික බලපෑමක් සිදු කරයි.

- මහජනතාවට සහන මිල ගණන් යටතේ ඉන්ධන සැපයීම
- වඩාත් කාර්යක්ෂම සහ පරිසර හිතකාමී ගුණාත්මක භාවයකින් යුත ඛනිජ තෙල් නිෂ්පාදන සැපයීම
- ඛණිජ තෙල් නිෂ්පාදනය ලබාගත හැකි ස්ථාන වැඩි කිරීම
- වක්‍ර සේවා නියුක්තිකයින් ඇති කරීම
- දිළිඳු ගොවි ජනතාව සුරාකෑම වැළැක්වීම සඳහා අඩු මිල ගණන් යටතේ කෘෂි රසායන ලබාදීම

## පිරිපහදු කළ නිෂ්පාදන ආනයනය

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් සැපයුම් කරුවන් හරහා ඩොලර් මිලියන 1955ක් (DAP පදනම) වටිනා පිරිපහදු කළ නිෂ්පාදන රටට ආනයනය කරන ලද අතර, ආනයන තොරතුරු පහත පරිදි වේ.




මීට අමතරව වසර තුළ දී ලංකා ඛනිජ තෙල් සංස්ථාව විසින් ඇමරිකානු ඩොලර් මිලියන 1024ක් (DAP පදනම) වටිනා බොරතෙල් ආනයනය කරන ලදි.

## ව්‍යාපාර හවුල්කාරීත්වය

පාරිභෝගිකයින්ට නිෂ්පාදන ලබා ගතහැකි බව සහතික කරමින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සියලුම පළාත් පුරා බෙදාහැරීමේ පිරවුම්හල් 1278ක් ක්‍රියාත්මක කරයි. වෙළඳපොල ප්‍රමුඛයා ලෙස ප්‍රදේශය නොසලකා නිෂ්පාදන සඳහා ප්‍රවේශය පවත්වා ගැනීම සඳහා ඉන්ධන බෙදාහැරීමේ ජාල පුළුල් ලෙස ආවරණය කිරීමට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූලික අවධානය යොමු කරයි.

## පළාත් වශයෙන් පිරවුම්හල්

| | |
|---|---|
| බස්නාහිර | 307 |
| උතුර | 184 |
| වයඹ | 181 |
| නැගෙනහිර | 146 |
| දකුණ | 142 |
| මධ්‍යම | 105 |
| උතුරු මැද | 84 |
| සබරගමුව | 78 |
| ඌව | 51 |
| එකතුව | 1278 |

# බුද්ධිමය ප්‍රාග්ධනය

බුද්ධිමය ප්‍රාග්ධනය සමන්විත වන්නේ සංස්කෘතික, ආචාර ධර්ම, සාරධර්ම, ආයතනික දැනුම, පද්ධති, ක්‍රියාවලි සහ ක්‍රියා පටිපාටි, ඉගෙනුම සහ වෙළෙඳනාම වටිනාකම හා සම්බන්ධ කරුණු වලිනි.

## අපගේ වෙළඳ නාමය

වසර 58කට වැඩි ඉතිහාසයක් ඇති අපගේ වෙළඳ නාමය රජයේ ව්‍යවසායක් ලෙස ඛනිජ තෙල් නිෂ්පාදන ජනතාවගේ ජීවන වියදමේ ප්‍රධාන කොටසකි. අප යටතේ ඇති සාධාරණ වෙළඳාමෙන් ලාංකික ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීමෙන් ජනතාවට සමීප වේ.

## අපගේ වටිනාකම

සංස්ථාවේ සංස්කෘතිය තුළ ගොඩනගා ඇති සාරධර්ම ආචාර ධර්ම ප්‍රමිතීන් සහ සංස්ථාව සතුව ඇත. අපගේ නිෂ්පාදන රට පුරා සිටින සෑම පුද්ගලයෙකුගේම ජීවන වියදමට හා ජීවන තත්ත්වයට බලපාන හෙයින් ජනතාවට නිසි නිෂ්පාදනයක් සහ නිෂ්පාදනයට ප්‍රවේශයක් ලබාගතහැකි බවට කැපවීම සඳහා අපි සම්පූර්ණ ප්‍රමිතිගත නිෂ්පාදන පවත්වා ගනිමු. ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා වන ප්‍රමිතතීන් සංස්ථාව සෑම විටම අනුගමනය කරයි. අපගේ පාලනය හා පර්යේෂණ අංශ ස්වභාව ධර්මයට කිසිදු බලපෑමක් නොකර නිෂ්පාදන සහ සේවා සංවර්ධනය සඳහා ක්‍රියාකාරීව දායක වනු ලැබේ.

## ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම

ගුණාත්මක ද්‍රව තාර සැපයීම සහ තාර වෙළඳපොල නැවතත් ලබාගැනීමේ අරමුණ පෙරදැරි කරගෙන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ද්‍රව තාර නිෂ්පාදනය නැවත ආරම්භ කරන ලදි. ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ දැවි තෙල් භාවිතයෙන් පිරිපහදුව හරහා ද්‍රව තාර තොග නිෂ්පාදනය කිරීම ආරම්භ කරන ලදි.

ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සඳහා අඩු වියදමකින් උසස් තත්ත්වයේ තාර තොග නිෂ්පාදන සැකසීමට මෙම ක්‍රියාවලිය උපකාරී වේ. ද්‍රව තාර තොග නිෂ්පාදනය මගින් නැති වූ වෙළඳපොල කොටස නැවත ගෙනඒමට හැකි වූ අතර 2017 දී තාර විකුණුම් වල අලාභ තත්ත්වය රුපියල් මිලියන 110ක ලාභයකට ගෙනඒමට හැකිවිය.

කූපන්පත් බෙදාහැරීමේ ක්‍රියාවලිය අවම කිරීම සහ විවිධ රාජ්‍ය හා පෞද්ගලික ගනුදෙනු කරුවන්ට ඔවුනගේ ඉන්ධන මිලදී ගැනීම විධිමත් කිරීම සඳහා ඵලදායී සේවාවක් සැපයීම පිණිස පරිපූර්ණ ක්‍රියාවලිය සඳහා වැඩිදුයුණු කළ පද්ධතියක් සකස් කරන ලදි. නව ක්‍රමය මගින් කූපන් ආරක්ෂිත තත්ත්වය ඉහළ නංවන අතර එය නිරවද්‍යතාව සහතික කිරීමට සහ ඉන්ධන නිකුත් කිරීමට වෙළෙඳුන්ට උපකාරී වේ. වෙළෙඳුන්ට ඉතා කෙටි කාලයක් තුළ අරමුදල් නිදහස් කිරීම සඳහා පද්ධතිය, පරිපූර්ණ කිරීමේ ක්‍රියාවලිය වේගවත් කරයි.

## අඛණ්ඩ පුහුණුව හා සංවර්ධනය

වර්ථමාන ව්‍යාපාරික පරිසරය තුළ ඕනෑම ආයතනයක වැදගත් අස්පෘෂ වත්කමක් ලෙස දැනුම පදනම් කරගෙන සෑදී ඇත. දැනුම පදනම් කරගත් සංවිධානය නිර්මාණය කිරීම ප්‍රධාන උපාය මාර්ග යක් බැවින් ඔවුන්ගේ යුතුකම් හා වගකීම් ඉටුකිරීම සඳහා ඔවුන්ගේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා විවිධ පුහුණු අවස්ථා ලබාදීමෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව දැනුම පදනම ගොඩනඟාග නී. වසර 20කට වඩා වැඩි සේවා කාලයක් ඇති සෙවකයින් 874 දෙනෙකු සංස්ථාවේ සේවය කරයි. තවද පවතින ශ්‍රම බලකායේ සමුච්චිත සේවා පළපුරුද්ද වසර 39,200 ඉක්මවා ඇත. සංස්ථාවේ දැනුම පදනම් කරගැනීම මෙමගින් පෙන්නුම් කෙරේ. සංස්ථාවේ පුහුණුව හා උපකාරක සංස්කෘතිය සේවකයින්ගේ දැනුම පවත්වාග ැනීමට වගබලාගනී.



පිරිපහදුවේ තාර නිෂ්පාදනය

**874**

අවුරුදු 20 ට වැඩි පළපුරුද්ද සහිත සේවකයින් සංඛ්‍යාව

**39,200** වර්ෂ

සමුච්චිත සේවා පළපුරුද්ද

රු **9.9** මි

දේශීය පුහුණු පිරිවැය

# ස්වභාවික ප්‍රාග්ධනය

අපි පරිසරය සමග ජීවත් වන අතර එය ආරක්ෂා කිරීමට බැඳී සිටිමු. සංස්ථාව සිය වගකීම පවත්වාගෙන ගියේ හොඳ පුරුදු අනුගමනය කිරීමෙන් වන අතර ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ක්‍රියාකාරකම් සමාජයේ විශාල පිරිසකට බලපාන බැවින් සීමිත සම්පත් තිරසාර ලෙස භාවිත කරමින් පරිසරය පිළිබඳ සිය සේවකයින් පුහුණු කිරීමට කැපවී සිටියි.

## කසළ කළමනාකරණය

කසළ කළමනාකරණය සහ වායු විමෝචනය පිළිබඳ සංස්ථාව බෙහෙවින් සැලකිලිමත් වේ. 2018 වර්ෂය තුළ අපජල පවිත්‍රාගාරයක් ඉදිකිරීම ආරම්භ කරන ලදී. ISO ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන යටතේ සංස්ථාවේ දූෂිත හා අපවිත්‍ර නොවන අපද්‍රව්‍ය වෙන්කිරීමේ අප ජල කළමනාකරණ පද්ධතිය වැඩි දියුණු කරන ලදී.

## ජලය

මෙම වර්ෂයේ දී සැලකිය යුතු ප්‍රමාණයක ජලය ජල පිරිපහදුවෙන් ලබාගන්නා ලද අතර ඉතිරි ජලය ජලසම්පාදන මණ්ඩලයෙන් ලබා ගන්නා ලදී.

වර්ෂය තුළ පිරිපහදුව මගින් ජල පරිභෝජනය පහත දැක්වේ.

| | 2018 | 2017 |
|---|---|---|
| පිරිපහදු කළ ජලය | 767,540 MT | 558,564 MT |
| ජල සම්පාදන මණ්ඩලය | 164,718 MT | 179,728 MT |
| එකතුව | 932,258 MT | 738,292 MT |

## පිරිපහදු මෙහෙයුම්වල බලශක්ති පරිභෝජනය

| | 2018 | 2017 |
|---|---|---|
| ඉන්ධන සහ ගෑස් පරිභෝජනය | 43,117 MT | 37,616 MT |
| දැවි තෙල් පරිභෝජනය | 48,886 MT | 51,989 MT |
| නිශ්චිත බලශක්ති පරිභෝජනය | 0.5510 | |

යුරෝ 04 වෙළඳපොළ වෙත හඳුන්වා දීම




932,258 මෙ.ටො
ජල පරිභෝජනය

52.5 %
සාමාන්‍ය පාඩුව අඩු කිරීම

0.55 බොරතෙල් MMK CAL /MT
විශේෂිත බලශක්ති පරිභෝජනය




බලශක්ති පරිභෝජනය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පිරිවැය ව්‍යුහයට මෙන්ම වායු විමෝචනය තුළින් පරිසරයටද බලපායි. අපේක්ෂිත සාමාන්‍ය අලාභය 2018 වසරේදී 52.5 %කින් (මෙ. ටො 11847 සිට මෙ.ටො 5627 දක්වා )අඩුවී ඇත.

සාමාන්‍ය පැය වලදී පිරිපහදුව සඳහා බලශක්ති පරිභෝජනය (CEB සැපයුම ) මෙගාවොට් පැය 197.0 ත් 274 .0 ත් අතර විය. උපරිම වේලාවන්හිදී මසකට බලශක්ති පරිභෝජනය මෙගාවොට් පැය 54.9ත් මෙගාවෙට් 81.0ත් අතර වේ. CEB සැපයුමේ උපරිම ඉල්ලුම 1216 KVA සිට 1421 KVA දක්වා වෙනස් වේ .

## සිදුකරන ලද පරිසර හිතකාමී ක්‍රියාකාරකම්

පරිසර හිතකාමී නිෂ්පාදන වෙළඳපොලට සැපයීමට සංස්ථාව සෑම විටම උත්සාහ කරනු ලබයි. එබැවින් වඩා කාර්යක්ෂම සහ පරිසර හිතකාමී නිෂ්පාදනයන් සහතික කිරීම සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව යූරෝ 4 ඔටෝ ඉන්ධන වෙළඳපොලට හඳුන්වා දෙන ලදි.

## ජෛව විවිධත්වය

තෙල් කාන්දුවීම, ඉන්ධන මගින් විමෝචනය වන වායු හරහා ජෛව විවිධත්වය කෙරෙහි සංස්ථා මෙහෙයුම් මගින් අහිතකර බලපෑමක් ඇති කරනු ලැබිය හැකිය. මේ සඳහා දැඩි මෙහෙයුම් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක වන අතර ජෛව විවිධත්වයට සිදුවන අහිතකර බලපෑම් අවම කිරීමට අවශ්‍ය පූර්වෝපායන් සහ ආරක්ෂණ මිනුම් සංස්ථාව විසින් ගෙන ඇත.

| විස්තරය | ජෛව විවිධත්වයට බලපෑම |
|---|---|
| ජනාවාස පරිවර්තනය | එවැනි දත්ත කිසිවක් වාර්තා වී නැත |
| ස්වභාවික වෙනස්කම් වලින් පරිබාහිරව පාරිසරික ක්‍රියාවලීන් හි වෙනස්වීමක් | එම |
| බලපෑමට ලක් වූ විශේෂ | එම |
| බලපෑමට ලක් වූ ප්‍රදේශවල ප්‍රමාණය | එම |
| බලපෑම්වල කාල සීමාව | එම |
| බලපෑම් වලට ආපසු හැරවීමේ හැකියාව හෝ ආපසු හැරවිය නොහැකි බව | එම |

## අනුකූලතාව

මෙම වර්ෂයේදී සංස්ථාව විසින් කිසිදු සැලකිය යුතු ආකාරයේ දඩ ගෙවීමක් සිදු කර නොමැති අතර පාරිසරික නිති හෝ රෙගුලාසි සමග අනුගත නොවීමක් හෝ මූල්‍යමය නොවන සම්බාධක වලට යටත්වීමක් වාර්තා වී නොමැත.

# පාර්ශව කරුවන්ගේ සහභාගීත්වය සහ ආනාගත දර්ශනය

## පාර්ශව කරුවන්ගේ සහභාගීත්වය

| පාර්ශව කරුවන්ගේ කාණ්ඩය | සම්බන්ද වීමේ යාන්ත්‍රණය | පාර්ශවකරුවන්ගේ බලය සහ උනන්දුව |
|---|---|---|
| රජය සහ නියාමකයින් | ▪ රජයට සහ නියාමකයින්ට වරින් වර සාකච්ජා කිරීම සහ වාර්ථා කිරීම ඛනිජ තෙල් නිතිගත සංස්ථාවේ කාර්යසාධනය සහ අනුකූලතාවය පිළිබඳ වාර්තා කිරීමේ පද්ධතිය<br>▪ රජය මුලය/ සර්ව ආර්ථික තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා කාලෝචිත තොරතුරු රජයට ඉදිරිපත් කිරීම | ඉහල |
| පාරිභෝගිකයින් | ▪ නිෂ්පාදන ප්‍රවර්ධන වැඩසටහන් පිරවුම් හල් හරහා සම්බින්ධ වීම<br>▪ පාරිභෝගික තෘප්තිය පිළිබඳ සමීක්ෂණ<br>▪ නාලිකා හරහා සන්නිවේදනය<br>▪ ප්‍රාදේශීය කාර්යාල මගින් මාර්ගගත සහ දේශීය සම්බන්ධතා | මධ්‍යස්ථයි |
| සේවකයින් | ▪ කාර්යසාධන ඇගයීම්<br>▪ සේවක නියුක්තවීමේ කටයුතු<br>▪ වෘත්තීය සමිති සමග කටයුතු<br>▪ ක්‍රීඩා සහ වෙනත් ක්‍රියාකාරකම්<br>▪ කාර්ය මණ්ඩලයට සුබසාධන පහසුකම් | ඉහල |
| ප්‍රජාව | ▪ ප්‍රාදේශීය කාර්යාල කටයුතු<br>▪ සාමූහික සමාජ වගකීම් සහ අනුග්‍රාහකත්වය<br>▪ මාධ්‍ය සහ වෙනත් සමාජ සිදුවීම් | ඉහල |
| සැපයුම්කරුවන් සහ සේවා සපයන්නන් | ▪ විනිවිද පෙනෙන ලංසු තැබීමේ ක්‍රියාවලිය<br>▪ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය<br>▪ සාමාන්‍ය රැස්වීම්,ලිඛිත සංන්නිවේදන සහ සම්බන්ධතා කලමනාකරණය | මධ්‍යස්ථයි |

## අනාගත දර්ශනය

ඛනිජ තෙල් නිෂ්පාදනය සඳහා පිරිවැය පරාවර්තික විනිවිද පෙනෙන ඉන්ධන මිල යාන්ත්‍රණය, ලංකා ඛනිජ තෙල් සංස්ථාවට සිදුවන පාඩුව අවම කිරීමට උපකාරී වේ. කෙසේ වෙතත් පවත්නා සූත්‍රය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් දරනු ලබන සම්පූර්ණ පිරිවැය ආවරණය නොකරයි. තවද රජයේ සහනාධාරය ප්‍රමාදයකින් තොරව පියවා ගැනිමට අප බලාපොරොත්තු වන අතර රජය මේ සඳහා යම් ක්‍රමයක් ආරම්භ කරනු ඇතැයි අප බලාපොරොත්තු වෙමු.

තරගකාරී මිල ගණන් යටතේ එක්සත් ජනපද ඩොලර් මිලදී ගැනීමට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට නිදහස ලබාදෙන්නේ නම් එමගින් එහි ලාභදායකත්වය ඉහළ නැංවිය හැකිය. ඛනිජ තෙල් ගවේෂණය කිරීමට රජය සමත් වූ පසු සහ ගෑස් සෙවීමේ ක්‍රියාවලිය ඵලදායී වූවිට දේශීය ගෑස් භාවිතයට හැකි වනු ඇතැයි අපේක්ෂා කරන අතර ආනයනය කිරීම සීමිත වේ.

පිරිපහදුව නවීකරණය කරන්නේනම් ගබඩා ධාරිතාව නොමැති කම හේතුවෙන් දැවි තෙල් සහ නැප්තා අලෙවියෙන් සිදුවන පාඩුව වළක්වා ගැනීමේ හැකියාව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතුවේ. ඒ සඳහා රජයේ සහතිකයක් සහිත බාහිර අරමුදල් සඳහා ප්‍රතිපත්තිමය තීරණයක් ගතයුතු වේ. ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා වන ඉල්ලුම අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා පිරිවැය අවම කරන අතරම සංස්ථාව ශ්‍රම බලකාය හා කාර්යක්ෂමතාවය කෙරෙහි අවධානය යොමු කරනු ඇත. වෙළඳපොල ප්‍රමුඛයා ලෙස පවත්වා ගැනීම සඳහා උපාය මාර්ගික ප්‍රමුඛතා ක්‍රියාත්මක වන අතර පොදු ව්‍යාපාරයක් ලෙස රාජ්‍ය උපස්ථිය උපයෝගී කර ගැනීමට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව බලාපොරොත්තු වේ.

පරිසර හිතකාමී නව පලිබෝධ නිෂ්පාදන හඳුන්වාදීමෙන් කෘෂි අංශය පරිසර හිතකාමී ලෙස දියුණු කිරිමට සැලසුම් කරයි. ලාභදායී නිෂ්පාදන බවට පරිවර්ථනය කිරිමට හැකිවන පරිදි කටයුතු කිරීමෙන් පාඩු ලබන තත්ත්වය වළක්වා ගත හැකිය.

අනෙක් අතට ඉල්ලුම අඩු කාල වලදී අතිරික්ත නිෂ්පාදනයන්ට ඉඩසැලසීමට හා ජාත්‍යන්තර වෙළඳපොල මිල පහත වැටෙන විට බොරතෙල් ගබඩා කිරීමට ගබඩා ධාරිතාව ඉහළනැංවිය යුතුය.






# අවදානම් කළමනාකරණ වාර්තාව

# අවදානම් කළමනාකරණ වාර්තාව

විචල්‍ය සමාජ, දේශපාලනික සහ ආර්ථික පරිසරයක් තුළ මෙරට විශාලතම ඛනිජ තෙල් නිෂ්පාදන සැපයුම්කරු ලෙස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මෙහෙයුම් වල අන්තර් ගත කොටසක් බවට අවදානම් කළමනාකරණය පත්ව ඇත.

## අවදානම් කළමනාකරණයේ කාර්යභාරය

- පරිසරය, වෙළඳපොල සහ අභ්‍යන්තර අර්බුදවලට ගොදුරු වීමෙන් සංස්ථාව ආරක්ෂා කර ගැනීම.
- මනා සමතුලිත වර්ධනය සහ අවදානම.
- දිගු කාලීන පැවැත්ම සහතික කිරීම.
- ගින්දර හෝ අනතුරු වැනි හානිදායක තත්වයන්ගෙන් අපගේ සේවකයන්, පාරිභෝගිකයින්, සාමාන්‍ය ජනතාව සහ සංස්ථාවේ වත්කම් ආරක්ෂා කිරීම.

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අවදානම් කළමනාකරණ කාර්ය රාමුව.




ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පනත, මුල්‍ය පනත සහ මුල්‍ය රෙගුලාසි, යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශයන්, රාජ්‍ය ව්‍යවසායනයන් සඳහා හොඳම භාවිතයන්, වෙනත් නියාමන කටයුතු.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අවදානම් කළමනාකරණ කාර්ය රාමුව සකසා ඇත්තේ සංස්ථාවට බලපාන ප්‍රධාන අවදානම් හඳුනනාගෙන ගෙන ඒවා විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව අවහිරතාවයකින් තොරව ජාතියට බලශක්ති සැපයුම ලබාදීමේ අරමුණ ඇතිව ඒ අවදානම් ඵලදායී අයුරින් කළමනාකරණය කිරීම සඳහායි. එමගින් ඵලදායී සැලසුම්කරණය සහ තීරණ ගැනීම සඳහා පසුබිම සැකසෙන පරිදි සිය අනාගත ක්‍රියාකාරකම් අඛණ්ඩව ක්‍රියාත්මක වන සහ පාලනයකින් යුත් ආකාරයට සිදුකිරීමට සංස්ථාවට හැකියාව ලැබෙයි.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අවදානම් කළමණාකරනය අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සවිමත් ආරක්ෂක ක්‍රම දෙකක් මගින් වඩාත් සවිගැන්වී ඇත.

## අභ්‍යන්තර පාලන පද්ධතිය සහ අභ්‍යන්තර හා බාහිර විගණනය

වර්ෂ 1961 අංක 28 දරණ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත, වර්ෂ 1971 අංක 38 දරණ මුදල් පනත, මුල්‍ය රෙගුලාසි, යහපාලනය පිළිබද මාර්ගෝපදේශයන්, රාජ්‍ය ව්‍යාපාර සඳහා වන ප්‍රශස්ථ ක්‍රම වේදයන් සහ තවත් විවිධ නියාමයන් මගින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අවදානම් කළමණාකරණ කාර්ය රාමුවට සවිමත් පදනමක් ස්ථාපිත වී ඇත.

### අභ්‍යන්තර පාලන පද්ධතිය

ඉහත සඳහන් වු පනත් වලට අනුකූලව සැලසුම්කරන ලද අර්ථ දක්වන ලද ප්‍රතිපත්ති සහ ක්‍රමවේදයන් සහිත පරිපූර්ණ අභ්‍යන්තර පාලන පද්ධතියක් සංස්ථාව සතුව ඇත. එමගින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා සම්බන්ධ අවදානම් හදුනාගැනීමට කළමනාකරණය කරගැනීමට සහ වළක්වා ගැනීමට සංස්ථාවට හැකියාවක් ලැබේ.

### අභ්‍යන්තර හා බාහිර විගණනය

අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේ දි අභ්‍යන්තර හා බාහිර විගණනය වැදගත් කාර්යභාරයක් ඉටුකරයි. අභ්‍යන්තර හා බාහිර විගණකවරුන් විසින් ඔවුන් හඳුනාගන්නා අවදානම් කළමනාකරණය කරගැනීම විසඳුම් ක්‍රියාමාර්ගයන් හා වැඩි දියුණු කිරීම් නිර්දේශ කිරීම සඳහා මූල්‍ය හා වෙනත් මෙහෙයුම් පද්ධතිවල සැකැස්ම හා ඵලදායිතාවය පරීක්ෂා කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිහිටවනු ලබන විගණන කමිටුව මගින් වැදගත් විගණන තොරතුරු හා කළමනාකරණ ප්‍රතිචාර විමසුමට ලක්කෙරේ.

අවදානම් කළමනාකරණය කිරීම සඳහා වන උපාය මාර්ගයන් අවදානම් කළමනාකරණය සඳහා සංස්ථාව විසින් යොදවනු ලබන උපාය මාර්ගයන් අවදානමේ ස්වභාවය සහ බරපතලකම මත රඳා පවතී. අවදානමක් හඳුනාගත් විට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් පහත දැක්වෙන ක්‍රම අනුගමනය කරනු ලබයි.

- එය සිදුවීමේ හැකියාව වළක්වා ගැනීම, හෝ
- අවදානම වෙනත් පාර්ශවයකට මාරු කිරීම, හෝ
- අවදානමේ ප්‍රතිඵල භාරගෙන ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පාලන ව්‍යුහය

සංස්ථාවේ අවදානම් කළමනාකරණ කාර්ය රාමුවෙන් ඵලදායිත්වය සඳහා මනාව නිර්වචනය කරන ලද පාලන ව්‍යුහයක සවිමත් බව සපයයි. අවදානම් කළමනාකරණයේ ඉහලම වගකීම සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් යුතු අධ්‍යක්ෂ මණ්ඩලය සතුව පවතින අතර එය අධ්‍යක්ෂක මණ්ඩල සහ විධායක මට්ටම් වල පාලන කමිටු මගින් එය තව දුරටත් ශක්තිමත් කරනු ලැබේ. එම කමිටු පැහැදිලිව අර්ථ දක්වා ඇති කාර්යභාරයන් හා වගකීම් සහිතව ක්‍රියාත්මක වේ. පාලනය සම්බන්ධයෙන් මේ වාර්ථාවට ඇතුලත්ව ඇති කොටසෙහි පාලන ව්‍යුහය පිළිබඳ තව දුරටත් විස්තර කෙරේ.

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මුහුන දෙන අවදානම්.

සංස්ථාව මුහුන දෙන අවධානම් සහ ගනු ලබන අවධානම් කළමනාකරණ පියවර සමග අවධානම තවදුරටත් අවම කිරීම සඳහා වන යෝජනා පිළිබඳ කෙටි විස්තරයක් පහත දක්වා ඇත.

| අවදානම | බලපෑම | ප්‍රතිචාරය | යෝජනා |
|---|---|---|---|
| **ආර්ථික අවදානම** | | | |
| රටේ උද්ධමන අනුපාත මගින් සංස්ථාවට පීඩනය එල්ල වෙයි. ඛනිජ තෙල් නිෂ්පාදන සැපයීම සඳහා වන වෙළඳපොල ප්‍රමුඛයා මෙන්ම රජයට අයත් ආයතනයක් ලෙස ලාභ ඉපයීමට වඩා සමාජ හා ආර්ථික තත්ත්වයන් සපුරාලීම සඳහා අධික ලෙස සහනාධාර ලබා දීම යටතේ ඇතැම් ඛනිජ තෙල් නිෂ්පාදන සපයනු ලැබේ. ඛනිජ තෙල් වල මිල සුළු වෙනස් කිරීම් මගින් වුවද සමස්ථ ආර්ථිකයටම අතිවිශාල බල පෑමක් එල්ල වේ. | උද්ධමන අනුපාතය වැනි ඍනාත්මක ආර්ථික සාධක මගින් පිරිවැය ඉහළ නංවන අතරම ආදායම පහළ දමමින් ලාභ තත්වයන් අහිමි කරවයි. | පිරිවැය පාලන ක්‍රම උපයෝගී කිරීම. එමෙන්ම පිරිවැය හා සමාජ ආර්ථික තත්වය අතර සමබරතාවයක් ඇතිකරීම. | විශේෂයෙන් භූමිතෙල් සම්පූර්ණ පිරිවැය නියෝජනය වන මිල යන්ත්‍රාණයක් හඳුන්වාදීම. |
| **පාරිභෝගික භාණ්ඩ මිල අවධානම** | | | |
| ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් සංචිත නොමැති අතර බලශක්ති අංශයෙන් සැලකියයුතු කොටසක් සපයනු ලබන්නේ ඛනිජතෙල් මගිනි. එ බැවින් මිල ගණන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පාලනයෙන් බැහැරව මුළුමනින්ම සැපයුම් කරුවන් අත රැඳී පවතී. | ලෝක තෙල් මිල ගණන් ඉහල යෑම විකුණුම් ලාභ සීමාවන් සහ මුදල් තත්වය කෙරෙහි අයහපත් ලෙස බලපායි | රටේ පවතින තොගවල තත්ත්වය නිරන්තරයෙන් අධීක්ෂනය කරනු ලබන තොග විමසුම් කමිටුව ගෝලීය මිල උච්චාවචනයන්, ප්‍රවණතා සහ මිල ආශ්‍රිත අවස්ථා විශ්ලේෂණය කිරීමෙන් පසු මිලදී ගැනීම් ප්‍රශස්ත මට්ටමට ගෙන ඒමට කට යුතු කරයි. | සමස්ත පිරිවැය නියෝජනය කරන මිල යන්ත්‍රණයක් හදුන්වා දිය යුතුයි. ලෝක වෙළඳපොලේ මිල ගණන් පහත වැටුණු විට තොග ගබඩා කිරීමට ගබඩා ධාරිතාවය වැඩිකල යුතුය. |
| **නිෂ්පාදන අවදානම** | | | |
| පිරිපහදු කල නිෂ්පාදන ලබා ගැනීම සඳහා බොර තෙල් දේශීය වශයෙන් සකසනු ලැබේ. | නිමවුමේ ගුණාත්මක භාවය සහ නාස්තිය මගින් ලාභදායිත්වයට බලපෑම් එල්ල වෙයි. | පිරිපහදුවේ කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා ධාරිතාව සහ පිරිපහදු තාක්ෂණය ප්‍රශස්ත මට්ටමට පත්කළ යුතුයි. | පිරිපහදු මෙහෙයුම් ඉහල නැංවීම. පිරිපහදු කළ නිෂ්පාදන ප්‍රමාණයන් ගබඩා ධාරිතාව වැඩිකිරීම. |

# සංවර්ධනය උදෙසා බල ගැන්වීම

| අවදානම | බලපෑම | ප්‍රතිචාරය | යෝජනා |
|---|---|---|---|
| **මෙහෙයුම් අවදානම** | | | |
| ක්‍රියාවලි සහ පද්ධතිවල කාර්යක්ෂමතාව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මෙහෙයුම් වල ඵලදායීතාවයට බලපායි. | පාලනයක් නොමැති වීම හෝ අකාර්යක්ෂම පාලනයන් සහ පද්ධති බිඳවැටීම මගින් සම්පත් මෙන්ම කාලය ද විශාල වශයෙන් අපතේ යන අතර එමගින් සැපයුම් සම්බන්ධ විනිවිද භාවය අඛණ්ඩතාවයට සහ ගුණාත්මකතාවය මෙන්ම සමස්ත ඵලදායිතාවය කෙරෙහි බලපායි. | ■ පැහැදිලිව අර්ථ දක්වන ලද මෙහෙයුම් අවදානම් කළමනාකරණතා ප්‍රතිපත්තියක් ස්ථාපිත කර ක්‍රියාත්මක කළ යුතුයි.<br>■ මෙහෙයුම් ගැටළු වහාම විසඳීම සඳහා පවත්නා විගණන ක්‍රියාවලීන් යොදාගැනීමට අඛණ්ඩව පවත්වාගෙන යා යුතුයි.<br>■ උපායමාර්ගික ව්‍යාපාර සඳහා රජය විසින් ස්ථාපිත කරන ලද සම්මුතීන් සහ ක්‍රම වේදයන් අඛණ්ඩව පවත්වාගෙන යා යුතුයි. | පවතින නවතම තාක්ෂණය මෙන්ම විගණන ශිල්ප ක්‍රම නිසිලෙස භාවිතයට ගැනීමට හැකි වන පරිදි සැකසුම් පාලන පද්ධති යාවත්කාලීන කර එමගින් පුද්ගලික අංශය සමඟ උරෙන් උර ගැටී තරග කිරීමට සංස්ථාවට හැකියාව ලබාදීම. |
| **ආරක්ෂක අවදානම** | | | |
| සංස්ථාව විසින් හසුරුවනු ලබන ඉතා ඉහළ විචල්‍යතාවයකින් යුතු නිෂ්පාදන සඳහා දැඩි ආරක්ෂක ප්‍රමිතීන් අවශ්‍ය වේ. | ආරක්ෂක ප්‍රමිතීන් පිළිබඳ අවධානය නොමැති වීමෙන් ව්‍යාපාර මෙහෙයුම් කෙරෙහි බලපෑම් එල්ල වන අතර සංස්ථාවේ මිනිස් ජීවිත හා භෞතික වත්කම් අනතුරට පත් කෙරේ | ■ ආයතනික සෞඛ්‍ය හා ආරක්ෂාව සම්බන්ධ ප්‍රතිපත්ති හා ක්‍රමවේදය නිවැරදිව පවත්වාගත යුතුය<br>■ අවදානම් අවම කර ගැනීම හෝ දුරුකිරීම සම්බන්ධ නිතිපතා පුහුණුව සේවකයින්ට ලබාදිය යුතුය | සියලු සේවකයින් සඳහා අඛණ්ඩ පුහුණු අවස්ථා පෙළක් ස්ථාපිත කළ යුතුය. |
| **වෙළෙඳපොළ අවදානම** | | | |
| ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව යනු පුද්ගලික අංශයේ එක් තරගකරුවකු පමණක් සිටින වෙළඳපල තුල තරගකාරී ප්‍රමුඛතමයෙකි. | තරගකාරීත්වය මෙන්ම සාර්ව ආර්ථික තත්ත්වයන් සම්බන්ධයෙන් පාරිභෝගිකයන් අතර ඇති ආකල්ප වෙනස්වීම මගින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ආදායම් සීමාවන් සහ මුදල් තත්ත්වයට බලපෑම් එල්ල වේ. | ■ නිෂ්පාදන විවිධාංගීකරණය කළ යුතුයි.<br>■ පාරිභෝගිකයින් සමග තිරසර ගිවිසුම් ඇතිකර ගත යුතුයි.<br>■ ණය කරුවන්ගෙන් කෙරෙන එකතු කිරීම් වැඩිකර ගත යුතුයි | රජයේ ආයතනවලින් ලැබිය යුතු ගෙවීම් පාලනය ඇතුළු ණය පාලනය ඉහළ නැංවීම. |
| **මානව සම්පත් අවදානම** | | | |
| ඉහළ ගුණාත්මකභාවයකින් යුත් කාර්ය මණ්ඩලයක් ආකර්ෂණය කර ගැනීම, බඳවා ගැනීම පුහුණු කිරීම, සහ රඳවා ගැනීම දියුණු වෙමින් පවතින කර්මාන්තයක සෑම විටම නොවෙනස්ව තිබිය යුතු අවශ්‍යතාවයකි. මිනිස් ශ්‍රමය ආශ්‍රිත නීතිමය ගැටළු මතුවීම අඩු කරන හෝ නැත්තටම නැති කරන අතරම මානව සම්පත් උපරිම ප්‍රශස්ත බවින් යුතුව පවත්වා ගැනීම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සඳහා අභියෝගයන්ය. | ප්‍රවණතාවක් නොවන නුසුදුසු ලෙස ස්ථානගත කර ඇති හෝ නුසුදුසු ශ්‍රම සංයුතියක් මගින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මෙහෙයුම් කාර්යක්ෂතාවයන් සහ එමගින් ඛනිජ තෙල් නිෂ්පාදනවල ගුණාත්මක භාවය මෙන්ම පිළිගැනීම කෙරෙහි අහිතකර අයුරින් බලපෑම් එල්ල වෙයි. මානව සම්පත් සම්බන්ධ නීති ගැටලු යනු ලංකා ඛනිජ තෙල්නීතිගත සංස්ථාවට අනවශ්‍ය පිරිවැයකි. | ■ ශක්තිමත් පුහුණු යාන්ත්‍රනයක් ස්ථාපිත කිරීම<br>■ සාධාරණ සේවය මගින් සේවක සබඳතා ගොඩ ගොඩනගා ගැනීම සඳහා සේවකයින් සමඟ දෙපාර්ශවයටම වාසි සැලසෙන සහභාගිත්වය යාන්ත්‍රණයන් සහ නිෂ්පාදනයක් ස්ථාපිත කළ යුතුය.<br>■ පීඩාකාරී මට්ටම් පහත දැමීම සඳහා සේවක සුභ සුබසාධන, දිරි දීමනා සහ වෙනත් ප්‍රතිලාභ සැලසුම් ස්ථාපිත කළ යුතුයි. | වරදක් සඳහා ලබාදෙන දඬුවම සේවකයින්ට එකම අයුරින් පැහැදිලි වන ලෙස ඉදිරිපත් කරන අතරම කාර්ය සාධන පදනම් කරගත් ප්‍රසාද ඇගයීම් සහ උසස්වීම් ක්‍රමයක් හා හඳුන්වා දිය යුතුයි. |
| **තොරතුරු තාක්ෂණ අවදානම** | | | |
| නූතන සහ ඛනිජ තෙල් අංශයේ ව්‍යාපාරික මෙහෙයුම් සඳහා තොරතුරු හුවමාරු සහ සාක්ෂි පදනම් කරගත් තත්කාලීන තීරණ ගැනීම ඉතා වැදගත් වේ. මේ සඳහා අරමුණට ඉතාම වැදගත් වන නවතම තාක්ෂණය අඛණ්ඩ පදනමකින් යුතුව යොදා ගැනීමට අවශ්‍ය වේ. | අවිධිමත් දත්ත සහ තොරතුරු එක්රැස් කිරීම මෙන්ම දත්ත වල නිරවද්‍යතාවය හා ආරක්ෂාව නොසලකා කටයුතු කිරීමට සංස්ථාවේ මෙහෙයුම් කාර්යක්ෂමතාව කෙරෙහි අහිතකර ලෙස බලපායි. | ■ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සිය ගනුදෙනු වාර්තා කිරීම සඳහා SAP පද්ධතිය යොදා ගත යුතුයි.<br>■ තොරතුරු තාක්ෂණ දැනුවත්භාවය හා භාවිත විගණය පැවැත්ම මෙන්ම නැගී එන තාක්ෂණය භාවිතය පිළිබඳව කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සහ නැවත පුහුණු කිරීම් සිදුකළ යුතුයි. | SAP පද්ධති සම්බන්ධ පරිපාලන අයිතිවාසිකම් පිළිබඳ පූර්ණ පාලනය පවත්වා ගෙන යාම. |

| අවදානම | බලපෑම | ප්‍රතිචාරය | යෝජනා |
|---|---|---|---|
| **විනිමය අනුපාත අවදානම** | | | |
| ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ දේශීය ව්‍යාපාර සිදුකෙරෙන්නේ ශ්‍රී ලංකා රුපියල් වලින් වන අතර එහි මිලදී ගැනීම් සහ ණය ගෙවීම් සිදු කරනු ලබන්නේ ඇමරිකානු ඩොලර් වලිනි. | ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ලංකාවේ රුපියල් අගය අවප්‍රමාණය වීම මගින් විනිමය අනුපාත නිසා සිදුවන පාඩුව ඉහළ නංවයි. | සියලු බැංකු විසින් ඉදිරිපත් කරනු ලබන විනිමය අනුපාත දෛනික පදනමකින් අධීක්ෂණය කෙරෙන අතර,ඩොලර් මිල දී ගනු ලබන්නේ බැංකු විසින් ඉදිරිපත් කරන මිල ගණන් යටතේ නොව වෙළඳපොල හැසිරීම අධීක්ෂණය කිරීමෙන් පසු වෙළඳපොල අඩු අනුපාතයටය. | ■ රජය සතු වාණිජ බැංකු වලින් පමණක් ඩොලර් මිල දී ගැනීම සීමා කරනු වෙනුවට ඕනෑම බලපත්‍ර ලාභී වාණිජ බැංකුවකින් තරගකාරී මිල ගණන් යටතේ ඇමරිකානු ඩොලර් මිල දී ගැනීමේ හැකියාවක් ඇති කළ යුතුය.<br>■ ඇමරිකානු ඩොලර් ණය ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්ථනය කළ යුතුයි. |
| **පොලී අනුපාත අවදානම** | | | |
| අභ්‍යන්තර වශයෙන් අරමුදල් ජනනය කරගත නොහැකි වූ විට අවහිරතාවයකින් තොරව රටට ඛනිජ තෙල් නිෂ්පාදන සැපයීම සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ණය අරමුදල් ලබාගනී. | ණය ලබාගැනීම සඳහා අයකරනු ලබන පොලිය පොලී වියදම සහ මූල්‍ය ගාස්තු ඔස්සේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ලාභදායිත්වයට අහිතකර ලෙස බලපෑම් එල්ල කරයි. | ඩොලර් ණය පොලී අනුපාත අඩු කිරීම. | ■ රාජ්‍ය සහනාධාර සංඝටකය නොපමාව පියවිය යුතුය<br>■ සහනාධාර සංඝටක ලැබීම ලෙස බැංකු ණයඅතුරින් කිසියම් ප්‍රමාණයක් රජය පියවිය යුතුය. |
| **ද්‍රවශීලතා අවදානම** | | | |
| සංස්ථාවේ මූල්‍ය වගකීම නිසි කාලයට සපුරාලීමට නොහැකිවීම ද්‍රවශීලතා අවදානමේ ප්‍රතිපලයකි. | නිසි කාලයට අදාල ගෙවීම් පියවීම ආයතනයට නොහැකිවීමෙන් අමතර පොලී ගෙවීම් මගින් මුදල් ප්‍රවාහනය සහ වගකීම් තත්ත්වය කෙරෙහි අහිතකර ලෙස බලපායි එයට අමතර වශයෙන් කිසියම් වගකීමකට නොහැකිවීම මගින් අපේක්ෂිත ලාභදායීත්වය අවහිර වෙයි. | ■ අනාගත ද්‍රවශීලතා අවශ්‍යතා සපුරාලීම සඳහා සංස්ථාවේ ද්‍රවශීලතා තත්ත්වය නිරන්තරව අධීක්ෂණය කළ යුතුය.<br>■ සංස්ථාව විසින් බැංකු හා මහා භාණ්ඩාගාරය සමග පවත්වාගෙන යනු ලබන සුහද සම්බන්ධතා ඔස්සේ විවිධාංගීකරණය වූ අරමුදල් උපාය මාර්ග සකසනු ලැබ ඇත.<br>■ සංස්ථාවේ ලාභදායීත්වය සහ ද්‍රවශීල තත්ත්වය තුලනය කිරීම මගින් අමතර මුදල් නිසි පරිදි ආයෝජනය කෙරේ. | රජයේ ආයතන ද ඇතුලත්ව ණය ගැතියන්ගෙන් ලැබිය යුතු මුදල් එකතු කර ගැනීම තවදුරටත් වැඩි දියුණු කිරීම. |
| **ණය අවදානම** | | | |
| ණය අවදානම ඇති වන්නේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සිය නිෂ්පාදන ණයට අලෙවිකරන විටය.<br>පැහැරහැරීම් අවදානම- පාරිභෝගිකයෙකු විසින් සිදු කරනු ලබන ගෙවීම පැහැර හැරීම නිසා ඇතිවන පාඩු පැහැරහැරීමේ අවදානම නම් වේ.<br>සාන්ද්‍රතා අවදානම - කිසියම් පාරිභෝගිකයෙකු අංශයක් හෝ නිෂ්පාදන සඳහා අධික ණය පසුකම් සැලසීමෙන් සාන්ද්‍රතා අවදානම ඇතිවේ. | නිසි කාලයේදී වගකීම් පියවීම ආයතනයට නොහැකි වනවිට අමතර පොලී ගෙවීමට පොලී පිරිවැය, මුදල් ප්‍රවාහය සහ වගකීම් තත්ත්වයට අහිතකර ලෙස බලපායි.<br>මීට අමතරව වත්කමක් කිසියම් වාසියකින් විකිණීමට නොහැකිවීම මගින් අපේක්ෂිත ලාභය අවහිර වෙයි. | ■ විවිධ අංශ වෙත පිරිනැමෙන නිෂ්පාදන භාණ්ඩ ගණනාවක් සහතික වන සේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ලැබීම් විවිධාංගීකරණය කිරීම.<br>■ රජයට ගෙවිය යුතු වන බදු සහ තීරු බදු යනාදී කොටසක් ලෙස රජයේ ආයතන වලින් ලැබිය යුතු වන ගෙවීම් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් පියවා ගැනීම. | වසර අවසානයේදී ලැබිය යුතු වන ගෙවීම් වලින් 75%ක් පමණ රජයට අයත් අයතන වලින් ලැබිය යුතු වන බැවින් සහ එමගින් පියවා ගැනීමේ සම්බන්ධ කටයුතු කිරීමේ දී අනවශ්‍ය පීඩනයක් සංස්ථාවට එල්ල වන බැවින් රාජ්‍ය ආයතනයක් වෙත ලබාදෙන ණය පහසුකම් ප්‍රමාණය තවදුරටත් අඩුකළ යුතුය. |






# සංස්ථායික පාලනය

# සංස්ථායික පාලනය

මනා ආයතනික පාලනය මගින් කොටස් හිමියන්ගේ අගය සහ සංස්ථාවේ සම්පත් ආරක්ෂා කිරීම හා උපාය මාර්ගික අරමුණු සපුරා ගැනීම සඳහා සවිමත් පදනමක් සපයනු ලබයි. සෘජු භාවයන්ගේ ඉහළම මට්ටම් රඳවා ගනිමින් සහ උපරිම ආකාරයෙන් යහපාලන පවත්වා ගැනීමේ දී අවශ්‍ය වන අනුකූලතාවන් අනුව ක්‍රියා කිරීම සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මෙහෙයුම් හා ක්‍රියාකාරකම් පිළිබඳව පොදු ව්‍යාපාර කමිටුව (COPE) මගින් සිදුකරනු ලබන ස්වාධීන විමසුම් මගින් පොදු ජනතාව විසින් දක්වනු ලබන උන්නදුව ඉතා වැදගත් වෙයි



## අධ්‍යක්ෂ මණ්ඩලය

සංස්ථාවේ ගාමක බලය වන්නේ ආයතනයේ උපාය මාර්ග මූල්‍ය සහ පිළිගැනීම සම්බන්ධයෙන් තීරණ ගන්නා අධ්‍යක්ෂ මණ්ඩලයයි. 1961 අංක 28 දරණ ලංකා ඛනිජ තෙල් නිතිගත සංස්ථා පනත මගින් මණ්ඩලය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පැරාමිතීන් දක්වා ඇති අතර එය හොඳ ආයතනික පාලනයක් සහතික කරයි. තවද අධ්‍යක්ෂවරුන්ගේ සංයුතිය හා සේවා කාලය ඇතුලත්ව ඔවුගේ කාර්යභාරය සහ වගකීම් එහි දක්වා ඇත. සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරනු ලබන්නේ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසිනි. මණ්ඩලයේ සාමාජිකයින් අතුරෙන් එක් අධ්‍යක්ෂවරයෙක් මහා භාණ්ඩාගාරයේ නියෝජිතයෙකු වන අතර,එක් අධ්‍යක්ෂවරයෙක් ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යංශයේ නියෝජිතයෙකි. 2018 වර්ෂයේ සභාපති සහ කළමනාකරණ අධ්‍යක්ෂවරයා හැර සෙසු සියලුම අධ්‍යක්ෂවරුන් විධායක් නොවන අධ්‍යක්ෂක වරු වෙයි.

| අධ්‍යක්ෂක | අධ්‍යක්ෂක තත්ත්වය | පත්වීම් දිනය | ඉල්ලා අස්වීමේ දිනය |
|---|---|---|---|
| D රණතුංග මහතා | සභාපති | 29.05.2017 | 26.10.2018 |
| N R R ජයසේකර මහතා | කළමනාකාර අධ්‍යක්ෂක | 12.06.2018 | 26.10.2018 |
| K A විමලේන්තිරරාජා මහතා | විධායක නොවන අධ්‍යක්ෂ | 19.11.2015 | |
| A T බණ්ඩාර හේරත් මහතා | විධායක නොවන අධ්‍යක්ෂ | 29.05.2017 | 26.10.2018 |
| R A N ජයසුන්දර මහතා | විධායක නොවන අධ්‍යක්ෂ | 29.05.2017 | 26.10.2018 |
| S ධනතුංග මහතා | විධායක නොවන අධ්‍යක්ෂ | 29.05.2017 | 26.10.2018 |
| W S පෙරේරා මහතා | විධායක නොවන අධ්‍යක්ෂ | 29.05.2017 | 26.10.2018 |
| S විජේසිංහ මහතා | වැඩ බලන සභාපති/කළමනාකාර අධ්‍යක්ෂක | 12.11.2018 | 17.12.2018 |
| A H S විජේසිංහ මහතා | විධායක නොවන අධ්‍යක්ෂ | 28.11.2018 | 17.12.2018 |
| S ලියනගම මහතා | විධායක නොවන අධ්‍යක්ෂ | 28.11.2018 | 17.12.2018 |
| K I D P කුලරත්න මහතා | විධායක නොවන අධ්‍යක්ෂ | 28.11.2018 | 17.12.2018 |

වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලයේ විස්තර පහත දැක්වේ

| අධ්‍යක්ෂක | අධ්‍යක්ෂක තත්ත්වය |
|---|---|
| G S විතානගේ මහතා | සභාපති |
| N R R ජයසේකර මහතා | කළමනාකාර අධ්‍යක්ෂක |
| K A විමලේන්තිරරාජා මහතා | විධායක නොවන අධ්‍යක්ෂ |
| M විජේසිංහ මහතා | විධායක නොවන අධ්‍යක්ෂ |
| M Y හුසේන් මහතා | විධායක නොවන අධ්‍යක්ෂ |
| W R පෙරේරා මහතා | විධායක නොවන අධ්‍යක්ෂ |
| P P S රෝහිත මහතා | විධායක නොවන අධ්‍යක්ෂ |

වර්ථමාන අධ්‍යක්ෂවරුන්ගේ සුදුසුකම් හා අත්දැකීම් දැක්වෙන සාරාංශගත විශේෂ වාර්තාව මෙම වාර්තාවේ 26 සිට 30 දක්වා පිටුවල ඇතුලත් වේ.

## 2018 වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩලයේ සහභාගිත්වය

සාමාන්‍ය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මාසිකව පවත්වනු ලබන අතර අවශ්‍ය වූ අවස්ථාවලදී විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කැඳවනු ලබයි. ජ්‍යේෂ්ඨ කළමනාකරුවන් ආරාධනා මත සහභාගී වේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් විධිමත් න්‍යාය පත්‍රයක් මත පවක්වනු ලබන අතර රැස්වීම් වලට පෙර ආයතනික කළමනාකාරීත්වයන් විසින් අදාල විස්තරාත්මක පසුබිම් තොරතුරු අධ්‍යක්ෂවරුන්ට දෙනු ලැබේ. අදාල වර්ෂ තුලදී අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීම් 15 පැවැත්විණි. ඒ රැස්වීම් වලදී අධ්‍යක්ෂවරුන්ගේ සහභාගීත්වය පහත වගුව මගින් දැක්වේ.

## අධ්‍යක්ෂ මණ්ඩලයේ සහභාගීත්වය

| කමිටු සාමාජිකයින් | පැමිණීම |
|---|---|
| D රණතුංග මහතා | 10/13 |
| N R R ජයසේකර මහතා | 12/13 |
| K A විමලේන්තිරරාජා මහතා | 10/15 |
| A T බණ්ඩාර හේරත් මහතා | 13/13 |
| R A N ජයසුන්දර මහතා | 13/13 |
| S ධනතුංග මහතා | 12/13 |
| W S පෙරේරා මහතා | 13/13 |
| S විජේසිංහ මහතා | 2/2 |
| A H S විජේසිංහ මහතා | 2/2 |
| S ලියනගම මහතා | 2/2 |
| K I D P කුලරත්න මහතා | 0/2 |

## අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වය

වර්ෂ 1961 අංක 28 දරණ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත අනුව නැවත පත්කිරීමේ පදනමට යටත්ව අධ්‍යක්ෂ මණ්ඩලය වසර තුනක කාල පරිච්ඡේදයක් නොඉක්මවන ආරම්භක දුර කාලයක් අධ්‍යක්ෂවරුන්ට හිමිය. තීරණ ගැනීමට පෙර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ආයතනික කලමණාකාරීත්වය වෙතින් සහ අවශ්‍ය වුවහොත් බාහිර වෘත්තිකයින් වෙතින් ද අදාල තොරතුරු සපයාග නු ලබයි. අදාල තොරතුරු නිසි කලට වේලාවට අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබාදෙමින් මණ්ඩලයට සිය වගකීම් කාර්යක්ෂමව ඉටුකිරීමට හැකියාව සැලසීමට ආයතනික කලමණාකාරීත්වය බැඳීසිටී.

## අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය

සංස්ථාවේ සාර්ථකත්වය සහ තිරසාරභාවය පිළිබඳ සමස්ථ වගකීම හා වගවීම අධ්‍යක්ෂක මණ්ඩලය මතට පැවරේ. එහි කාර්යභාරය මූලික වශයෙන්ම අවධානය යොමුකර ඇත්තේ සංස්ථාවේ උපායමාර්ගික දිශාවන් සහ සමස්ථ කාර්ය සාධනය කෙරෙහි හොඳ නායකත්වයක් ක්‍රියාත්මක කිරීම සහ හිමිකරුවන්ගේ යහපත සුරැකීම සඳහාය.

සංස්ථාවේ දැක්ම සාක්ෂාත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය බැඳී සිටී. මේ වගකීම් ඉටු කිරීමේදී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ උපාය මාර්ග සාක්ෂාත් කර ගැනීම, එහි මෙහෙයුම් ක්‍රියාකාරීත්වය සහ මූල්‍ය ප්‍රතිඵල අධීක්ෂණය කිරීම මෙන්ම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ආයතනික පාලන කාර්ය රාමුවේ උත්තරීතර භාරකරු ලෙස කටයුතු කිරීම සඳහා වන ඉහළම වගවීම අධ්‍යක්ෂක මණ්ඩලය සතුව ඇත. එසේම සංස්ථාපිත අවශ්‍යතා සහ ආචාර ධර්ම පිළිබඳ ප්‍රමිතීන් අනුව කටයුතු කිරීමේ වගකීමෙන් ද ඔවුන් බැඳී සිටී.

අධ්‍යක්ෂ මණ්ඩලයට ඕනෑම අධ්‍යක්ෂක වරයෙකුට හෝ සේවකයෙකුට එහි බලතල හෝ රජකාරි කිසිවක් පැවරිය හැකි අතර පත්කරන ලද සෑම නියෝජිතයෙකුම අධ්‍යක්ෂ මණ්ඩලයේ පොදු හා විශේෂ උපදෙස් වලට යටත්ය ඔහුට පවරා ඇති බලය හෝ යුතුකම ඉටු කළ යුතුය. ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම මගින් සංස්ථාව තුළ අභ්‍යන්තර පාලන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට අධ්‍යක්ෂක මණ්ඩලය උත්සාහ කරන අතර ඒවා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කරයි. අධ්‍යක්ෂක මණ්ඩලයේ සාමාජිකයින් අභ්‍යන්තර හා බාහිර විගණන කරුවන් හා ජ්‍යෙෂ්ඨ කළමණාකාරී කණ්ඩායමේ සියලුම සාමාජිකයින් සමග සෘජුවම සන්නිවේදන කටයුතු සිදු කරයි.

ඉහත කරුණු හැරුණු විට වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, වාර්ෂික අයවැය, ආයනික සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම සහ මූල්‍ය කාර්ය සාධනය සමාලෝචනය කිරීම සඳහා අනුමැතිය ලබාදීමේ වගකීම මණ්ඩලය සතුය ආයතනික ගනුදෙනු කරුවන්ට මූලික පත්වීම්, කාර්ය මණ්ඩල උසස්වීම්, ප්‍රධාන ප්‍රග්ධන වියදම් ආයෝජනය සහ ණය පහසුකම් සම්බන්ධ අනුමත කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධීක්ෂණය කරනු ලැබේ.

## උප කමිටු

අධ්‍යක්ෂ මණ්ඩලයේ ඇතැම් රජකාරී ඉටුකිරීම සඳහා විගණන කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වේ. ඊට අමතරව කළමනාකරණ කමිටුව, තොග සමාලෝචන කමිටුව, ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණ ඇගයීම් කමිටුව යන උප කමිටු හතරක් ක්‍රියාත්මක වේ.

## විගණන කමිටුව

අධ්‍යක්ෂ මණ්ඩලයට වගවීමෙන් යුතුව විගණන කමිටුව කළමනාකාරිවයට ස්වාධීන කාර්යභාරයක් ඉටුරකයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන විධායක නොවන අධ්‍යක්ෂකවරුන්ගෙන් විගණන කමිටුව සමින්විත වේ. විගණන කමිටුවේ සංයුතිය, කාර්යභාරය, රැස්වීම් සංඛ්‍යාව සහ සහභාගීත්වය මෙම වාර්ෂික වාර්තාවේ 84 සහ 85 පිටුවල සවිස්තරාත්මකව දක්වා ඇත .

## කළමනාකරණ කමිටුව

වර්ෂය තුළ කළමනාකරණ කමිටුව අධ්‍යක්ෂවරුන් හතර දෙනෙකුගෙන් සමන්විත වූ අතර ඔවුන්ගෙන් එක් අයෙක් කමිටුවේ සභාපති වේ. කාර්යංශ ප්‍රධානීන් අදාල රැස්වීම් වලටද සහභාගී

| කමිටු සාමාජිකයින් | පැමිණීම |
|---|---|
| D රණතුංග මහතා | 4/8 |
| N R R ජයසේකර මහතා | 8/8 |
| A T බණ්ඩාර හේරත් මහතා | 6/8 |
| S ධනතුංග මහතා | 8/8 |
| E A S විදිරිසිංහ මහතා | 8/8 |
| V N වීරසූරිය මහතා | 8/8 |
| M A D මල්ලිකාරච්චි මහතා | 6/8 |
| M K ගරුසිංහ මහතා | 8/8 |
| W M K R B වික්‍රමසිංහ මහතා | 6/8 |
| K W S P විතාන මහතා | 7/8 |
| R A K C ආරියරත්න මිය | 7/8 |

වේ. විමසුමට ලක් කෙරෙන වසර තුළදී කමිටුව අට වතාවක් රැස්වී අධ්‍යක්ෂක මණ්ඩලයට වාර්තා කරනු ලැබූ කරුණු සාකච්ඡා කෙරේ.

කමිටුව සිය වාර්තාව අධ්‍යක්ෂක මණ්ඩලය රැස්වීමට අවසන් අනුමැතිය සඳහා ඉදිරිපත් කරයි

## තොග විමසුම් කමිටුව

පවත්නා තොග වල තත්ත්වය විශ්ලේෂණය කිරීමෙන් පසුව තොග විමසුම් කමිටුව විසින් ඉදිරි මාස තුන සඳහා වන තොග අවශ්‍යතා ඇගයීමට ලක් කරනු ලබයි. CPSTL, IOC, PUCSL, සහ විදුලි බල මණ්ඩලයේ නියෝජිතයින්ගේ සහභාගිත්වයෙන් එය සතිපතා රැස්වේ. රටට අවශ්‍ය වනු ඇතැයි කල්තියා අනුමාන කරනු ලබන ඉල්ලුම, පිරිපහදු නිෂ්පාදන හැකියාවන් සහ ටැංකි ගබඩා ධාරිතා යන කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමෙන් අනතුරුව ආනයන ප්‍රමාණයන් හා නැව්ගත කිරීමේ සම්බන්ධ කටයුතු සැලසුම් කෙරේ. මෙම නිත්‍ය සමීප අධ්‍යක්ෂණ ක්‍රියාවලිය මගින් ආනයන, පිරිපහදු කිරීම සහ රඳවා ගැනීමේ පිරිවැය අවම කරන අතරම අඛණ්ඩ ඉන්ධන සැපයුම සමග සංස්ථාවේ කටයුතු කිරීමට හැකිවේ.

## ප්‍රසම්පාදන කමිටුව (PC) සහ තාක්ෂණික ඇගයීම් කමිටුව (TEC)

විනිවිදභාවය සහතික කිරීම, ප්‍රමාදයන් අවම කිරීම සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට මූල්‍යමය වශයෙන් වඩාත්ම වාසිදායක හා ගුණාත්මක හොඳම සේවා සැපයුම ලබාගැනීම සඳහා ජාතික ප්‍රසම්පාදන නියෝජිත ආයතනය (NPA) විසින් නිකුත් කරන ලද මාර්ගගෝපදේශය යටතේ තාක්ෂණ ඇගයීම් කට්මුට සහ ප්‍රසම්පාදන කමිටුව ක්‍රියාත්මක වේ. තාක්ෂණික ඇගයීම් කමිටුවේ මිලදී ගැනීම් වල තාක්ෂණික අවශ්‍යතා කෙරෙහි අවධානය යොමුකරන අතර ප්‍රසම්පාදන කමිටුව මිලදී ගැනිමක අනෙකුත් අංගයන් ගැන සැලිකිලිමත් වේ. මිලදී ගැනීමේ වටිනාකම අනුව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පහත දැක්වෙන ප්‍රසම්පාදන කමිටු ක්‍රියාත්මක වෙයි.

- ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව
- දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව
- ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව
- අමාත්‍යංශ ප්‍රසම්පාදන කමිටුව
- අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුව

## හිමිකරුවන් හා සබඳතා

සංස්ථාවේ ව්‍යාපාර අඛණ්ඩතාව එහි සියලු හිමිකරුවන් සමග බවතින සුහද හා අර්ථවත් සබඳතාව මත රඳා පවතියි.

සංස්ථාව සහ එහි හිමිකරුවන් අතර අන්‍යෝන්‍ය අවබෝධය ප්‍රවර්ධනය කිරීමේ වැදගත්කම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් හඳුනාගෙන සිටියි. අධ්‍යක්ෂවරුන්ගේ අදහස් අනුව සංස්ථාවේ ඉහළම මුල් හිමිකාරිත්වය සබඳතා හා පාලන පාර්ශවය වන්නේ ශ්‍රී ලංකා රජයයි. සංස්ථාවේ මෙහෙයුම් කළමනාකරණය කිරීම සඳහා සංස්ථාව ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරය, ශ්‍රී ලංකා මහ බැංකුව සමග සමීපව සම්බන්ධ වේ. සංස්ථාව විසින් ප්‍රධාන ව්‍යාපෘති වැඩසටහන් සහ අරමුදල්කරණය සම්බන්ධ උපදෙස් සහ මග පෙන්වීම ද එම ආයතනවලින් ලබා ගනු ලබයි. රජය සමග කටයුතු කරන ප්‍රධානතම සම්බන්ධීකරණ පුද්ගලයා සභාපති වන අතර එවැනි සන්නිවේදනයන් වාචික හා ලිඛිත ව සිදුකරනු ලබයි. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් නීතිමය වශයෙන් අවශ්‍ය වන සහ අනෙකුත් අදාළ තොරතුරු හැකි උපරිම අයුරින් රජයට ලබාදෙනු ලබයි.

## අභ්‍යන්තර පාලනයන්

සංස්ථාවට ගැටලුවකින් තොරව ක්‍රියාත්මක වීම සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන ක්‍රමයක් අවශ්‍ය වේ. මේ පද්ධතිය අරමුණ වන්නේ සංස්ථාවේ වත්කම් ආරක්ෂා කිරීම සහ අදාළ වාර්තාව පවත්වාගෙන යාම සහ විශ්වාසදායක තොරතුරු ඉදිරිපත් කෙරෙන බවත් තහවුරු කරගැනීමයි. මෙම අභ්‍යන්තර පාලන පද්ධතිය මගින් මූල්‍ය මෙහෙයුම් හා අනුකූලතා පාලනය මෙන්ම අවදානම් කළමනාකරණ ඇතුළු සියලුම ආකාරය පාලනයන් ආවරණය කෙරෙයි. ප්‍රායෝගිකව ප්‍රතිපත්ති හා ව්‍යාපාරික අරමුණු සාක්ෂාත් කර ගැනීමට අපොහොසත්වීමේ අවදානම් අතුරෙන් කරනවා වෙනුවට පිළිගත් හැකි අවදානම් පැතිකඩක් තුළ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ප්‍රධාන අවධානය අභ්‍යන්තර පාලන පද්ධතිය කළමනාකරණය කරයි. ඒ අනුව අභ්‍යන්තර පාලනය පාලන ක්‍රමයට සැපයිය හැක්කේ කළමනාකරණ සහ මූල්‍ය තොරතුරු සහ වාර්තා ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ආකාරයට අර්ථ දැක්වීමට විදරුද්ධව හෝ මූල්‍ය අලාභ වංචාවන්ට විරුද්ධව සාධාරණ නමුත් නිරපේක්ෂ සහතිකයක් ලබාදීම පමණි. සියලුම අභ්‍යන්තර පටිපාටි සහ ඒවායේ ප්‍රමාණවත්භාවය සහ ඵලදායිතාවය විමසුමට ලක්කිරීමට සහ අභ්‍යන්තර පාලනයන් වැඩිදියුණු කිරීම සඳහා වන නිර්දේශ ඉදිරිපත් කිරීමට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අභ්‍යන්තර විගණන අංශයට පවරා ඇත.

## අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශය මෙහෙයවනු ලබන්නේ වෘත්තීය වශයෙන් සුදුසුකම් ලත් වරළත් ගණකාධිකාරීවරයෙකු විසිනි. අභ්‍යන්තර පාලන කටයුතු ඇගයීම, අවධානම් ප්‍රදේශ හඳුනාගැනීම සහ ගනුදෙනු වල සම්පූර්ණතාවය සත්‍යාපනය කිරීම සඳහා විගණන කමිටුව විසින් අනුමත කරන ලද විගණකතා සැලසුම් ක්‍රියාත්මක වේ. ඊට අමතරව කලමණාකාරීත්වයට නිරීක්ෂණය හා නිර්දේශ ලබාදීමේ අරමුණෙන් විශේෂ පරීක්ෂණ පැවැත්වීම සඳහා ඔවුන් අනුයුක්ත කිරීම සිදුකොට ඇත. නිෂ්පාදන හානි, ආදායම් අලාභ යන අංශ වලට අදාල අවදානම් හඳුනාගැනීමට විගණන පිවිසුම් සඳහා පිළිතුරු සමග විගණකාධිපති වරයාගේ වාර්තාව සාකච්ඡාවට භාජනය කිරීම සඳහා සිදුකරන සත්‍ය කාර්යයන් සමග විගණන සැලසුම් වරින්වර විමසුම් කිරීම අභ්‍යන්තර විගණන විසින් සිදු කරනු ලබන අනෙකුත් කාර්යයන් වේ.

## ආයතනික කළමනාකරණය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වරින් වර අනුමත කරන උපාය මාර්ගික දිශානතීන් සකස් කර දෙන ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි මත පදනම්ව සභාපති සහ කළමනාකරණ අධ්‍යක්ෂවරයා සංස්ථාවේ සාමාන්‍ය කටයුතු කළමණාකරණය කරයි. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මෙහෙයුම් හා ප්‍රධාන පරිපාලනය මූලික කොටස් දෙකකට බෙදිය හැකිය. ඒවා නම් පිරිපහදු මෙහෙයුම් සහ ප්‍රාදේශීය කාර්යාල ඇතුළු ප්‍රධාන කාර්යාල මෙහෙයුම්ය.

පිරිපහදු මෙහෙයුම්වල ප්‍රධානත්වය පිරිපහදු කළමනාකරු විසින් දරනු ලබයි. ඔහු විදුලි හා නිෂ්පාදන හා මෙහෙයුම් නඩත්තු හා ව්‍යාපෘති සඳහා තාක්ෂණික සේවා වැනි විවිධ මූලික තාක්ෂණික ක්ෂේත්‍රයන්හි නියෝජ්‍ය පිරිපහදු කළමනාකරුවන්ගේ සහාය ලබයි. වඩාත් හොඳ කළමනාකරණය සඳහා ප්‍රධාන කාර්යාලය කාර්යංශ කිහිපයකට බෙදා ඇති අතර සෑම කාර්යංශයක්ම මෙහෙයවනු ලබන්නේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වරයෙකු හෝ කළමනාකරුවකු විසිනි. ඔහු සංස්ථාවේ එදිනෙදා කටයුතු සඳහා සභාපති සහ කළමනාකරණ අධ්‍යක්ෂ වරයාට සහාය වේ. ආයතනික කළමනාකරුවන් කුසලතා පළපුරුද්ද සහ අධ්‍යාපනික උපාධි හා අදාළ වෘත්තීය ක්ෂේත්‍රයෙහි අදාළ වෘත්තීය සුදුසුකම් සමග හොඳින් සමතුලිත වේ.

ජ්‍යෙෂ්ඨ සහ ආයතනික කළමනාකරණයේ සුදුසුකම් දැක්වෙන සාරාංශගත චරිතාපදානයන් මෙම වාර්තාවේ 31 සිට 35 දක්වා පිටුවල දැක්වේ.

## අනුකූලතාව සහ විනිවිදභාවය

අදාළ වන සියලුම නීති, රෙගුලාසි, ප්‍රමිති, හොඳම භාවිතයන් සහ ක්ෂේත්‍රයට අනුකූලවීම සංස්ථාවේ සාර්ථකත්වය සහ තිරසාර භාවයට අත්‍යවශ්‍යවේ. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ආයතනික පාලනය ව්‍යුහයන් වී ඇත්තේ 2003 දී ශ්‍රී ලංකාවේ වරළත් ගණකාධිකාරී වරුන්ගේ ආයතනය සහ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවය, මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද යහපාලනය සඳහා වූ මාර්ගෝපදේශ මගින් නිකුත් කරන ලද ආයතනික පාලන පිළිබඳ හොඳම පරිචය පිළිබඳ සංග්‍රහයෙන් ප්‍රකාශයට පත්කර ඇති මාර්ගෝපදේශ මගිනි. ශක්තිමත් ආයතනික පාලන ස්වභාවයන් අරක්ෂා කිරීම හා එම අවශ්‍යතාවන්ට අනුකූලව කටයුතු කිරීමට අධ්‍යක්ෂවරුන් කැපවේ.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සිය සියලු ක්‍රියා කාර්යයන්වල විනිවිද භාවය පවත්වා ගැනීමට කැපවී සිටී. සංස්ථාව ශ්‍රී ලංකා ගිනුම්කරණ ප්‍රමිති (SLFRS / LKAS ) සහ වගවීම සහතික කිරීම සඳහා අදාල රෙගුලාසි වලට අනුකූලවේ අභ්‍යන්තර පාලන ක්‍රමය සංස්ථාවේ දෛනික මෙහෙයුම් සඳහා 1971 අංක 38 දරණ මූල්‍ය පනතට අනුකූල වේ. මූල්‍ය ප්‍රකාශන වාර්ෂිකව ප්‍රකාශනයට පත් කර පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ. මූල්‍ය පනතට අනුකූලව විගණකාධිපති වරයා සංස්ථාවේ බාහිර විගණනය සිදුකරයි.





# විගණන කමිටු වාර්තාව

# විගණන කමිටු වාර්තාව

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ විගණන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුකමිටුවක් වන අතර අදාල සුදුසුකම් හා පළපුරුද්ද ඇති විධායක නොවන අධ්‍යක්ෂවරුන් විගණන කමිටු වලට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද අතර ඔවුන් අධ්‍යක්ෂ මණ්ඩලයට වගකිව යුතුය. එහි සොයාගැනීම් අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරන විට විගණන කමිටුවේ මූලික කාර්ය භාරය වනුයේ මූල්‍ය වාර්තාකරණය, විගණන ක්‍රියාවලිය, අභ්‍යන්තර පාලනය සහ අවදානම් කළමනාකරණ පද්ධතියේ අඛණ්ඩතාව සහතික කිරීමයි. කමිටුවේ වගකීම් වලට පහත සඳහන් දේ ඇතුළත් වේ.

- මෙහෙයුම් වල දී කළමනාකරණ අනුකූලතා අධීක්ෂණය කිරීම
- මූල්‍ය ප්‍රකාශවන වල අඛණ්ඩතාව සහ ඒවායේ අඩංගු සැලකිය යුතු වාර්තාකරණ විනිශ්චයන්
- මූල්‍ය වාර්තාකරණ පද්ධතියේ අනාවරණය කිරීම් වල ප්‍රමාණවත්බව සහතික කිරීම
- අභයන්තර විගණන කාර්යයේ ක්‍රියාකාරකම් සහ ඵලදායීතාව
- අභ්‍යන්තර පාලන හා අවදානම් කළමනාකරණ පද්ධති වල ඵලදායිතාව
- සංස්ථාව නිරාවරණය වී ඇති අවදාමනම්, අවදානම් අවම කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග සහ ඒවායේ බලපෑම් සමාලෝචනය කිරීම
- වර්ෂ සඳහා විගණන සැලැස්ම පරීක්ෂා කර අනුමත කිරීම
- විගණකාධිපත් විසින් නිකුත් කරන ලද විගණන වාර්තාව සමාලෝචනය කර කළමනාකරණ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳ පසුවිපරම් කිරීම
- පොදු ව්‍යවහාර පිළිබඳ කාරක සභා (COPE) නිර්දේශ සමාලෝචනය කර ක්‍රියාත්මක කිරීම සහතික කිරීම

## කමිටුවේ සංයුතිය

විගණන කමිටුව මණ්ඩලයේ සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත වන අතර විගණනයට ලක් කරන සමාලෝචනය කරන ලද මෙම වර්ෂය තුළ සංස්ථාව විගණන කමිටු රැස්වීම් පහක් පවත්වා ඇත. 79 වන විගණන කමිටු රැස්වීමේදී විධායක නොවන අධ්‍යක්ෂවරු තිදෙනෙකු වන කේ. ඒ. විමලේන්තිරරාජා මහතා (සභාපති), ආර්.ඒ.ඒන්.ජයසුන්දර මහතා, ඩී. ටී. බණ්ඩාර හේරත් මහතා විගණන කමිටුවේ සාමාජිකයින් ලෙස කටයුතු කළ අතර 80,81,82 සහ 83 වැනි විගණන කමිටු සඳහා ද සමාජිකයින් ලෙස කටයුතු කරතිබේ. රාජ්‍ය වාණිජ ව්‍යාවසායන්හි විගණන කමිටු පැවැත්වීම සම්බන්ධයෙන් භාණ්ඩාගාර චක්‍රලේඛයේ දක්වා ඇති වගකීම, බලධාරීන් සහ විශේෂිත රාජකාරී ආවරණය වන පරිදි කමිටුවේ විගණන ප්‍රතිපත්ති සකස් කර ඇත.

## විගණන කමිටුවේ කාර්යයන්

- සංස්ථාවේ අභ්‍යන්තර පාලන පද්ධති වල ප්‍රමාණවත්බව, කාල පාරාසය, පැවත්ම සහ ව්‍යාපාර මෙහෙයුම් වල අනුකූලව මූල්‍ය වාර්තා කරන පද්ධතියේ අනාවරණය කිරීම් ප්‍රමාණාවත් බව කමිටුව රඳවා තබාගනී. මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීම සඳහා භාවිතා කරන ශ්‍රී ලංකා ගිනුම්කරන ප්‍රමිති (SLFRSILKAS) ද ඇතුලත්ව මූල්‍ය වාර්තාකරන පද්ධතියට අනුකූලවීම සහ ගිනුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූලව සහතික කරයි. ඉහත කරුණු හැරුණුවිට සංස්ථාව නිරාවරණය වන අවදානම් සහ අවදානම් අවම කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග සහ ඒවායේ කාර්යක්ෂමතාව කමිටුව සමාලෝචනය කරයි. විගණකාධිපතිගේ සහ COPE නිර්දේශ ක්‍රියාත්මක කිරීම කමිටුව විසින් සහතික කරයි.

## විගණක කමිටුව විසින් ඉටු කරන ලද කාර්යයන්

විගණක කමිටුව සිය වගකීම් ඉටුකිරීම සඳහා පහත සඳහන් කාර්යයන් ඉටු කරනු ලැබිණ.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සියලුම වත්කම් ආරක්ෂා කිරීම සඳහා අභ්‍යනතර පාලන ක්‍රමයේ ප්‍රමාණාත්මක බව සමාලෝචනය කිරීම.

සංස්ථාව මුහුණ දෙන ප්‍රධාන උපාය මාර්ගයික ගැටළු ගැන සාකච්ඡා කිරීම. විගණකාධිපති විසින් නිකුත් කරන ලද අභ්‍යන්තර විගණක වාර්තා සහ ඒ පිළිබඳ නිරීක්ෂණ.

2018 වර්ෂය සඳහා වාර්ෂික අභ්‍යන්තර විගණන සැලසුම් සමාලෝචන කර සම්මත කිරීම.

## රැස්වීම්

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ ඉහත සඳහන් කළ පරිදි ඔවුන්ට පවරා ඇති රාජකාරී සාකච්ඡා කිරීම සඳහා විගණන කමිටු පහක් පවත්වන ලදි.

| රැස්වීම් අංකය | දිනය | සහභාගීත්ව | සහභාගී වූ සාමාජිකයින් |
|---|---|---|---|
| 79 | 13.03.2018 | 3/3 | K A විමලේන්තිරරාජා මහතා<br>A T බණ්ඩාර හේරත් මහතා<br>R A N ජයසුන්දර මහතා |
| 80 | 02.04.2018 | 2/3 | K A විමලේන්තිරරාජා මහතා<br>R A N ජයසුන්දර මහතා |
| 81 | 02.06.2018 | 3/3 | K A විමලේන්තිරරාජා මහතා<br>A T බණ්ඩාර හේරත් මහතා<br>R A N ජයසුන්දර මහතා |
| 82 | 21.08.2018 | 3/3 | K A විමලේන්තිරරාජා මහතා<br>A T බණ්ඩාර හේරත් මහතා<br>R A N ජයසුන්දර මහතා |
| 83 | 04.09.2018 | 3/3 | K A විමලේන්තිරරාජා මහතා<br>A T බණ්ඩාර හේරත් මහතා<br>R A N ජයසුන්දර මහතා |

## අභ්‍යන්තර විගණන කාර්යය

අභ්‍යන්තර විගණයේ ප්‍රධාන කාර්යයන් අතරට වසර ආම්භයේදී විගණන කමිටුව විසින් අනුතම තරන ලද විගණන සැලැස්ම මගින් ක්‍රියාත්මක කරනු ලබන විගණන ක්‍රියාපටිපාටි තුළින් අභ්‍යන්තර පාලනයන් තක්සේරු කිරීම, අවධානම් ප්‍රදේශ හඳුනාගැනීම සහ ගනුදෙනු වල නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය තහවුරු කිරීම ඇතුළත් වේ. විගණන ක්‍රියාවලියේදී හඳුනාගත් කරුණු ඉස්මතු කිරීම සඳහා විගණන විමසුම් මතු කරනු ලැබේ. ඉහත කරුණු වලට අමතරව විවිධ වැදගත් කරුණු, නිෂ්පාදන අලාභ හා සම්බන්ධ අවදානම් හඳුනාගැනීම, ආදායම් අලාභ, විගණකාධිපති වරයාගේ වාර්තා සාකච්ඡා කිරීම සහ නිර්දේශ ලබාදීම සඳහා අභ්‍යන්තර විගණන කාර්ය විශේෂ පරීක්ෂණ වල නිරත වේ. විගණන විමසීම සහ වාර්ෂික විගණන සැලැස්ම වරින් වර සමාලෝචනය කිරීම සහ සිදු කරන ලද සත්‍ය කටයුතු මත පදනම්ව අභ්‍යන්තර විගණන කාර්යයන් කාර්ය සාධනය සිදු කරයි.

සමාලෝචනය කරන ලද වර්ෂය තුළ අභ්‍යන්තර විගණනයන් විසින් සිදු කරන ලද කාර්යයන් වල සාරාංශය

- 2018 වසරේ මාසික මූල්‍ය ප්‍රකාශනය සමාලේචනය කිරීම.
- 2017 වසරේ මූල්‍ය ප්‍රකාශය පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව සාකච්ඡා කිරීම.
- අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රවණතාවන් සාමාලෝචනය කිරීම සහ දුර්වලතා අදාළ පාර්ශවයන්ට සන්නිවේදනය කිරීම.
- විගණන කමිටු රැස්වීමේදී අභ්‍යන්තර විගණන වාර්තාව සාකච්ඡා කිරීම.
- විගණකාධිපතිවරයාගේ මූල්‍ය ප්‍රකාශනය පිළිබඳ ලබාදී ඇති නිර්දේශයන්ගේ වාර්තාගත තත්ත්වය පිළිබඳ සාකච්ඡා කිරීම
- පූර්ව විගණන කමිටු වලට සම්බන්ධවීම

## නිගමනය

සංස්ථාවේ අනුමැතිය ලද ප්‍රතිපත්ති වලට අනුකූල වන පරිදි සංස්ථාවේ කටයුතු කළමනාකරණය කෙරෙන බවට සහතිකයක් සංස්ථාවේ අභ්‍යන්තර පාලන පද්ධතිය මගින් සැකසෙන නමුදු විගණන කමිටුව මගින් නිර්දේශ කරනු ලැබූ පරිදි ඇතැම් ගැටළු විසඳීම සඳහා අභ්‍යන්තර පරීක්ෂාවන් සහ ක්‍රියාමාර්ග ඇතුළු යම් යම් පියවර ගතයුතු බව විගණන කමිටුවේ අදහස වේ.



**K.A. විමලේන්තිරරාජා**
සභාපති - විගණන කමිටුව






# අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

# අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

1961 අංක 28 දරණ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 32 3 වගන්තියට අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සංස්ථාවේ සහ එම සමූහයේ වාර්ෂික වාර්තාව සහ විගණන මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව ලංකා ඛණිජ තෙල් නීතිගත ස්ංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රසාදය පළ කර සිටී .

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව යනු 1961 අංක 28 දරණ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත යටතේ සංස්ථාගත කළ රජයට අයත් ව්‍යාපාරයකි. අධ්‍යක්ෂ මණ්ඩලයක් යටතේ සංස්ථාව කලමනාකරණය කරනු ලබයි. සංස්ථාවේ ලියාපදිංචි කාර්යාලය අංක 609 දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත කොළඹ 09 ලිපිනයේ පිහිටා තිබේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින නිකුත් කර ඇති හා 1971 අංක 38 දරණ මුදල් පනතේ විධි විධාන සහ ඊට පසුව සිදුකරන ලද සංශෝධන වලට අනුව මෙම වාර්ෂික වාර්ථාවට ඇතුළත් කර ඇති මූල්‍ය ප්‍රකාශනයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRS / LKAS) වලට අනුකූලව අදාළ අනාවරණයන් සහිතව සකස්කර ඉදිරිපත් කර තිබේ.

## ප්‍රධාන ක්‍රියාකාරකම්

සංස්ථාවේ ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ ශ්‍රී ලංකාවට ඛනිජ තෙල් ආනයනය කිරීම පිරිපහදු කිරීම සහ ඛනිජ තෙල් නිෂ්පාදන විකිණීමයි. සංස්ථාව විසින් ඇතැම් ඛනිජ තෙල් නිෂ්පාදන අපනයනය කිරීම ද සිදු කරයි.

## අනුබද්ධ සමාගම

ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට 2/3 කොටස් හිමිකම් තිබෙන එක් අනුබද්ධිත ආයතනයක් ඇති අතර එය ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම නම් වේ. එහි ප්‍රධාන කාර්යය වන්නේ ඉන්ධන ගබඩා කිරීම, බෙදාහැරීම් පහසුකම් සැලසීම සහ තොරතුරු තාක්ෂණ සේවා සැපයීමයි.

## සංස්ථාවේ සහ එම සමූහයේ මූල්‍ය ප්‍රකාශන

ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ එම සමූහයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන නිසි පරිදි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මූල්‍ය විසින් සහතික කර සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර තිබේ.

## මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

සංස්ථාවේ සහ එම සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂවරුන්ගේ වගකීම වන අතර එමගින් සංස්ථාවේ සහ එම සමූහයේ කටයුතු පිළිබඳ සත්‍ය සහ සාධාරණ අදහසක් පිලිබිඹු කරයි. අධ්‍යක්ෂ වරුන්ට අනුව විස්තීර්ණ ආදායම් ප්‍රතාශය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශ, ස්කන්දය වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශ, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, මූලික ගිනුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් පිටු අංක 116 සිට 147 දක්වා පිටුවල දක්වා ඇති අතර ඒවා පිළියෙල කර ඇත්තේ 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත සහ 1971 අංක 38 දරණ මූල්‍ය පනත මගින් නියම කර ඇති පරිදිය.

## මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වර්ෂය තුළ වෙනස්කම්

පසුගිය වසරේ සමාලෝචනයට අනුව, මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත්කිරීම සඳහා අවශ්‍යතාවක් වන ශ්‍රී ලංකා මූල්‍ය ප්‍රමිතීන් වලට අනුව එස්එල්ඒෆ්ආර්එස් 9 සහ එස්එල්එෆ්ආර්එස්  15 ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමක් හැර කලින් වර්ෂයේ දී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති වල කිසිදු වෙනසක් සිදුකර නැත.

## මූල්‍ය ප්‍රතිඵල

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵල සමලෝචනය සන්සන්දනාත්මක ලෙස පහත දැක්වේ.

| | 2018 රු. බි | 2017 රු. බි |
|---|---|---|
| ආදායම | 592.25 | 516.77 |
| අඩු: විකුණුම් බදු (නිෂ්පාදන බදු) | (71.29) | (70.82) |
| ශුද්ධ විකුණුම් ආදායම | 520.97 | 445.95 |
| විකුණුම් පිරිවැය | (523.98) | (418.96) |
| දළ ලාභය | (3.01) | 26.99 |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 0.81 | 0.68 |
| විකුණුම් සහ බෙදාහැරීමේ වියදම් | (14.91) | (15.50) |
| පරිපාලන වියදම | (6.02) | (4.96) |
| මූල්‍ය ගාස්තු | (12.06) | (10.53) |
| මූල්‍ය ආදායම | 12.90 | 11.06 |
| විනිමය අනුපාත විචලනය | (82.72) | (4.92) |
| බදු වලට පෙර ලාභය / අලාභය | (105.02) | 2.82 |

## ආදායම් සහ ලාභ

2017 වසරට සාපේක්ෂව සංස්ථාවේ ආදායම සංස්ථා ඉතිහාසය තුළ වැඩිම ආදායම වාර්තා කරමින් 14.6 % කින් ඉහළ ගොස් ඇත. අදාළ වර්ෂය තුළ ආදායම සහ ලාභ අලාභ පිළිබඳ සමාලෝචනයක් පහත දැක්වේ

| | විකුණුම් රු. මි | ලාභය/ (අලාභය) රු. මි. |
|---|---|---|
| ප්‍රවාහනය | 412,716 | (96,042) |
| විදුලිබල උත්පාදනය | 74,757 | (10,669) |
| ගුවන් | 64,189 | 3,841 |
| කර්මාන්ත | 13,661 | (75) |
| දේශීය | 17,688 | (14,619) |
| කෘෂි රසායනික | 151 | (19) |
| අපනයන සහ නැව් ඉන්ධන සැපයීම | 9,090 | (1,132) |
| එකතුව | 592,253 | (118,715) |

## බදු

2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත සහ ඒ හා බැඳුණු සංශෝධන අනුව ආදායම් බදු වියදම් ගෙවා ඇත.සංස්ථාව අලාභයක් ලබා ඇති හෙයින් ප්‍රමානාත්මක ආදායම් බදු ගෙවීමේ වගකීමක් පැන නොනඟී 127 වන පිටුවේ මූල්‍ය ප්‍රකාශයට අයත් 07 වන සටහන මගින් විස්තර දක්වා තිබේ.

## විශේෂ ගාස්තු

2014 වර්ෂය තුළ මහා භාණ්ඩාගාරය විසින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට රුපියල් බිලියන 10ක් විශේෂ ගාස්තුවක් ලෙස ගෙවා එම මුදල පිළිවෙලින් 2014 වර්ෂය සඳහා රුපියල් මිලියන 250ක වියදමක් ලෙසත් 2015 සඳහා රුපියල් මිලියන 750ක් සහ 2016 සිට 2014 සඳහා වර්ෂයකට රුපියල් මිලියන 1,000 ක් බැගින් වියදම් ලෙස ආදායම් වාර්තාවේ දක්වන ලෙසට දක්වා ඇත.

2018 වර්ෂය සඳහා රුපියල් මිලියන 1,000 ක් ලියාහරින ලදී.

## පරිත්‍යාග

ආයතනික සමාජ වගකීම් ක්‍රියාකාරකම් සඳහා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව විසින් රුපියල් මිලියන 5ක් පරිත්‍යාග කර තිබේ.

## දේපළ, පිරියත සහ උපකරණ

සංස්ථාවේ සහ සමූහයේ දේපළ, පිරියත සහ උපකරණ පිළිබඳ විස්තර මූල්‍ය වාර්ථාවේ 128 වන පිටුවේ 8 වන සටහනින් දක්වයි.

## දායකත්ව ප්‍රාග්ධනය

2018 දෙසැම්බර් 31 වන විට සංස්ථාවේ සම්පූර්ණ දායකත්ව ප්‍රාග්ධනය රු. මි. 28,487.125 ක් විය.(2017-රු මිලියන 28,487.125)

## සංචිත

2018 දෙසැම්බර් 31 දින වනවිට සංස්ථාවේ ප්‍රාග්ධන සංචිතය රු.මි.4,992.686ක් විය. (2017-රු.මි.4,992.686)

## අධ්‍යක්ෂවරු

වර්තමානයේ තනතුරු හොබවන අධ්‍යක්ෂවරුන් පහත පරිදි වේ

| අධ්‍යක්ෂකගේ නම | තත්වය |
|---|---|
| G S විතානගේ මහතා (සභාපති) | විධායක අධ්‍යක්ෂ |
| N R R ජයසේකර මහතා | විධායක අධ්‍යක්ෂ |
| K A විමලේන්තිරරාජා මහතා | විධායක නොවන අධ්‍යක්ෂ |
| M විජේසිංහ මහතා | විධායක නොවන අධ්‍යක්ෂ |
| M Y හුසේන් මහතා | විධායක නොවන අධ්‍යක්ෂ |
| W R පෙරේරා මහතා | විධායක නොවන අධ්‍යක්ෂ |
| P P S රෝහිත මහතා | විධායක නොවන අධ්‍යක්ෂ |

## අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ විගණන කමිටු රැස්වීම් වලින් සමන්විත අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම් පිළිබඳ විස්තර 78 සිට 85 වන පිටුව තෙක් දක්වා තිබේ. රැස්වීම් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම් ඇතුළත් විස්තර වාර්ෂික වාර්තාවේ 79 වන පිටුවේ සඳහන් කර ඇත.

## අධ්‍යක්ෂවරුන්ගේ වේතන

වර්ෂය තුළ ගෙවන ලද අධ්‍යක්ෂවරුන්ගේ වේතන පහත සඳහන්වේ.

| | 2017 රු. මි | 2018 රු. මි |
|---|---|---|
| අධ්‍යක්ෂවරුන්ගේ දීමනා | 1.388 | 1.595 |

## අධ්‍යක්ෂවරුන්ගේ ගිවිසුම්වල ඇති ප්‍රතිලාභ

සංස්ථාව සමග සෘජු සහ වක්‍ර ලෙස අධ්‍යක්ෂවරුන්ගේ ගිවිසුම් වල ඇති ප්‍රතිලාභ පිළිබඳ මූල්‍ය ප්‍රකාශනයේ 31 වන සටහනින් දක්වයි.

## අවදානම් පාලනය සහ අභ්‍යන්තර පාලන පද්ධතිය

අවදානම් කළමනාකරණය පිළිබඳ සමස්ත වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් භාරගනී. මේ සඳහා සංස්ථාව තුළ ප්‍රතිඵලදායක සහ ඉතා පුළුල් අභ්‍යන්තර පාලන ක්‍රමයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කර තිබේ

අවදානම් කළමනාකරනයේදී සංස්ථාව විසින් ගනු ලබන නිශ්චිත පියවර පිටු අංක 70 සිට 75 දක්වා ඇති අවදානම් කළමනාකරණ වාර්තාවේ දක්වා ඇත.

## ආයතන පාලන අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය

අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රකාශ කරන පරිදි

- සංස්ථාව විසින් ව්‍යාපාරික කටයුතු සිදු කිරීමේදී අදාළ සියලු නීති හා රෙගුලාසි වලට අනුකූලව එම කටයුතු සිදු කර ඇති අතර ඊට පටහැනි කිසිදු ක්‍රියාකාරකමක නිරතව නැත.

- සංස්ථාව සම්බන්ධ ගිවිසුම් වලදී අදාළ සියලුම අවශ්‍යතාවන් අධ්‍යක්ෂවරුන් විසින් සපුරා ඇත.

- ව්‍යාපාරය උපකල්පිත අනුබලයන් සමග ඉදිරියට යන අතර සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය ආයතනික/ ව්‍යාපරික සැලසුම් සමාලෝචනය කර ඇතිසේම ඉදිරියේදී අපේක්ෂිත අයුරින් ව්‍යාපාරික කටයුතු කරගෙනයාම සඳහා සම්පත් ප්‍රමාණවත් බවට සෑහිමට පත්වේ. මේ අනුව  සංස්ථාවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශනය සකස් කරනු ලබන්නේ අවධානයෙන් අඛන්ඩ සංකල්පය මත පදනම් වෙමිනි.

- අධ්‍යක්ෂවරුන් විසින් මූල්‍ය මෙහෙයුම්, අනුකූලතා පාලන සහ අවදානම් කළමණාකරණය ඇතුළු අභ්‍යන්තර පාලන ක්‍රියාදාමය ආවරණය වන අයුරින් සමාලෝචනයක් සිදු කර ඇති අතර එම කාර්යයන් සාර්ථක ලෙස පිළිපැදීම සහ එහි කාර්යක්ෂමතාව පිලිබඳව පිළිගතහැකි සහතිකයක් ලබා තිබේ.

- ආයතනික පාලන නීති රීති සඳහා අදාළ වන ක්‍රියාපිටිපාටි සහ භාවිතාවන් පිළිබඳ ආයතනික පාලන වාර්ථාව මෙහි 76 සහ 81 පිටු වල දක්වා ඇත.

## මානව සම්පත්

ව්‍යාපාරයේ මෙහෙවර සහ දැක්ම යථාර්ථයක් බවට පත් කිරීමේදී මානව සම්පත් වල අගනා කාර්ය භාරය සංස්ථාව විසින් හඳුනාගෙන තිබේ. ඒ අනුව සංස්ථාවේ මානව සම්පත් ඉහළ තලයකට ගෙන එමින් ආයතනයේ අභිප්‍රායන් සහ බලාපොරොත්තු ලඟාකරගැනීම සඳහා ඔවුන්ගේ ප්‍රශස්ත දායකත්වය ලබාගැනීමට පියවර රැසක් ගෙන තිබේ.

අපගේ මානව සම්පත් ප්‍රතිපත්තිය අවධාරණය කර සිටින්නේ සියලුම මට්ටම් වල සේවකයින්ට දේශීය හා විදේශීය පුහුණුව තුළින් ඔවුන්ගේ දැනුම සහ කුසලතාව නිරන්තරයෙන් ඉහල නංවාගැනීමේ අවස්ථා සැලසිය යුතුබවයි.

මානව සම්පත් තුළ ඉහළ මට්ටමේ තාක්ෂණික සහ කළමනාකරණ හැකියාවන් ඇති මානව සම්පතක් නිරතුරුවම රැකගැනීම අරමුණුකොටගෙන මානව සම්පත් සංවර්ධනය සංස්ථාවේ ප්‍රමුඛ අරමුණක් බවට පත්කර ඇත.

## ප්‍රධාන නඩු

අධ්‍යක්ෂවරුන්ගේ සහ සංස්ථා නීතීඥයින්ගේ මතය අනුව මූල්‍ය ප්‍රකාශනයේ 28 වන සටහන මගින් අනාවරණය කෙරෙන සංස්ථාවට එරෙහි නඩු පැවරීම් මගින් සංස්ථාවේ මූල්‍ය ස්ථාවරත්වයට හෝ අනාගත මෙහෙයුම් සඳහා කිසිදු ආකාරයකින් බලපෑමක් සිදු නොවේ.

## නීති හා රෙගුලාසි වලට අනුකූලත්වය

සංස්ථාව අදාළ නීති හා රෙගුලාසි උල්ලංඝනය වන අකාරයේ කිසිදු කටයුත්තක නිරත වී නොමැත.

## පාරිසරික ආරක්ෂාව

අදාළ පාරිසරික නීති සහ රෙගුලාසි වලට අනුකූලව කටයුතු කිරීම සඳහා සංස්ථාව සිය උපරිම උත්සාහයෙන් කටයුතු කර තිබේ.

## ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂවරුන්ගේ උපරිම දැනුම සහ විශ්වාසය අනුව, අදාළ නියාමන සහ ව්‍යවස්ථාපිත අධිකාරීන් වෙත ගෙවිය යුතු සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත මූල්‍ය හැකියාවන් සහිතව නියමිත වේලාවට ගෙවා ඇති බවට සෑහීමකට පත්වේ.

## මූල්‍ය ප්‍රකාශනයෙන් පසු සිදුවීම්

145 වන පිටුවේ මූල්‍ය ප්‍රකාශන සඳහා දක්වා ඇති 29 වන සටහන හැරුණු විට මූල්‍ය තොරතුරු වල ගැලපීම් අවශ්‍ය වන අකාරයේ තොරතුරු වල වෙනසක් වියහැකි කිසිදු සිදුවීමක් මූල්‍ය ප්‍රකාශනයේ දිනට පසුව සිදු වී නොමැත.

## අවධානයට ලක්කිරීමේ පදනම

සංස්ථාවේ දැක්ම වැඩි දියුණු කිරීම මෙහෙයුම් වර්ධනය කිරීම සහ අනාගතයේ ප්‍රබල වාණිජ ශක්‍යතාවක් ඇති වන බවට සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ආයතනික සැලැස්මක් සකස් කර තිබේ. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන සකස්කර ඉදිරිපත් කර ඇත්තේ අවධානයට ලක් කිරීමේ පදනම මතයි.

## විගණකවරුන් පත් කිරීම

විගණකාධිපතිවරයා සංස්ථාවේ විගණකවරයාය ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ඔහු පත් කර ඇත විගණකවරයාගේ වේතනය තීරණය වනු ලබන්නේ 1961 අංක 28 දරණ ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 31 වන වගන්තිය ප්‍රකාරවය.

සංස්ථාව සමග ඇති ගිවිසුමේ ඇති විගණකවරයාගේ වේතනය සහ දීමනා.

2018 දෙසැම්බර් 31 වන දිනයෙන් අවසන් වූ වර්ෂය සඳහා සංස්ථා මූල්‍ය ප්‍රකාශනයේ විගණන ගාස්තු ලෙස රුපියල් මිලියන 2ක මුදලක් දක්වා තිබේ.

අධ්‍යක්ෂවරුන්ගේ දැනුම අනුව විගණකවරුන්ට සංස්ථාවේ හෝ අනුබද්ධිත ආයතනයන් සමග වෙනත් සබඳතාවන් හෝ ලාභයක් නොලැබේ.

## වාර්තාවේ අන්තර්ගතය පිළිගැනීම

1961 අංක 28 දරණ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 32 3 වගන්තියට අනුව අධ්‍යක්ෂ මණ්ඩලය මෙම වාර්තාවේ අන්තර්ගතය පිළිගනී.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මෙම වාර්ෂික වාර්තාව අත්සන් කර ඇත්තේ :



**G.S විතානගේ**
සභාපති



**N R R ජයසේකර**
කළමණාකාර අධ්‍යක්ෂක



0 1 2 3 4 5 6 7 8
x1000rpm
0 20 40 60 80 100 120 14
km/h
650 km
36076 km
ODO




# මූල්‍ය ප්‍රකාශන

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය எனது இல. My No. | POE/A/CPC/1/18/01 | ඔබේ අංකය உமது இல. Your No. | | දිනය திகதி Date | 26 June 2019 |

**ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ හා එහි පරිපාලිතයෙහි 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශණ සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වගන්ති ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශණ

### 1.1. තත්වාගණනය කල මතය

ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ එහි පරිපාලිතයෙහි 2018 දෙසැ. 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශණය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශණය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශණය, මුදල් ප්‍රවාහ ප්‍රකාශණය සහ මූල්‍ය ප්‍රකාශණ වලට අදාල සටහන් සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය සිදු කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ප්‍රකාරව මාගේ වාර්තාව නුදුරු අනාගතයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්වාගණනය කල මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ සහ එහි පරිපාලිතයේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය, මුදල් ප්‍රවාහයන්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතී වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වය පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2. තත්වාගණනය කල මතය සඳහා පදනම

### 1.2.1. සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම

සංස්ථාවේ මෙහෙයුම් ප්‍රතිඵලය ලෙස 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රු. මිලියන 105,050.6 ක බදු පසු අලාභයක් සහ සංස්ථා විස්තීර්ණ වියදම රු. මිලියන 104,769.6 සහ සමාලෝචිත වර්ෂය තුල රු. මිලියන 281,761.5 සෘණ ශුද්ධ වත්කම් ප්‍රමාණයක් පෙන්නුම් කෙරේ.

සමාලෝචිත වර්ෂය තුල සංස්ථාවේ සමුච්චිත අලාභය වැඩි වීමට විදේශීය විනිමය වෙනස්වීමේ අහිතකර බලපෑම සහ විදේශ විනිමය ණය මත දැරූ පොළී වියදම ප්‍රධාන වශයෙන් හේතු විය. මෙලෙස රාජ්‍ය මූල්‍ය සහය නොමැතිව සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පවත්වාගෙන යෑම ගැටළු සහගත වේ.

### 1.2.2. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රී.ලං.ගි.ප්‍ර.) වලට අනුගත නොවීම්

(අ) ශ්‍රී.ලං.ගි.ප්‍ර. 2 හි 10 ඡේදය අනුව තොග වර්තමාන ස්ථානයට හා තත්වයට ගෙන ඒමට දරණ ලද සියළුම පිරිවැය තොගයෙහි පිරිවැය ලෙස සැලකිය යුතුය. එසේ වුවද ආනයනික හා නිෂ්පාදිත සඳහා වටිනාකම රු. මිලියන 67,691.9 ක් වූ නිෂ්පාදන බදු තොග පිරිවැය ලෙස නොසලකා ආදායමට හිලව් කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂයේ සත්‍ය විකුණුම් පිරිවැය, ආදායම සහ අවසාන තොග පිරිවැය මූල්‍ය ප්‍රකාශණ වල පෙන්නුම් නොකෙරේ.

(ආ) ශ්‍රී.ලං.ගි.ප්‍ර. 16 හි දේපළ, පිරියත හා උපකරණ

දළ වශයෙන් රු. මිලියන.4,821.8 ක් පිරිවැය වූ සම්පූර්ණයෙන් ක්ෂය කල වත්කම් සංස්ථාව විසින් අඛණ්ඩව භාවිතා කර තිබුනේ එම වත්කම් වල ඵලදායී ජීව කාලය නැවත තක්සේරු කිරීමකින් තොරව සහ ඒ අනුව ගිණුම්ගත කර තිබුණි. තවදුරටත් විගණන නියැදි පරීක්ෂාවේදි සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට සංස්ථාව සතු ඉඩම් 12ක් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. එම නිසා එකී වත්කම් වල නිරවද්‍යතාවය පිළිබඳව විගණනයේදි ගැටළු සහගත විය.

(ඇ) ශ්‍රී.ලං.ගි.ප්‍ර. 36 - හානිකරණය

2018 වර්ෂයට අදාලව හානිකරණ පරීක්ෂාවක් සිදු කල බවට කිසිදු සාක්ෂියක් විගණනයට වාර්තා නොවුණි. මේ නිසා විගණනයේදි එවැනි වත්කම් වල සාධාරණ අගයෙහි නිරවද්‍යතාවය පිළිබඳව සැකයක් පැවතුනි.

### 1.2.3. පරිපාලිත සමාගම් මුල්‍ය ප්‍රකාශණ මත විගණන මතය

සමාලෝචිත වර්ෂය සඳහා පහත සඳහන් කරුණු හේතු කොටගෙන සංස්ථාව සහ සමූහයේ අනුරූපි ශේෂයන් සහ ගණුදෙණු සටහන් එකඟ නොවීම මත මා විසින් ලංකා ඛණිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ (CPSTL) මුල්‍ය ප්‍රකාශණ මත මතයක් ප්‍රකාශ නොකරන ලදී.

(අ) සමාගම විසින් සමාලෝචිත වර්ෂය තුල වෙළඳ ලැබීම් සඳහා වෙන් කරන ලද රු.මිලියන.174.7 හානිකරණ ප්‍රතිපාදන ප්‍රතිවර්තනය කර ලාභ අලාභ ගිණුමට හර කර තිබුණි. එසේ වුවද මෙම ප්‍රතිවර්ථනයට පෙර නැවත අයකර ගැනීමට කිසිදු ඇගයීමක් සිදුකර ඇති බවට තහවුරු කර ගැනීමට කිසිදු විගණන සාක්ෂියක් නොවීය. තවද මෙම වෙළඳ ණය ලැබීම් ශේෂයන් පැවතීම සහ නිවැරදිභාවය පිළිබඳ වෙනත් කිසිදු තහවුරු කිරීමේ සාක්ෂියක් මගින් සනාථ නොවීය.

**(ආ) වට්ටෝරු**

සමාලෝචිත වර්ෂය සඳහා වු මුල්‍ය තත්ව ප්‍රකාශණයේ පෙන්වන ලද රු.මිලියන 657 වටිනා වට්ටෝරු අයිතමයන් අගය කිරීම, සම්පූර්ණත්වය සහ නිරවද්‍යතාවය විගණනයේදී පහත සඳහන් හේතුමත සෑහිමකට පත්විය නොහැකි විය.

(i) සමාගම විසින් එහි ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතිය (ERP) වන SAP පද්ධතියට ඇතුලත් කර ඇති තොග අයිතම වර්ග 2500 කට අයත් විශාල තොග ප්‍රමාණයක වටිනාකම් පද්ධතියට ඇතුලත් කර නොතිබුණි. එබැවින් තොග අයිතම අගය කිරීමේ නිරවද්‍යතාවය හා සම්පූර්ණත්වය පිළිබඳව විගණනයට තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ii) සමාගමේ භාවිතය අනුව අඩු චලන භාණ්ඩ වෙනුවෙන් වසර 03 ට වැඩි සියළුම භාණ්ඩ මත සෑම වසරක් අවසානයේදීම ප්‍රතිපාදන වෙන් කර තිබුණි. සාමාගමේ වාර්තා අනුව වසර 03 වැඩි සුළු චලන අයිතමයන් රු. මිලියන 230.2 අයකර තිබුනද සමාලෝචිත වසර සඳහා සපයා තිබුනේ රු. මිලියන 15.6 පමණි. රු. මිලියන. 214.6 ප්‍රතිපාදන අඩු කිරීමට පෙර යෝග්‍ය තාක්ෂණික ඇගයීමක් භාවිතා කර නොතිබුණි.

### (ඇ) අන්තර් සමාගම් ශේෂයන්

ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව සහ ලංකා ඉන්දීය ඔයිල් සමාගම අතර ශේෂයන්හි නිවැරදිතාවය, අගයන් සහ පැවැත්ම පහත සඳහන් හේතූන් මත සහතික විය නොහැක.

(i) නිමා ගාස්තු තුල ඇතුලත් ලීටරයට ශත 13 ක් වූ Exim බැංකුවේ ණය පියවීම සැලකිල්ලට ගෙන (ල.බ.නි.ස.) CPC න් ලැබිය යුතු පොළිය ඉවත් කරමින් රු. මිලියන 1,173 ගිණුම් වලින් ලියා හැර ඇත. කෙසේ වුවත් ලංකා ඛණිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ මූල්‍ය ප්‍රකාශණ වල මේ සඳහා හානිකරණ වෙන් කිරීමක් සිදුකර නොමැත.

(ii) සමාලෝචිත වර්ෂය අවසානයට සමාගමේ මූල්‍ය ප්‍රකාශණ වල ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවෙන් (CPC) ලැබියයුතු යැයි සඳහන් වටිනාකම හා එයට අනුරූපීව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශණ වල ගෙවිය යුතු යැයි සඳහන් වටිනාකම අතර ඉහත (i) සඳහන් අගයද ඇතුලත්ව රු. මිලියන 2,475.8 වෙනසක් පෙන්නුම් කෙරේ.

(iii) ලංකා ඉන්දියානු තෙල් සමාගමෙන් (LIOC) ලද ශේෂ තහවුරු කිරීම් වලට අනුව, සමාගමට ගෙවිය යුතු වටිනාකම රු. මිලියන 351.5 ක් වන අතර, ඊට අනුරූපීව සමාගමේ මූල්‍ය ප්‍රකාශණ වල පෙන්වනු ලබන වටිනාකම රු. මිලියන 406.59 කි. එහෙයින්, එම ශේෂයන් දෙක අතර එකඟ නොවූ වටිනාකම රු. මිලියන 55.1 කි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසන් වන විට සමාගමේ මූල්‍ය ප්‍රකාශණ වල දැක්වෙන පරිදි ආදායම් බදු, ආර්ථික සේවා ගාස්තු (ESC), එකතු කල අගය මත බදු (VAT), ගෙවියයුතු රඳවා ගැනීමේ බදු (WHT) සහ ගෙවියයුතු උපයනවිට ගෙවීමේ බදු (PAYE) වල ගෙවිය යුතු වටිනාකම හා ඊට අනුරූපීව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව පවත්වාගෙන යන වාර්තා වල පෙන්නුම් කරනු ලබන වටිනාකමත් අතර රු. මිලියන 199.8 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඊ) 2008 හා 2010 වර්ෂවල පැවති අයකර නොගත් අතිරික්ත ගෙවීම් වූ උපයන විට ගෙවීම් බදු (PAYE) හා යෙදවුම් මත වූ එකතු කල අගය මත බදු (VAT) පිළිවලින් රු. මිලියන 6.8 ක් හා රු. මිලියන 8.06 ක් නැවත අයකර නොගැනීම විගණනයේදී ගැටළු සහගතය. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මේ සම්බන්ධව කිසිදු වෙන් කිරීමක් සිදුකර නොතිබුණි.

(උ) රඳවා ගැනීමේ බදු (WHT) හා නිමවුම් මත වූ එකතු කළ අගය මත බදු (VAT) වල ගෙවියයුතු වටිනාකම පිළිවලින් රු. මිලියන 19.1 ක් හා රු. මිලියන 13.9 ක් වූ අතර එම ශේෂයන් නිරවුල් කිරීමකින් තොරව වසරින් වසර අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශණ වල ඉදිරියට ගෙනවිත් තිබුණු බැවින් එම වටිනාකම්වල නිරවද්‍යතාවය පිළිබඳව විගණනයේදී ගැටළු සහගත විය.

(ඌ) ශ්‍රී ලංකා ගිනුමුකරණ ප්‍රමිත අංක (LKAS 16) හි 51 වගන්තියට අනුකූල නොවන අයුරින් දළ වශයෙන් රු. මිලියන 5195 ක් වූ සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති වත්කම් ඒවායේ ඵලදායි ජීව කාලය යළි තක්සේරු කිරීමකින් තොරව සමාගම විසින් භාවිත තර තිබුණි. තවද සමාගමේ ආරම්භයේ සිටම එහි වත්කම් ප්‍රත්‍යාගණනය කර නොමැති අතර, ඒ සඳහා යෝග්‍ය ප්‍රත්‍යාගණන ප්‍රතිපත්තියක් ස්ථාපනය කර නොතිබුණි. එබැවින් මූල්‍ය ප්‍රකාශණ වල දැක්වෙන ජංගම නොවන වත්කම් මගින් එහි සාධාරණ වටිනාකම පිළිඹිබු නොවීය.

(එ) වර්ෂ 2017 දි කෙරෙමින් පවතින ප්‍රාග්ධන වැඩ (WIP) ගිණුමෙන් වියදම් (අළුත්වැඩියා හා නඩත්තු) ගිණුමට මාරු කර තිබු රු. මිලියන 32.6 වටිනාකම සමාලෝචිත වර්ෂයේදී ප්‍රතිවර්තනය කර ඇත. කෙසේ වුවත් මෙම ප්‍රතිවර්තනය සඳහා සුදුසු පදනමක් නොමැති බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂයේ ලාභය සහ වියදම පිළිවලින් සමාන මුදලකින් වැඩිවීමක් සහ අඩු වීමක් පෙන්විය.

(ඒ) ප්‍රවාහන ගාස්තු කිහිපයක් සහ නැව් ගාස්තු මුදල් පදනම මත ගිණුම්ගත කර තිබීම ශ්‍රී. ලං.ගි.ප්‍ර. (LKAS 01) 01 වගන්ති 27 සහ 28 ට පටහැනි වේ.

(ඔ) 2018 සැප්තැම්බර් 08 මුතුරාජවෙල SPBM හි සහ 2018 ඔක්තෝම්බර් 12 කොලොන්නාව පර්යන්තයේ සිදු වූ විශාල ඉන්ධන කාන්දුවීම නිසා රු. මිලියන 150 කට වැඩි ඇස්කමේන්තුගත පාඩුව සඳහා සමාලෝචිත වර්ෂයේ කිසිදු වෙන් කිරීමක් සිදුකර නොමැත.

### 1.2.4 විගණනයට සාක්ෂි නොතිබීම.

(අ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා රේගුව වෙතින් ලැබිය යුතු රු. මිලියන 1,135.8 ක ශේෂයක් 2010 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එන ශේෂයක් මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන වල මේ සම්බන්ධයෙන් ප්‍රතිපාදන වෙන්කිරීම් සිදුකර නොතිබුණි.

(ආ) 2007 සිට 2009 කාල සීමාව තුල සිදු කරන ලද තෙල් මිලදී ගැනීම් වලට අදාලව සිදු කල ඉදිරි සුරකුම් ගණුදෙනු හේතුවෙන් මහජන බැංකුවේ ගිණුම් පොත් වල රු. මිලියන 4,591.2 ක වටිනාකමක් සංස්ථාව විසින් මහජන බැංකුවට ගෙවියයුතු වටිනාකමක් ලෙස දක්වා තිබුණි. කෙසේ නමුත් සංස්ථාව විසින් එම වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සැප් (SAP) පද්ධතිය වාර්තාවන්ට අනුව සමාලෝචිත වර්ෂය අවසානයට පෙට්‍රල් 90 කිලෝ ලීටර 6.6 සහ දැව්තෙල් 1500 කිලෝ ලීටර 7.7187 පෙන්නුම් කෙරේ. කෙසේ වුවත් සංස්ථාව වාර්ෂික තොග ගණනයේදී මෙම තොග භෞතික සත්‍යාපනය සිදුකර නොමැත. එම නිසා මෙම තොගයන්හි පැවැත්ම ගැටළු සහගතය.

(ඈ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ සඳහන් වෙනත් ලැබිය යුතු ශේෂය තුල එකතු කළ අගය මත බදු (VAT) එකතුවක් ලෙස ගත් විට රු. මිලියන 437.8 ක් සඳහන්ව තිබුණි. ඉන් රු.මිලියන 326.4 ක් වටිනාකම 2010 වර්ෂයේ සිට පැවතුණි. මේ සම්බන්ධයෙන් ශේෂය තහවුරු කර ගැනීම සඳහා අදාල වන බදු ඉන්වොයිස් හා වෙනත් අදාළ තොරතුරු හා ලිපිලේඛන විගණනය සඳහා ඉදිරිපත් වී නොතිබුණි. එමනිසා එම ශේෂය අයකර ගැනීම විගණනයේදී ගැටළු සහගතය.

(ඉ) කෙසේ වෙතත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ බදු වාර්තාවල වැඩිපුර ගෙවීමක් වාර්තා නොවුවත් මූල්‍ය ප්‍රකාශනවල වර්ෂ 2010 සිට දිගින් දිගටම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට රු. මිලියන 376 ක වැඩිපුර ගෙවීමක් වාර්තා විය. වෙනත් ලැබිය යුතු ශේෂයක් යටතේ දක්වා ඇති මෙම ශේෂය විකල්ප ක්‍රියාමාර්ග මඟින් නැවත අයකර ගැනීමට ඇති හැකියාව තහවුරු කර ගැනීමට නොහැකි විය.

### 1.2.5 නොසැසඳු වෙනස්කම්

(අ) වර්ෂ 2018 මූල්‍ය ප්‍රකාශණ අනුව සමාලෝචිත වර්ෂ සඳහා ලංකා විදුලිබල මණ්ඩලයෙන් (CEB) ලැබිය යුතු මුදල රු. මිලියන 46,813.1 වුවත්, CEB වාර්තා අනුව එය රු.මිලියන 46,029 විය. එම නිසා මෙම වාර්තා 02 අනුව රු.මිලියන 778.3 වෙනසක් පැවති බව විගණනයට නිරීක්ෂණය විය. එයින් රු.මිලියන 753.6 ක් 2013 වසරේ සිට CEB වෙතින් ලැබිය යුතුව පවති. සංස්ථාව විසින් මෙම මුදල් අයකර ගැනීමට සැලකිය යුතු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) සංස්ථා මූල්‍ය ප්‍රකාශණ අනුව 2018 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රේගුවට සංස්ථාව විසින් ගෙවිය යුතු ශුද්ධ මුදල රු.මිලියන 8,318.5 විය. කෙසේ වුවද ශ්‍රී ලංකා රේගුවේ වාර්තා අනුව සංස්ථාවෙන් ලැබියයුතු මුදල රු.මිලියන 5,597.4 ක් ලෙස සටහන් වී තිබුණි. එනිසා රු. මිලියන 2,721.1 ක වෙනසක් විගණනයෙහි නිරීක්ෂණය විය.

(ඈ) සංස්ථා මූල්‍ය ප්‍රකාශණ අනුව 2018 දෙසැම්බර් 31 දිනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට සංස්ථාව විසින් ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT) සහ ගෙවිය යුතු ආදායම් බද්ද පිළිවලින් රු. මිලියන 612.2 සහ 6,948.2 විය. කෙසේ වුවද දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වාර්තා පෙන්නුම් කරන ආකාරයට එය පිළිවලින් රු. මිලියන 1476.8 සහ රු. මිලියන 4974.6 විය. කෙසේ වුවද රු. මිලියන 864.6 සහ රු. මිලියන 1973.6 ක වෙනස සඳහා හේතු විගණනයට පැහැදිලි නොවීය.

(ඈ) දේශිය ආදායම් දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව සමාලෝචිත වර්ෂය අවසානය ලැබියයුතු VAT බදු වටිනාකම රු.මිලියන 29.5 ක් විය. නමුත් මූල්‍ය ප්‍රකාශණ අනුව එය රු. මිලියන 437.8 විය. කෙසේ වුවත් මෙම ශේෂයන් අතර වෙනස රු. මිලියන 408.3 ලෙස විගණනයට නිරීක්ෂණය විය.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානය පිරිවැටුම් බදු රු. මිලියන 19.3 සහ වැට් රු. මිලියන 1555.6 සංස්ථාවෙන් ලැබිය යුතු ශේෂයන් ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වාර්තා වී ඇත. කෙසේ වුවද ඊට අනුගාමී කිසිදු ශේෂයන් සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශ වල පෙන්නුම් කර නොමැත.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශණ විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්වාගණනය කල මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකශණ සම්බන්ධයෙන් කළමනාකාරීත්වයේ සහ පාලනයකරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකශණ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශණ පිළියල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභයන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශණ පිළියල කිරිමේදී සංස්ථාව සහ සමූහය අඛණ්ඩ පැවැත්මක් පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, CPSTL ආයතනයට අදාල කරුණු වෙත සැලකිලිමත්වීම සහ කළමනාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේනම් හෝ වෙනත් විකල්පයක් නොමැතිවිටදි මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේනම් හැර අඛණ්ඩ පවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ සහ සමූහය මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පාලනය කරන පාර්ශවයන් විසින් දරණු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(1) උපගන්තිය ප්‍රකාරව සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශණ පිළියල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් සහ වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශණ විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශණ, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශණයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුලත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශණයන් අනවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශණයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශණ පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශණ වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශණයන්ගේ අවධානම් හදුනා ගැනීමේදී හා තක්සේරු කිරීමේදි අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වන්නා වූ අවදානම් මග හරවා ගැනීමට ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශණයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මග හැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම, වංචාවක් ඇති වීමට හේතු වේ.

- අවස්ථානෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ හා සමූහයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකශ කිරීමට අදහස් නොකරයි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය හා කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබා ගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදි. ප්‍රමාණාත්මක අවිනිශ්චතාවයන් ඇති බවට මා නිගමනය කරන්නේනම් මූල්‍ය ප්‍රකාශණවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කල යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේනම් මාගේ මතය විකරණය කල යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකශණ වල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කල අතර ඒ සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශණ වල ඇතුලත් බව අගයන ලදි.

මාගේ විගණනය තුලදී හදුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

## 2. වෙනත් නෛතික හා නියාමණ අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවන් සම්බන්ධයෙන් විශේෂිත ප්‍රතිප්‍රාදන ඇතුලත් වේ.

- තත්වාගණනය කල මතය සඳහා පදනම් වූ ජේදයේ විස්තර කල කරුණු හැර මේ දක්වා මාගේ පරීක්ෂාවන්ගෙන් පෙන්වාදුන් පරිදි 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ වගන්ති 12(අ) අනුකූලව යෝග්‍ය ගිණුම් වාර්තා පවත්වාගෙන යන බවට මා විසින් විගණනය සඳහා අවශ්‍ය සියළුම තොරතුරු සහ පැහැදිලි කිරීම් ලබා ගන්නා ලදි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(i)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුව සංස්ථාවේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශණ ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 1.2.2(ඉ.ඊ.උ), 1.2.3(අ.ඇ.ඉ) වගන්ති යටතේ විගණන නිරීක්ෂණයන්ට හැර 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) අවශ්‍යතා අනුව පෙර වර්ෂ සඳහා මාගේ නිගමනයන් ඇතුලත්ව මූල්‍ය ප්‍රකාශණ පිළියල කර තිබීම.

- අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණු වලට සීමා කිරීම තුල පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක අධිකාරිය විසින් සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලින් පරිබාහිර ඇතුලත්වූ කිසිදු ගිවිසුමක් සම්බන්ධයෙන් කුමන සෘජු හෝ වක්‍ර සබඳතාවක් නොමැති බව සඳහන් කිරීම. මණ්ඩලය යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජු හෝ අන්‍යකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයන් බැහැරව සම්බන්ධයන් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂිත විධාන වලට අනුකුල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|

(අ) යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ පිළිබඳ 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී /12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය.

| | |
|---|---|
| (1) මාර්ගෝපදේශ අංක 4.2.3(ආ) | අධ්‍යක්ෂක මණ්ඩලය විසින් පරිපාලිත සමාගම ඉලක්ක ලගා කර ගැනීමේ ඵලදායීතාවය කාලානුරූපිව සමාලෝචනය කර නොතිබුණි. |
| (2) මාර්ගෝපදේශ අංක 4.2.6 | එක් එක් කාර්තුවේ අවසානයට දින 30ට පෙර ත්‍රෛයිමාසික කාර්යසාධන වාර්තා රේඛීය අමාත්‍යාංශයට හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි. |
| (3) මාර්ගෝපදේශ අංක 4.3 | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ට රැස්වීමෙන් දින 10ක් ඇතුලත යැවියයුතු වුවත් ඊට අනුකූලව කටයුතු කර නොතිබුනි. |
| (4) මාර්ගෝපදේශ අංක 5.2.4 හා 5.2.5 | (i) මුදල් වර්ෂය ආරම්භ වීමට මාස 03ට පෙර කෙටුම්පත් අයවැය අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා ලබා දී නොතිබුණි. |

| | |
|---|---|
| | (ii) සංස්ථාවේ යාවත්කාලීන කරන ලද අයවැයෙහි පිටපත් රේඛීය අමාත්‍යාංශයට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට මහා භාණ්ඩාගාරයට හා විගණකාධිපතිට 2018 වර්ෂය ආරම්භ වීමට දින 15 ට පෙර ඉදිරිපත් කර නොමැත. |
| (5) මාර්ගෝපදේශ අංක 9.3 | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හා මහා භාණ්ඩාගාරයේ එකඟතාවය අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද බඳවා ගැනීම් හා උසස්වීම් ක්‍රියාපටිපාටියක් සංස්ථාවට නොතිබුණි. |
| (6) මාර්ගෝපදේශ අංක 9.4 | 2018 වර්ෂයේ සංස්ථාව විසින් අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව සේවකයන් 06 දෙනෙකු වෙනත් ආයතනයන්ට නිදහස් කර තිබුණු අතර, ඒ අතරින් සේවකයන් 04 දෙනෙකු සඳහා සංස්ථාවේ අරමුදල් වලින් දීමනා ගෙවා තිබුණි. |
| (ආ) 1997 ඔක්තෝම්බර් 24 දිනැති අංක 124 දරණ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ චක්‍ර ලේඛය | පුරප්පාඩු තනතුරක රාජකාරි ආවරණය කිරීම මාස 03 කාල සීමාවකට සීමා විය යුතුවේ. කෙසේ වුවද, කළමනාකරු (විමර්ෂණ), අලෙවි කළමනාකරු, (සිල්ලර) ප්‍රාදේශීය කළමනාකරු, (මධ්‍යම) ආදි A ශ්‍රේණියේ තනතුරු13 ක්ද ඇතුලත්ව නිලධාරින් 16 ක් 2018 දෙසැම්බර් 31 දිනට වසර 01 ක සිට වසර 10 ක් දක්වා කාලපරිච්ඡේදයක් සඳහා රාජකාරි ආවරණය කර තිබුණි. |
| (ඇ) 2016 අප්‍රේල් 29 දිනැති අංක PED 03/2016 සහ 2013 නොවැම්බර් 04 දිනැති අංකFP/06/35/02/01 ව්‍යාපාර චක්‍ර ලේඛය | සමාලෝචිත වර්ෂය සඳහා සේවකයින්ගේ වැටුප් වෙනුවෙන් සංස්ථාව විසින් රු.මි.259.9 ක් උපයනවිට ගෙවීම් බදු ඔවුන්ගේ වැටුපෙන් අඩු නොකොට එහි වියදමක් වශයෙන් දරා තිබුණි . |
| (ඈ) රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 මාර්ගෝපදේශ අංක 4.2 | පසුගිය වසර 03 සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්මක් සංස්ථාව විසින් පිළියල කර නොතිබුණි. |

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ වගන්ති 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සංස්ථාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

### (අ) මාසික උපයෝගිතා ගාස්තුව රැස් කිරීම.

2013 ඔක්තෝම්බර් 29 දින ගනු ලැබූ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක 38/1140 අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014 ජනවාරි 01 දින සිට CODO සහ TODO වලින් මාසික උපයෝගිතා ගාස්තුවක් රැස් කිරීමට අනුමැතිය ලබාදී තිබුණි. නමුත් මේ තීරණය විවිධ හේතු නිසා අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක නොවී තිබුණි. මේ නිසා 2014 වර්ෂයේ සිට සංස්ථාව වාර්ෂිකව රු. මිලියන 300 කට වඩා අලාභ ලබා තිබුණු අතර 2014 වර්ෂයේ සිට 2018 කාල සීමාව තුලදී දළ වශයෙන් රු. මිලියන 1500 පමණ අලාභයක් සංස්ථාව ලබා තිබුණි. ඉහත සඳහන් කල කණ්ඩායම් දෙකෙහිම බෙදාදෙන්නන්ගෙන් මාසික උපයෝගිතා ගාස්තුව (MUF) අය කර ගැනීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

(ආ) ද්‍රව ගෑස් විකිණීම සම්බන්ධයෙන් ගෑස් කර්මාන්තයේ පුද්ගලික ගෑස් සමාගමක් සහ සංස්ථාව අතර අත්සන් කළ ගිවිසුම 2006 ඔක්තෝම්බර් 20 වන දින කල් ඉකුත් වී තිබුණි. කෙසේ වුවද ඛණිජ තෙල් නීතිගත සංස්ථාව විසින් එම සමාගමට ද්‍රව ගෑස් අඛණ්ඩව සපයා තිබුනේ නව ගිවිසුමක් අත්සන් කිරීම හෝ කලින් එකඟතාව අලුත් කිරීමකින් තොරව විය. ඊට අමතරව, ඛණිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ගිවිසුමකට නොඑළඹ වෙනත් පුද්ගලික සමාගමකට ද්‍රව ගෑස් වායුව සපයා තිබුණි.

### (ඇ) විගණන කමිටු

සංස්ථාවේ විගණන කමිටු මගින් ගනු ලබන නිර්දේශයන් විධිමත්ව අධ්‍යක්ෂ මණ්ඩලය සමාලෝචනය කර නොතිබුණි. සංස්ථාවේ අදාල නිලධාරින් විසින් ඉල්ලුම් කරන තොරතුරු සම්පූර්ණවත්, නියමිත කාලයේදීත් ලබා දීමට කටයුතු කර නොතිබුණු අවස්ථාවේ තවදුරටත් නිරීක්ෂණය විය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ වගන්ති 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාල සීමාවක් තුල සහ අදාල නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

### (අ) ප්‍රදම්පාදන සහ කොන්ත්‍රාත් ක්‍රියාවලි

2012 මාර්තු 22 වන දින, අංක 12/0295/510/003/TRB දරණ අමාත්‍ය මණ්ඩල තීරණ අනුව බණිජ තෙල් මිලදී ගැනීමේදි දිගුකාලීන ණය පහසුකම් සමග වාර ගිවිසුම් වලට එළඹීමට හැකි සෑම විටම රේඛීය අමාත්‍යාංශය උත්සහ කළ යුතු අතර, එසේ කිරීමට නොහැකි නම් පමණක් සතිපතා පදනමට හදිසි ගිවිසුම් වලට එළඹිය යුතුය. කෙසේ වෙතත් ඉහත තීරණයට පටහැනිව 2018 වර්ෂය තුළදි කොන්ත්‍රාත් 78 න් 52 ක්ම (කොන්ත්‍රාත් 14 ක් අවලංගු කර තිබුණි) හදිසි මිලදි ගැනීම් මගින් සිදුකර තිබුණි.

## 3. වෙනත් විගණන නිරීක්ෂණයන්

### (අ) නිෂ්පාදන බදු ගෙවීම

විගණනයට ලබා ගත හැකිවූ තොරතුරු වලට අනුව නෞභාරපතෙහි සඳහන් ප්‍රමාණය හෝ සත්‍ය වශයෙන් ලැබුණු තෙල් තොග වලින් වඩා වැඩි අගය මත පදනම්ව ආනයනය කළ පෙට්‍රල් හා ඩීසල් මත නිෂ්පාදන බදු ගෙවා තිබුණි. මෙය ශ්‍රී ලංකා රේගුව දීර්ඝ කාලයකට පෙර හඳුන්වාදී තිබු අතර මෙම ක්‍රමවේදය සංස්ථාවට ප්‍රමාද ගාස්තු ගෙවීමේ අවදානම අඩු කර ගැනීමට හේතුවන බව සංස්ථාව විසින් දක්වා තිබුණි. කෙසේ වුවද මෙම භාවිතයේ නිවැරදිතාවය විගණනයේදි ගැටලු සහගත වී තිබුණි.

### (ආ) ගාස්තු සහ බදු අයකර ගැනීම

ප්‍රතික්ෂේප වු නැව් ගත කිරීම වෙනුවෙන් භාණ්ඩ මුදා හැරීමට රේගු ගාස්තු හා බදු ලෙස රු. මිලියන 1,617.2 ක් සංස්ථාව විසින් ගෙවා තිබු අතර එහි වටිනාකම තුල රු. මිලියන 648 ක් වු නිෂ්පාදන බද්දක් ඇතුලත්ව තිබුණි. 2017 ජනවාරි සිට එකී ගෙවු නිෂ්පාදන බද්ද නැවත අය කර ගැනීමට හෝ වෙනත් ගෙවීමකට අදාලව හිලව් කර ගැනීමට ඵලදායි ක්‍රියා මාර්ගයන් සංස්ථාව විසින් ගෙන නොතිබුණි.

### (ඇ) ප්‍රාග්ධන ව්‍යාපෘති

සමුච්චිත ඇස්තමේන්තු පිරිවැය රු. මිලියන 512.8 වු ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා සමාලෝචිත වර්ෂයේදි රු. මිලියන 504.1 අයවැය ප්‍රතිපාදන වෙන්කර තිබුණි. කෙසේ වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක්ම එය ක්‍රියාවට නංවා නොතිබුණි.

වර්ෂ 2017 සහ 2018 ආරම්භ වීමට නියමිතව තිබු මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 6,756.8 වු ව්‍යාපෘති 02 ක වර්ෂ 2018 අවසාන වන තෙක්ම ආරම්භ වී නොතිබුණි.

වර්ෂ 2014 සිට 2018 කාලය තුල ආරම්භ වු ව්‍යාපෘති 4 ක සත්‍ය පිරිවැය ඒවායෙහි ඇස්තමේන්තු පිරිවැයට වඩා රු. මිලියන 205 හෝ සියයට 15-85 අතර ප්‍රතිශතකින් ඉක්ම වී තිබුණි.

## (ඈ) තොග සමාලෝචන කමිටුව

ලංකා ඛණිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම CPSTL, ජේසීටී (JCT) ඔයිල් බැංකුව හා ලංකා ඉන්දියානු ඔයිල් සමාගම් හා ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාජිකයන් සහ රේඛීය අමාත්‍යාංශයේ නිලධාරියෙකුගෙන් තොග සමාලෝචන කමිටුව සමන්විත වු අතර, එහි රැස්වීම් සෑම සතියකම පවත්වා තිබුණි. කෙසේ වෙතත් තොග මට්ටම් එනම්, යළි ඇණවුම් මට්ටම, උපරිම මට්ටම, අවම මට්ටම, යළි ඇණවුම් ප්‍රමාණය ආදිය සම්බන්ධයෙන් සෑම ඛණිජ තෙල් නිෂ්පාදනයකටම අදාල වාර්තා ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව විසින් පවත්වා නොතිබුණි. ලංකා ඛණිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම ඉදිරිපත් කරන ලද තොග පවත්වා ගැනීමේ වාර්තාව පදනම් කරගෙන පමණක් ඛණිජ තෙල් නිෂ්පාදන ඇණවුම් කළ යුතු ප්‍රමාණය තීරණය කර තිබුණි. ඛණිජ තෙල් නිෂ්පාදිත තොග පවත්වා ගැනීම සම්බන්ධයෙන් වෙනත් කිසිදු වාර්තාවක් සමාලෝචන කාර්යයන් සඳහා ඉහත කමිටුවට ඉදිරිපත් කර නොතිබුණි. කෙසේ වුවද 2010 වර්ෂයේ සිට හඳුන්වාදුන් පරිගණක ගිණුම්කරණ පද්ධතිය හරහා අවශ්‍ය තොග සම්බන්ධ වාර්තාවන් ලබා ගැනීමට සංස්ථාවට නොහැකි වී තිබුණි.

## විදේශීය මුදලින් නම් කරන ලද ණය

පෙර වර්ෂය අවසානයේ ශේෂය හා සැසදීමේදි සමාලෝචන වර්ෂය අවසානයේ විදේශ විනිමය මත වු දිගුකාලීන සහ කෙටි කාලීන ණය පිළිවලින් රු. මිලියන 1,311.6 හෝ සියයට 493 ප්‍රතිශතයක් සහ රු. මිලියන 115,021 හෝ සියයට 64 ප්‍රතිශතයක් වැඩි වී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂය තුලදි පොළී වියදම රු. මිලියන12,053.3 හා විදේශීය විනිමය විචලනය මත සිදු වු විනිමය අලාභය රු. මිලියන 82,717.3 ඇතුළුව ණය මත මුළු පිරිවැය රු. මිලියන 94,770.6 වී තිබුණි. මේ අතරදි මුළු ආයෝජන රු. මිලියන 83,180.3 හෝ සියයට 176 ප්‍රතිශතයකින් ඉහල ගොස් තිබීම හා මුල්‍ය ප්‍රකාශණ අනුව සමාලෝචන වර්ෂය තුල පොළී ආදායම ලෙස උපයාගෙන තිබු මුදල රු. මිලියන 7,732.9 පමණ විය. මුල්‍ය ප්‍රකාශණ වල පෙන්වා දෙන පරිදි සමාලෝචන වර්ෂය තුලදි සංස්ථාව විසින් ණයට ලබාගත් මුදල් යොදා ගැනීමෙන් රු. මිලියන 83,183.3 මුදලක් විවිධ කෙටි කාලීන ආයෝජනයන්හි ආයෝජනය කර තිබුණි. කෙසේ වුවත් සංස්ථාව විසින් විදේශීය විනිමය පියවීම සඳහා විධිමත්ව ක්‍රියාත්මක නොවීමෙන් පවතින මුදල් යොදා විදේශීය ණය පියවීමෙන් පොළී වියදම සහ විදේශීය විනිමය විචල්‍ය පාඩුව සැලකියයුතු ප්‍රමාණයකින් අඩු කර ගැනීමට නොහැකි වී තිබුණි.

සංස්ථාව විසින් පවතින මුදල් තත්වය නොසලකා මහජන බැංකුවෙන් රු. මිලියන 1,310.8 (ඇ.ඩො. මිලියන 7.725) ණය මුදලක් ලබා ගෙන ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස විදේශීය විනිමය විචල්‍යතාව මත රු. මිලියන 114.7 ක පාඩුවක් දැරීමට සහ සමාලෝචිත වර්ෂ අවසානයේ සමස්ථ ගෙවිය යුතු මුදල රු. මිලියන 1,425.5 දක්වා ඉහල ගොස් තිබුණි.

## (ඉ) වත්කම් කළමනාකරණය

පහත සඳහන් වත්කම් එම වත්කම් අත්පත්කර ගත් දින සිටම නිශ්කාර්යව පැවතුණි.

(i) වනාතමුල්ලේ පිහිටි හල්ගහකුඹුර ඉඩම - එල්පි ගෑස් ව්‍යාපෘතිය සහ ක්‍රීඩා භූමියක් සඳහා රු. මිලියන 10.6 කට මෙම ඉඩම අත්කර ගෙන තිබුණි. එසේ වුවත්, මෙම ඉඩමෙහි 700ක් පමණ නීති විරෝධී පදංචිකරුවන් (දුර්වාසීන්) විසින් තම අවශ්‍යතා සඳහා යොදාගෙන තිබුණි.

(ii) මාහේන ඉඩම - ලබාගත හැකි වු ලියවිලි අනුව, සංස්ථාව විසින් මෙම ඉඩම අත්පත් කර ගැනීම සඳහා රු.මිලියන 0.625ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද, මෙම ඉඩම සංස්ථාවේ පොත්වල ගිණුම්ගත කර නොතිබුණි. කෙසේ වුවද 1986 වර්ෂයේ සිට එය පෙර අයිතිකරු විසින් භාවිතා කරමින් පැවතුණි.

## (ඊ) සපුගස්කන්ද පිරිපහදුවේ ක්‍රියාකාරීත්වය

1969 වර්ෂයේදී ස්ථාපිත, වර්ෂ 47 ක් පැරණි වු මෙම පිරිපහදුවෙන් රටේ වැඩිවන ඛනිජ තෙල් නිෂ්පාදිත අවශ්‍යතාවය සැපයීමට නොහැකි වී තිබුණු, ඉතා අඩු පිරිවැයකට ඉන්ධන නිපදවීම සඳහා පහසුකම් ඇති සහ එමගින් පිරිපහදු මෙහෙයුම් කාර්යක්ෂමව උපරිම කිරීමට හැකිවන වෙනත් නවීන ලෝකයේ උසස් තාක්ෂණයන් සහිතව පහළ නිෂ්පාදන තුළින් පෙට්‍රල්, ඩීසල් වැනි ඉහළ වටිනාකම් ඇති නිෂ්පාදන ලබා ගැනීමට හැකි වන පරිදි මෙහෙයුම් කෙරෙන පිරිපහදු සමඟ සැසඳීමේ දී මෙම පිරිපහදුව ඉතා අඩු කාර්යක්ෂමතාවයකින් මෙහෙයුම් සිදු කෙරේ. කෙසේ වුවද, පිරිවැය ඵලදායිතා ආකාරයෙන් ඛනිජ තෙල් නිෂ්පාදිත වෙළඳ පොළට සැපයීම තහවුරු කර ගැනීම සඳහා යෝජිත සපුගස්කන්ද තෙල් පිරිපහදුව පුළුල් කිරීම හා නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය (SOREM) ක්‍රියාත්මක කිරීමට සංස්ථාවට මෙතෙක් නොහැකි වී ඇත. මෙම අරමුණ සඳහා මූලික ශක්‍යතා අධ්‍යයනය අවසන් වී ඇති අතර අවශ්‍ය ඉඩම් ප්‍රමාණය (අක්කර 35) අත්පත් කර ගෙන ඇති නමුත් මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය ශක්තියක් නොමැති වීම හේතුවෙන් සංස්ථාවට මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නොහැකි වී ඇත. පිළිගෙවුම් කාලය වසර අටකට සහ පිරිවැය එ.ජ.ඩො.බිලියන 2.1 ට ඇස්තමේන්තුගත කර ඇති මෙම ව්‍යාපෘතියේ ශුද්ධ වර්තමාන අගය (NPV) එ.ජ.ඩො.මිලියන 1,535 ක් විය හැක. තවදුරටත් එකී අරමුණ සඳහා ඉඩම් අත්පත් කර ගැනීම වශයෙන් දරන ලද රු.මිලියන 1003, මේ වන විටත් ඌණ උපයෝජිතව පැවැතුණි.

## (ඪ) ව්‍යවසාය සම්පත් සැලසුම් (ERP) පද්ධතිය

ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම CPSTL විසින් හඳුන්වා දෙන ලද ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතිය (ERP) පිළිබඳව අදාළ පාර්ශවයන්ගේ වගකීම් සම්බන්ධයෙන් සංස්ථාව ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම සහ ලංකා ඉන්දියන් තෙල් සමාගම අතර, ගිවිසුමක් හෝ අවබෝධතා ගිවිසුමක් නොතිබූ බව නිරීක්ෂණය විය. එසේම මෙම පද්ධතිය විශේෂයෙන් ඉන්ධන තොග සමාලෝචනය කිරීමේ කටයුතු සඳහා පමණක් ලෙස උපයෝගී කර නොතිබුණි.

### (i) පොදු පරිශීලක පහසුකම්

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඉන්දියන් තෙල් සමාගම සහ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම අතර ඉහත පොදු පහසුකම් සඳහා වන කොටස්කරුවන්ගේ ගිවිසුම සහ කොටස් මිළදී ගැනීමේ ගිවිසුම් වල කාලය 2008 දෙසැම්බර් 31 වන දින ඉක්තුව ගොස් තිබුණි.

### (ii) වත්කම් යළි තක්සේරු කිරීම.

2012 මාර්තු 16 වන දින කමිටු තීරණ අංක 04/1114 අනුව තක්සේරු දෙපාර්තමේන්තුවට ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කිරීමට හා එය මාස තුනක කාලයක් ලබා දීමට සම්පූර්ණ කිරීමට අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව පසුව මෙකී කාර්යය සඳහා රු. මිලියන 5.5 ක මුදලක් අත්තිකාරම් වශයෙන් ගෙවීමට 2012 මැයි 14 වන දින තවදුරටත් අනුමැතිය හිමි විය. කෙසේ නමුත් විගණනය අවසන් වන දින තෙක් ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කිරීම සම්පූර්ණ කර නොතිබුණි.

## (ඪආ) ඉන්ධන සැපයුම සඳහා ගිවිසුම්

සමාලෝචන වර්ෂය අවසානය තෙක්ම ලංකා විදුලිබල මණ්ඩලය, ශ්‍රී ලංකා ගුවන් සමාගම, ත්‍රිවිධ හමුදාව, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, ඇතුළුව ප්‍රධාන පාරිභෝගිකයන් 14 දෙනෙකු සමඟ ඉන්ධන සැපයීම සම්බන්ධයෙන් විධිමත් ගිවිසුම් වලට එළඹ නොතිබුණි.

### (එ) ඉන්ධන ප්‍රවාහන නල පද්ධතිය

(i) දශක ගණනාවකට පෙර ස්ථාපිත කරන ලද නල මාර්ගයක් ඔස්සේ කොළඹ වරායේ සිට කොළොන්නාව තෙල් පර්යන්තය දක්වා ඛනිජ තෙල් ප්‍රවාහනය කරන අතර, ඒවායින් සමහරක් අලුත්වැඩියා තත්වයෙන් පැවතිණි. ඒවායින් සමහරක් අලුත්වැඩියා කළ නොහැකි තත්වයන් හේතුවෙන් ඇතැම් ඒවා දැනටමත් අතහැර දමා ඇති බව අනාවරණය විය. එබැවින් මෙම නල මාර්ගය ප්‍රතිසංස්කරණය හෝ නවීකරණය කිරීම ඉතා හදිසි අවශ්‍යතාවයක් වනුයේ ජාතික අවශ්‍යතාවයකට අදාළ ඛනිජ තෙල් නිෂ්පාදනය විශාල ප්‍රමාණයක් මෙම නල පද්ධතිය හරහා කොළොන්නාව තෙල් ගබඩා පර්යන්තය වෙත ලබා ගන්නා බැවින් මෙම අබලන් නල මාර්ගය හරහා ආනයනික නිෂ්පාදන ඛනිජ තෙල් ප්‍රවාහනය නිසා ඛනිජ තෙල් අර්බුදයක් ඇතිවීම සමස්ථ රටම අකර්මන්‍යවීමේ හැකියාව විගණනයේදී බැහැර කල නොහැක.

(ii) මුතුරාජවෙල පර්යන්තයේ සිට කි.මි. 7.2 ක් හා මුහුදු වෙරළේ සිට කි.මි.6 පමණ දුරින් මුහුද මැද පිහිටුවා ඇති සිංගල් පොයින්ට් බෝයි මූරින් පහසුකම මාර්ගයෙන් මුතුරාජවෙල ස්ථාපිතයට සැපයීම් සිදුකරන අතර මුහුදු රළ තත්වය ඉතා දැඩි වන අවස්ථා වලදී හෝ අදාළ පහසුකම පිළිබඳ නඩත්තු කටයුතු සිදුවන අවස්ථා වලදී වෙනත් විකල්ප සැපයීම් මාර්ගයක් නොවීය. නිෂ්පාදිත අන්තර් පර්යන්ත මාරු කිරීම සඳහා මුතුරාජවෙල පර්යන්තය හා කොළොන්නාව ස්ථාපිතය අතර සම්බන්ධකමක් නොවීම හේතුවෙන් එම පර්යන්ත දෙකෙහිම ප්‍රශස්ථ උපයෝජනයට බාධා මතුව තිබුණි.

(iii) “රට හරහා නල මාර්ග ව්‍යාපෘතිය” ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල වල අනුමැතිය 2012 සැප්තැම්බර් 13 දින ලබා දී තිබුණද, එම ව්‍යාපෘතිය විගණන වාර්ථාවේ දිනය දක්වාද ක්‍රියාත්මක කර නොතිබුණි.

**(ඒ)** සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාවේ අලෙවිකරණ කාර්යය සංග්‍රයට පරිබාහිරව බෙදුම්කාරිත්වයන් පිරිනැමීමේ සිද්ධීන් නිරික්ෂණය විය.

### (ඔ) ත්‍රිකුණාමලයේ තෙල් ගබඩා ටැංකි සංකීර්ණය

ඝණ මීටර 12,500 (මෙට්‍රික් ටොන් 1,000) ධාරිතාවයෙන් යුත් තෙල් ටැංකි 100කින් සහ වෙනත් පහසුකම් ද ඇතුළත්ව 1930 දී මෙය ඉදිකර තිබුණි. වපසරියෙන් හෙක්ටයාර් 358.553ක් වන අතර, තෙල් ටැංකි සංකිර්ණය ශ්‍රී ලංකා රජය විසින් බ්‍රිතාන්‍ය රජයේ නාවික කොමසාරිස්වරුන්ට වසර 99 ක බද්ධකට නිදහසට පෙර ලබා දී තිබුණි. 1961 දි ශ්‍රී ලංකා රජයේ ඉල්ලීම මත ලංකා ඛනිජ තෙල් සංස්ථාව විසින් ස්ටර්ලින් පවුම් 250,000ක් වාරික තුනකින් ගෙවීමෙන් අනතුරුව ඉඩම, ටැංකි සංකිර්ණය, ගොඩනැගිලි සහ අනෙකුත් පහසුකම් පිළිබඳ හිමිකම 1964 අප්‍රේල් 01 දින සිට පවරා ගන්නා ලදී. නමුත් ඉහත ඉඩම සඳහා නීතිමය ලියවිල්ලක් රජයෙන් ලබා ගෙන නොතිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2003 දී ශ්‍රී ලංකා රජය ලංකා ඉංදියන් තෙල් සමාගම සහ සංස්ථාව සමඟ ගිවිසුමකට එළඹ තිබු අතර, ගබඩා පහසුකම් සහ ඉඩම වර්ෂ 35 ක කාල පරිච්ඡේදයකට ලංකා ඉංදියන් තෙල් සමාගමට බදු දීමට සංස්ථාව එකඟ වී තිබුණු අතර, එම ගිවිසුමට එළඹි දින සිට මාස 06 ඇතුළත කල්බදු ගිවිසුම ක්‍රියාත්මක කළ යුතුව තිබුණි. කෙසේ වුවද සංස්ථාව මෙතෙක් කිසිදු ගිවිසුමකට එළඹ නොතිබුණි.

## (ඕ) දඩ ගෙවීම

නැව් තෙල් මෙහෙයුම් කටයුතු උදෙසා මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමේ පදනම යටතේ 2002 වසරේ සිට ගෙවිය යුතු ශේෂයක්ව පැවැති රු.මිලියන 57.7 ක් රේගු දෙපාර්තමේන්තුවට සංස්ථාව විසින් ගෙවා තිබුණි. එහෙත් එම ගෙවීම ප්‍රතිපූර්ණය කර ගැනීමට අවශ්‍ය කටයුතු විගණන වාර්තාවේ දිනය දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි.

## (ක) ඉදිරි සුරැකුම් ගණුදෙනු

ක්‍රියාත්මක කරන ලද විගණන පරීක්ෂාවන්ට අනුව 2007 සිට 2009 දක්වා වු කාල සීමාව තුළ සිදුකරන ලද තෙල් මිළදී ගැනීම් වලට අදාළව සිදුකල ඉදිරි සුරැකුම් ගණුදෙනු හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට රටට දැරීමට සිදුවු පාඩුව රු මිලියන 14,028 කි. තවදුරටත් එ.ජ.ඩො. 8,648,300 ක් අයකරගැනීම වෙනුවෙන් කොමර්ෂල් බැංකුව සංස්ථාවට එරෙහිව නඩු පවරන ලදි.

අත්සන් කලේ
ඩබ් පී සි වික්‍රමරත්න
විගණකාධිපති

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

| දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වූ වසර සඳහා | සටහන | සංස්ථාව 2018 | සංස්ථාව 2017 යළිප්‍රකාශිත | සමූහය 2018 | සමූහය 2017 යළිප්‍රකාශිත |
|---|---|---|---|---|---|
| | | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| ආදායම | 2 | 520,967.224 | 445,950.386 | 522,238.384 | 446,625.013 |
| විකුණුම් පිරිවැය | | (523,982.111) | (418,961.837) | (531,324.830) | (425,879.817) |
| **දළ ලාභය / (අලාභය)** | | **(3,014.887)** | **26,988.549** | **(9,086.446)** | **20,745.196** |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 3 | 812.825 | 670.446 | 1,076.449 | 878.366 |
| විකුණුම් හා බෙදාහැරීම් වියදම් | | (14,911.630) | (15,498.189) | (3,612.614) | (2,479.327) |
| පරිපාලන වියදම් | | (6,021.760) | (4,959.844) | (10,541.905) | (8,977.986) |
| **මෙහෙයුම් ලාභය** | **4** | **(23,135.452)** | **7,200.962** | **(22,164.516)** | **10,166.249** |
| විනිමය අනුපාත විචලනය | | (82,717.291) | (4,922.004) | (82,717.291) | (4,922.003) |
| මූල්‍ය ආදායම් | 5 | 12,889.174 | 11,067.082 | 13,007.051 | 11,256.523 |
| මූල්‍ය වියදම් | 6 | (12,065.056) | (10,530.811) | (12,065.056) | (10,654.884) |
| **බදු පෙර ලාභය / (අලාභය)** | | **(105,028.625)** | **2,815.229** | **(103,939.812)** | **5,845.885** |
| ආදායම් බදු වියදම | 7 | (22.010) | (1,759.595) | (1,346.922) | (2,260.333) |
| **වසර සඳහා ලාභය / (අලාභය)** | | **(105,050.635)** | **1,055.634** | **(105,286.734)** | **3,585.552** |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | | | |
| **ලාභය හෝ අලාභය සඳහා වර්ගීකරණය නොකෙරෙන අයිතම** | | | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම සම්බන්ධ ලාභ/(අලාභ) නැවත ඇගයීම | 18 | 137.696 | (887.512) | 212.776 | (982.459) |
| දේපල, පිරියත සහ උපකරණ සම්බන්ධ නැවත තක්සේරුකරණය | | 159.841 | 10,210.907 | 159.841 | 10,210.907 |
| වෙනත් විස්තීර්ණ ආදායම් මත බදු | | - | - | (18.336) | 12.761 |
| ලාභයට හෝ අලාභයට පසු නැවත වර්ගීකරණය කෙරෙන හෝ නොකෙරෙන අයිතම | | | | | |
| අලවිය සඳහා පවතින මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභය / (අලාභය) | 10.1 | (16.500) | (0.500) | (16.500) | (0.500) |
| **වසර සඳහා වෙනත් විස්තීර්ණ ආදායම් / (වියදම්)** | | **281.037** | **9,322.895** | **337.783** | **9,240.709** |
| **වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම / (වියදම), බදු පසු** | | **(104,769.598)** | **10,378.529** | **(104,948.951)** | **12,826.261** |
| | | | | | |
| **මුළු විස්තීර්ණ ආදායම සම්බන්ධිත :** | | | | | |
| ආයතනයේ හිමිකරුවන් | | (104,769.598) | 10,378.529 | (105,033.639) | 11,920.465 |
| පාලනය කළ නොහැකි අයිතිය | | - | - | 84.688 | 905.796 |
| | | **(104,769.598)** | **10,378.529** | **(104,948.951)** | **12,826.261** |

**මෙහි දක්වා ඇති ඇතැම් සංඛ්‍යා 2017 මූල්‍ය ප්‍රකාශනවලට අනුරූප නොවන අතර සටහන 26 හි විස්තරාත්මකව දක්වා ඇත.**
**116 සිට 147 දක්වා පිටුවල ඇති සටහන් මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වේ.**

# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|---|
| දෙසැම්බර් 31 | | 2018 | 2017 යළිප්‍රකාශිත | 2018 | 2017 යළිප්‍රකාශිත |
| | සටහන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| **වත්කම්** | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 8 | 23,406.070 | 23,608.585 | 39,452.925 | 40,363.333 |
| ආයෝජන වත්කම් | 8.3 | 38.681 | 40.128 | 38.681 | 40.128 |
| අස්පෘශ වත්කම් | 8.4 | - | - | 127.342 | 0.278 |
| පරිපාලිත සමාගමේ ආයෝජනය | 9 | 5,000.000 | 5,000.000 | - | - |
| ජංගම නොවන මූල්‍ය වත්කම් | 10 | 25,419.541 | 29,874.032 | 25,419.541 | 29,874.032 |
| වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු දෑ | 11 | 12,970.642 | 8,963.640 | 14,109.473 | 9,407.897 |
| | | 66,834.934 | 67,486.385 | 79,147.962 | 79,685.668 |
| **ජංගම වත්කම්** | | | | | |
| තොග | 13 | 56,934.359 | 44,152.978 | 57,591.197 | 44,559.109 |
| වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු දෑ | 11 | 94,907.195 | 86,990.589 | 100,401.890 | 90,589.895 |
| කෙටි කාලීන ආයෝජන | 14 | 99,314.811 | 10,685.474 | 99,314.811 | 10,685.474 |
| මුදල් හා මුදල් සමාන දෑ | 15 | 11,279.951 | 9,385.759 | 14,428.596 | 10,859.879 |
| | | 262,436.316 | 151,214.800 | 271,736.494 | 156,694.357 |
| **මුළු වත්කම්** | | **329,271.250** | **218,701.185** | **350,884.456** | **236,380,025** |
| **ස්කන්ධය හා වගකීම්** | | | | | |
| **ප්‍රාග්ධන හා සංචිත** | | | | | |
| දායකත්ව ප්‍රාග්ධනය | 16 | 28,487.125 | 28,487.125 | 28,487.125 | 28,487.125 |
| ප්‍රාග්ධන සංචිතය | 17.1 | 4,992.686 | 4,992.686 | 4,992.686 | 4,992.686 |
| මූල්‍ය වත්කම් මත සංචිතය | 10.1 | (38.000) | (21.500) | (38.000) | (21.500) |
| නැවත තක්සේරුකරණ සංචිතය | 17.2 | 10,370.748 | 10,210.907 | 10,370.748 | 10,210.907 |
| රඳවාගත් ඉපැයුම් | | (325,574.048) | (220,661.110) | (314,063.990) | (208,887.009) |
| පාලන කළ නොහැකි අයිතිය | | - | - | 8,255.421 | 8,387.732 |
| **මුළු ස්කන්ධය** | | (281,761.489) | (176,991.892) | (261,996.010) | (156,830.059) |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම | 18 | 1,680.958 | 1,708.014 | 3,132.929 | 3,182.005 |
| විලම්බිත බදු | 23 | - | - | 1,997.626 | 1,017.152 |
| ණය හා ණය ලබාගැනීම් | 19 | 1,539.455 | 189.898 | 1,539.455 | 189.898 |
| | | 3,220.413 | 1,897.912 | 6,670.010 | 4,389.055 |
| **ජංගම වගකීම්** | | | | | |
| වෙළෙඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | 20 | 313,111.745 | 214,077.733 | 311,509.875 | 209,103.597 |
| ණය හා ණය ලබාගැනීම්වල ජංගම කොටස | 19.1 | 37.980 | 75.959 | 37.980 | 75.959 |
| කෙටි කාලීන ණය ලබාගැනීම් | 21 | 294,662.601 | 179,641.473 | 294,662.601 | 179,641.473 |
| | | 607,812.326 | 393,795.165 | 606,210.456 | 388,821.029 |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | | **329,271.250** | **218,701.185** | **350,884.456** | **236,380.025** |

මෙහි දක්වා ඇති ඇතැම් සංඛ්‍යා 2017 මූල්‍ය ප්‍රකාශනවලට අනුරූප නොවන අතර සටහන 26 හි විස්තරාත්මකව දක්වා ඇත.
116 සිට 147 දක්වා පිටුවල ඇති සටහන් මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වේ.
මෙම මූල්‍ය ප්‍රකාශන මගින් 2018 දෙසැම්බර් 31 දින වන විට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ එහි සමූහයේ මූල්‍ය තත්වය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දෙන අතර එම අවසන් වූ වර්ෂය සඳහා එහි අලාභයද මෙයින් පෙන්වයි.

V N වීරසූරිය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය)

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය. මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් කරන ලද්දේ,

G S විතානගේ
සභාපති

N R R ජයසේකර
කළමනාකාර අධ්‍යක්ෂක

K A විමලේන්තිරරාජා
අධ්‍යක්ෂක

08 ජූනි 2019, කොළඹ

# ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය

සංස්ථාව

| දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වූ වසර සඳහා | දායක ප්‍රාග්ධනය | නැවත තක්සේරුකරන ලද සංචිත | ප්‍රාග්ධන සංචිත | මූල්‍ය වත්කම් මත සංචිත | රඳවාගත් ඉපැයුම් | මුළු ස්කන්ධය |
|---|---|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 2016 ජනවාරි 1 වැනිදා වන විට ශේෂය | 28,487.125 | - | 4,992.686 | (21.000) | (219,305.658) | (185,846.847) |
| වසර සඳහා ලාභය | - | - | - | - | (1,523.574) | (1,523.574) |
| 2017 ජනවාරි 1 වන විට සංශෝධිත ශේෂය | 28,487.125 | - | 4,992.686 | (21.000) | (220,829.232) | (187,370,421) |
| වසර සඳහා ලාභය | - | - | - | | 1,055.634 | 1,055.634 |
| වෙනත් විස්තීර්ණ ආදායම | | | | (0.500) | (887.512) | (888.012) |
| නැවත ඇගයීමේ අතිරික්තය | | 10,210.907 | | | | 10,210.907 |
| 2017 දෙසැ 31 වන විට | 28,487.125 | 10,210.907 | 4,992.686 | (21.500) | (220,661.110) | (176,991.892) |
| | | | | | | |
| වසර සඳහා වන ලාභය, පාඩුව | | | | | (105,050.635) | (105,050.635) |
| වෙනත් විස්තීර්ණ ආදායම | | | | (16.500) | 137.696 | 121.196 |
| නැවත ඇගයීමේ අතිරික්තය | | 159.841 | | | | 159.841 |
| **2018 දෙසැ 31 වන විට** | **28,487.125** | **10,370.748** | **4,992.686** | **(38,000)** | **(325,574.048)** | **(281,761.489)** |

| සමූහය | දායක කළ ප්‍රාග්ධනය | නැවත තක්සේරු කිරීමේ සංචිත | ප්‍රාග්ධන සංචිත | මූල්‍ය උපකරණ සාධාරණ වටිනාකම | රඳවාගත් ඉපැයුම් | කොටස් හිමියන්ගේ අරමුදල | පාලනය කලනොහැකි අයිතිය | මුළු ස්කන්ධය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| **2017 ජනවාරි 1 වන විට** | **28,487.125** | **-** | **4,992.686** | **(21.000)** | **(209,073.494)** | **(175,614.683)** | **7,616.937** | **(167,997.746)** |
| පූර්ව කාල ගැලපුම | | | | | (1,523.574) | (1,523.574) | | (1,523.574) |
| **2017 ජනවාරි 1 වන විට නැවත ප්‍රකාශ කළ ශේෂය** | **28,487.125** | **-** | **4,992.686** | **(21.000)** | **(210,597.068)** | **(177,138.257)** | **7,616.937** | **(169,521.320)** |
| වසර සඳහා වන ලාභය, පාඩුව | | | | | 2,652.361 | 2,652.361 | 933.191 | 3,585.552 |
| වෙනත් විස්කීර්ණ ආදායම | | | | (0.500) | (942.302) | (942.802) | (27.395) | (970.198) |
| නැවත ඇගයීමේ අතිරික්තය | | 10,210.907 | | | | 10,210.907 | | 10,210.907 |
| ගෙවා ඇති ලාභාංශ | | | | | | | (135.000) | (135.000) |
| **2017 දෙසැ 31 වන විට** | **28,487.125** | **10,210.907** | **4,992.686** | **(21.500)** | **(208,887.009)** | **(165,217790)** | **8,387.732** | **(156,830.059)** |
| | | | | | | | | |
| වසර සඳහා වන ලාභය, පාඩුව | | | | | (105,352.507) | (105,352.507) | 65.773 | (105,286.734) |
| වෙනත් විස්කීර්ණ ආදායම | | | | (16.500) | 175.526 | 159.026 | 18.915 | 177.941 |
| නැවත ඇගයීමේ අතිරික්තය | | 159.841 | | | | 159.841 | | 159.841 |
| ගෙවා ඇති ලාභාංශ | | | | - | | - | (217.000) | (217.000) |
| **2018 දෙසැ 31 වන විට** | **28,487.125** | **10,370.748** | **4,992.686** | **(38.000)** | **(314,063.990)** | **(270,251.431)** | **8,255.421** | **(261,996.010)** |

**මෙහි දක්වා ඇති ඇතැම් සංඛ්‍යා 2017 මූල්‍ය ප්‍රකාශනවලට අනුරූප නොවන අතර සටහන 26 හි විස්තරාත්මකව දක්වා ඇත.**
**116 සිට 147 දක්වා පිටුවල ඇති සටහන් මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය සමූහයක් වේ.**

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|---|
| **දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වූ වසර සඳහා** | සටහන | 2018 | 2017 යළි ප්‍රකාශිත | 2018 | 2017 යළි ප්‍රකාශිත |
| | | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබෙන මුදල් ප්‍රවාහ** | **24** | **(18,548.432)** | **(7,320.527)** | **(15,255.275)** | **(5,420.040)** |
| ගෙවන ලද පොලිය | 6 | (11,214.798) | (10,087.044) | (11,214.798) | (10,211.117) |
| ගෙවන ලද විශ්‍රාම පාරිතෝෂිකය | 18 | (152.227) | (127.985) | (325.892) | (225.201) |
| ගෙවන ලද බදු / රැඳවුම් බදු | | (6,613.479) | (3,157.005) | (7,220.087) | (3,289.121) |
| **මෙහයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය කරන ලද (භාවිතා කළ) ශුද්ධ මුදල්** | | **(36,528.937)** | **(20,692.561)** | **(34,016.053)** | **(19,145.480)** |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ලද මුදල් ප්‍රවාහ** | | | | | |
| දේපල, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද මුදල් | | 0.046 | 11.791 | 26.640 | 15.427 |
| දේපල, පිරියත සහ උපකරණ අත්පත් කරගැනීම | 8 | (594.680) | (818.529) | (969.910) | (1,651.819) |
| ලාභාංශ ආදායම | | 390.663 | 243.105 | 0.063 | 0.105 |
| ලැබූ පොලිය | 5 | 6,805.872 | 6,656.295 | 6,923.750 | 6,845.736 |
| භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජන | | 5,663.025 | 1,115.053 | 5,663.025 | 1,115.053 |
| ස්ථාවර තැන්පතුවල ආයෝජන | | (89,854.370) | 21,981.159 | (89,854.370) | 21,981.159 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා භාවිතා කල ශුද්ධ මුදල්** | | **(77,589.443)** | **29,188.874** | **(78,210.802)** | **28,305.661** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ** | | | | | |
| ගෙවන ලද ලාභාංශය | | - | - | (217.000) | (135.000) |
| ලබාගත් අලුත් ණය | | 419,535.325 | 318,165.820 | 419,535.325 | 318,165.820 |
| ණය ආපසු ගෙවීම | | (303,202.620) | (332,245.960) | (303,202.620) | (333,644.811) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වෙතින් ලද/ (භාවිතා කල) ශුද්ධ මුදල්** | | **116,332.705** | **(14,080.140)** | **116,115.705** | **(15,613.991)** |
| **මුදල් හා මුදල් සමාන දෑ ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | | 2,214.325 | (5,583.827) | 3,888.851 | (6,453.810) |
| වසර ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ | | 6,438.298 | 12,022.125 | 7,912.418 | 14,366.228 |
| **වසර අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ** | **15** | **8,652.623** | **6,438.298** | **11,801.268** | **7,912.418** |

මෙහි දක්වා ඇති ඇතැම් සංඛ්‍යා 2017 මූල්‍ය ප්‍රකාශනවලට අනුරූප නොවන අතර සටහන 26 හි විස්තරාත්මකව දක්වා ඇත.
116 සිට 147 දක්වා පිටුවල ඇති සටහන් මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වේ.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 1.1 ආයතනික තොරතුරු

### පොදු

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (සංස්ථාව) යනු 1961 වර්ෂයේ අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත අනුව සංස්ථාපිත කර, ශ්‍රී ලංකාවේ දේශීය වශයෙන් පවත්වාගෙන යනු ලබන රාජ්‍ය සංස්ථාවකි. සංස්ථාවේ ලියාපදිංචි කාර්යාලය අංක 609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09 යන ලිපිනයෙහි පිහිටා ඇත.

### ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

| ආයතනය | ප්‍රධාන ක්‍රියාකාරකම |
|---|---|
| ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය, පිරිපහදුව සහ අලෙවිය |
| අනුබද්ධ ආයතනය ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම | ඛනිජ තෙල් නිෂ්පාදන ගබඩා කිරීම සහ බෙදාහැරීම |

### මූලික  සමාගම සහ අවසන් බලාධිකාරය

සංස්ථාව, ඛනිජ තෙල් සංවර්ධන අමාත්‍යංශය යටතට අයත් වේ. අධ්‍යක්ෂක මණ්ඩලයේ මතයට අනුව සංස්ථාවේ අවසන් වගකීම දැරීම සහ පාලන පාර්ශ්වය ශ්‍රී ලංකා රජය වේ.

### නිකුත් කිරීම සඳහා බලය පවරන දිනය

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ එහි සමූහයේ මූල්‍ය ප්‍රකාශන 2019 ජුනි මස 08 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මතය මගින් ප්‍රකාශයට පත් කිරීමට අවසර දී ඇත.

### අනුකූලතා ප්‍රකාශය

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස්වීම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් ('මූල්‍ය ප්‍රකාශන') ඇතුළත් වන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ එහි සමූහයේ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRSs / LKASs) සහ 1971 අංක 38 මුදල් පනතේ විධිවිධාන හා ඊට පසුව සිදුකරන ලද සංශෝධන වලට අනුකූලව සකස් කර ඇත.

## 1.2 සකස් කිරීමේ පදනම

ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිති අන්තර්ගත  SLFRS සහ LKAS (මෙතැන් පටන් SLFRS යනුවෙන් හඳුන්වනු ලැබේ.) වලට අනුකූලව සංස්ථාවේ  මූල්‍ය ප්‍රකාශන සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

ආයෝජන දේපළ සහ ඇතැම් කාර්යාල දේපළ හැර(දේපළ, පිරියත සහ උපකරණ ලෙස වර්ගීකරණය කර ඇති) මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇත්තේ උපචිත පදනම සහ ඓතිහාසික පදනමටයි. මූල්‍ය වත්කම් අගය කර තිබෙන්නේ සාධාරණ වටිනාකම් සහ හඳුනාගත් වර්තමාන ප්‍රතිලාභ වගකීම්  වටිනාකම අනුව වේ.

### ගිණුම් ඉදිරිපත් කරන ව්‍යවහාර මුදල් වර්ගය

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකාවේ රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර එය ලංකාව තුළ භාවිත වන ව්‍යවහාර මුදල් වේ. වෙනත් ආකාරයකින් දක්වා ඇති අවස්ථාවන් හැර සෙසු සියලු අගයන් ආසන්නතම මිලියනය දක්වා වටයා ඇත.

### ප්‍රමානාත්මක සහ සමූහනය

මූල්‍ය ප්‍රකාශන තුළ සමාන අයිතම වල සෑම ද්‍රව්‍ය පන්තියක්ම වෙන වෙනම ඉදිරිපත් කර ඇත. අසාමාන්‍ය ස්වභාවයක් හෝ ක්‍රියාකාරිත්වයක් ඇති අයිතම ඒවා වැදගත් නම් වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ.

### ඒකාබද්ධ කිරීමේ පදනම

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, සංස්ථාව සහ එහි අනුබද්ධිත සමාගම් වලින් සමන්විත වේ (සමූහය ලෙස හැඳින්වේ).

අනුබද්ධ ආයතන යනු සමූහය විසින් පාලනය කරනු ලබන ආයතන වේ. සමූහය නිරාවරණය වූ විට හෝ අයිතිවාසිකම් ඇති විට, ආයෝජකයා සමඟ ඇති සම්බන්ධතාවයෙන් විචල්‍ය ප්‍රතිලාභ ලබා ගැනීම සහ ආයෝජකයා කෙරෙහි ඇති බලය තුළින් එම ප්‍රතිලාභ කෙරෙහි බලපෑම් කිරීමේ හැකියාව ඇති විට පාලනය ලබා ගත හැකිය.

නිශ්චිතවම, සමූහය ආයෝජකයෙකු විසින් පාලනය කරන්නේ පමණක්ම වේ නම්, කණ්ඩායමට:

- ආයෝජකයා කෙරෙහි බලය (එනම්, ආයෝජකයාගේ අදාළ ක්‍රියාකාරකම් මෙහෙයවීමට වර්තමාන හැකියාව ලබා දෙන පවත්නා අයිතිවාසිකම්)
- ආයෝජකයා සමඟ සම්බන්ධ වීමෙන් ලැබෙන විචල්‍ය ප්‍රතිලාභ සඳහා නිරාවරණය හෝ අයිතිවාසිකම්
- එහි ප්‍රතිලාභ කෙරෙහි බලපෑම් කිරීමට ආයෝජකයාට වඩා එහි බලය භාවිතා කිරීමේ හැකියාව ලැබෙනු ඇත.

පොදුවේ ගත් කල, ඡන්ද අයිතියෙන් බහුතරයක් පාලනය කිරීමට හේතු වේ යැයි උපකල්පනයක් ඇත. ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම (CPSTL) හි කොටස් වලින් 2/3 ක් CPC සතුව ඇති අතර, CPSTL එහි අනුබද්ධිත ආයතනය ලෙස සලකයි.

ඉහත පාලන අංග තුනෙන් එකක් හෝ වැඩි ගණනක වෙනස්කම් ඇති බව කරුණු සහ තත්වයන් පෙන්නුම් කරන්නේ නම් සමූහය එය ආයෝජකයෙකු පාලනය කරන්නේද නැද්ද යන්න නැවත තක්සේරු කරයි. අනුබද්ධිත ආයතනයක් ඒකාබද්ධ කිරීම ආරම්භ වන්නේ සමූහය අනුබද්ධිතයා මත පාලනය ලබා ගත් විට සහ සමූහයට අනුබද්ධිත පාලනය අහිමි වූ විට නතර වීමෙනි. වර්ෂය තුළ අත්පත් කර ගත් හෝ බැහැර කරන ලද අනුබද්ධිත ආයතනයක වත්කම්, වගකීම්, ආදායම සහ වියදම් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වේ.

වෙනත් ආකාරයකින් ප්‍රකාශ නොකරන්නේ නම් සහ අනුබද්ධිතයාගේ මූල්‍ය ප්‍රකාශන සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව සකස් කර ඇති අතර ඒවා දෙසැම්බර් 31වනදායින් අවසන් වන පොදු මූල්‍ය වර්ෂයක් ඇත.

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සියලුම අන්තර් කණ්ඩායම් ශේෂයන් සහ ගනුදෙනු, ආදායම සහ වියදම් ඉවත් කරනු ලැබේ.

### පාලනය නොකරන අවශ්‍යතා

ලාභය හෝ අලාභය සහ අනුබද්ධිත අනෙකුත් විස්තීර්ණ ආදායම්වල (OCI) එක් එක් අංගයන් සමූහයේ මූලික කොටස් හිමියන්ට සහ පාලනය නොකිරීමේ අවශ්‍යතාවන්ට ආරෝපණය කර ඇත.

## 1.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

### ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම්

සම්මත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනත් ආකාරයකින් ප්‍රකාශ නොකළහොත් පෙර වර්ෂවල භාවිත කළ ප්‍රතිපත්තිවලට අනුකූල වේ.

### සංසන්දනාත්මක තොරතුරු

පෙර වර්ෂවල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණය සංශෝධනය කර ඇති අතර, වඩා හොඳ ඉදිරිපත් කිරීමකට අදාළ වන අතර වත්මන් වර්ෂයේ ප්‍රකාශ සමඟ සැසඳිය හැකිය.

### අඛණ්ඩ පැවැත්ම

මෙම මූල්‍ය ප්‍රකාශන සකසා ඇත්තේ ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා සමූහය අඛණ්ඩ පැවැත්මෙන් ව්‍යාපාර කටයුතු සිදු කරන්නේය, එනම් පුරෝකථනය කළ හැකි අනාගතයක් උදෙසා මෙහෙයුම් කටයුතු සිදු කරන්නේය යන උපකල්පනය මත පදනම්වය. එබැවින්, 2018 දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වූ වසර සඳහා සකසන ලද මූල්‍ය වාර්තාවන්ට අනුව සංස්ථාවට හා සමූහයට පිළිවෙළින් රු. මිලියන 281,761 ක සහ රු. මිලියන 261,996 ක ඍණාත්මක ස්කන්ධ තත්වයක් ඇති විට වුවද, සිය මෙහෙයුම්වල ප්‍රමාණාත්මක අඩු කිරීමේ හෝ භෞතික වශයෙන් සීමාකිරීමේ අදහස හෝ අවශ්‍යතාව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට නැතැයි උපකල්පනය කෙරෙයි.

### තීරනාත්මක ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සැකසීම සඳහා ඇතැම් තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු සහ උපකල්පන භාවිත කිරීම අවශ්‍ය වේ. සංස්ථාවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේ ක්‍රියාවලියේදී එහි විනිශ්චය ක්‍රියාත්මක කිරීම කළමනාකරණයට අවශ්‍ය වේ. විනිශ්චයන් සහ ඇස්තමේන්තු පදනම් වී ඇත්තේ ඓතිහාසික අත්දැකීම් සහ තත්වයන් යටතේ සාධාරණ යැයි විශ්වාස කෙරෙන අපේක්ෂාවන් ඇතුළු වෙනත් සාධක මත ය. එබැවින් සත්‍ය අත්දැකීම් සහ ප්‍රතිඵල මෙම විනිශ්චයන් හා ඇස්තමේන්තු වලට වඩා වෙනස් විය හැකිය. ඇස්තමේන්තු සහ යටින් පවතින උපකල්පන අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කෙරෙන අතර ගිණුම්කරණ ඇස්තමේන්තු සංශෝධනයන් අනාගතයේදී හඳුනා ගැනේ. ඉහළ මට්ටමේ විනිශ්චයක් හෝ සංකීර්ණත්වයක් ඇති ක්ෂේත්‍ර හෝ මූල්‍ය ප්‍රකාශන සඳහා උපකල්පන සහ ඇස්තමේන්තු වැදගත් වන ක්ෂේත්‍ර අදාළ සටහන් වල පහත පරිදි විස්තර කෙරේ:

- නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් - පාර්තෝෂිකය: සටහන අංක 1.4.12
- මූල්‍ය වත්කම් හානි කිරීම: සටහන අංක 1.4.14
- දේපල, පිරියත සහ උපකරණවල ඵලදායී ආයුකාලය: සටහන අංක 1.4.6
- විලම්භිත බදුකරණය: සටහන 1.4.2

## 1.4 ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශය

### 1.4.1 ආදායම් හඳුනා ගැනීම

